## 2018/10/09 දින පැවති මහාසභා රැස්වීම් වාතර්ාව

2018/10/09 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | එච්.ජී. තරංග සුදශර්න මහතා | ගරු මන්ත්‍රී |
| 7. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එන්.ජී. ගයාන් මධුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ධමර්සිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | වී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2018.10.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩි 02 ක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට පහුගිය දිනවල පැවති අයහපත් කාලගුණික තත්වය හා අද දින පවතින අයහපත් කාලගුණ තත්වය හේතුකොටගෙන ඇතැම් මන්ත්‍රීවරුන්ට අද දින සභාවාරයට පැමිණීමට නොහැකියාවක් තිබෙනවා.නමුත් සැසි වාරය ආරම්භ කිරීමට අවශ්‍ය ගණ පූර්ණය තිබෙන බැවින්,උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගන්නා අතර අයහපත් කාලගුණ තත්වය නිසා අවශ්‍යම කරුණු පමණක් සාකච්ඡා කොට ඉක්මනින් සැසි වාරය අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

**03. පසුගිය වාතර්ාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

**04. 2018.08.17 දින පැවති මහ සභා වාතර්ාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාතර්ාව ස්ථිර කිරීම.**

මේ අවස්ථාවේ ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය නැගීසිටිමින් ගරු සභාපතිතුමාගෙන්ද ලේකම් තුමිය ඇතුලු දෙනාගෙන් අවසරයි.මට පොඩි ගැටලුවක් තියෙනවා.වාතර්ාවෙ පස්වැනි පිටුවෙ උඩම ඡේදෙ ක්‍රීඩා උත්සවය සඳහා 245000.00 ක මුදලක් අජිත් එඩේර ආරච්චි මහතා යෝජනා කරන ලදුව කියල තියෙනවා ඒ සම්බන්දව පැහැදිලි කරන ලෙස ඉල්ලීය.

සහකාර කොමසාරිස් කායර්ාලයට යැවිය යුතු රු. 60000.00, ගමන් වියදම්, කෑම බීම හා ටී ෂටර් වියදම්වල එකතුව රු. 245,000.00 යි වියදම ඊට වඩා අඩු විය හැකියි. නමුත් ඇස්තමේන්තුගත මුදල ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යැවිය යුතුයි.

ඒ අනුව සභා වාතර්ාව සභාව පිළිගතයුතු සත්‍ය වාතර්ාවක් ලෙස **ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**05. විශේෂ නිවේදන**

01. ටී. සෙව්වන්දි මනම්පේරි මෙය, පුස්තකාලයාධිපති, මාපලගම මහජන පුස්තකාලය විසින් යොමු කරන ලද 2018.10.02 දිනැති ස්තූතිය පළ කර එවන ලද ලිපිය සභාගත කරන ලදී.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාතර්මේන්තුව, ගාල්ල විසින් යොමු කරන ලද පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදා ගෙන සිදු කරනු ලබන සංවධර්න කටයුතු සම්බන්ධ 2018.10.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාතර්මේන්තුව, ගාල්ල විසින් යොමු කරන ලද නාගොඩ වළකුඹුර පොදු නාන ළිඳ සම්බන්ධ 2018.10.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- මේ සම්බන්දව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය,ගරු සභාපතිතුමනි ඔය කියන ළිඳ ශුද්ධ කරල වතුර ඉවත් කර පිරිසුදු කරල සකස් කරල තියෙන්නෙ.දැන් ඒ ළිදේ ලැටලුවක් නැහැ.යනුවෙන් ප්‍රකාශ කළේය.
- මේ සම්බන්දව ගරු සභාපතිතුමා කියා සිටියේ මේ ළිඳ සම්බන්දව පළාත් පාලන කොමසාරිස් තුමාට ලිපියක් යවල තියනව.කොමසාරිස් තුමා ඒ පිළිබඳව සති දෙකක් ඇතුලත තොරතුරු ඉල්ලල තියෙනවා.පහුගිය දවස්වල ළිඳ ශුද්ධ කරල වතුර ඉහල හැදුව.ඒකෙ තව තියෙනව වැඩකටයුතු කරන්න.ඉදිරියෙදි ඒ ටිකත් කරනවා යනුවෙනි.

03. ප්‍රධාන ලේකම්, දකුණු පලාත විසින් යොමු කරන ලද රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සම්බන්ධ 2018.10.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. වෛද්‍ය අධිකාරී, මූලික රෝහල, උඩුගම විසින් යොමු කරන ලද ස්තූතිය පළ කර එවන ලද 2018.10.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. විගණකාධිපති, විගණකාධිපති දෙපාතර්මේන්තුව, විසින් යොමු කරන ලද නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2017.12.31 දිනෙන් අවසන් වෂර්ය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාතර්ාව 2018.09.29 දිනැති ලිපිය සභාගත කරන ලදී

තත්ත්වාගණනය කළ මතය

මෙම වාතර්ාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වයර් සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයට පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධමර්වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

06. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශිය ලේකම් කායර්ාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2018 වෂර්යේ සංවධර්න වැඩපිළිවෙල යටතේ කොට්ඨාසයේ ක්‍රියාත්මක කිරීමට අනුමත මාගර් සංවධර්න ව්‍යාපෘති සම්බන්ධ 2018.10.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- මෙම සංවධර්න ව්‍යාපෘති සඳහා එකඟතාවය ලබා දීමට එම ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රතිපාදන ප්‍රභවය පළාත් සභාද, මධ්‍යම රජයද, ගම්පෙරලියද, වෙනත්ද යන්න පැහැදිළිව දැන ගත යුතු බවත්, ගමේ ජනතාව විමසන විට ඒ පිළිබඳව දැනුවත් වී තිබිය යුතු බවත්, එම තොරතුරු විමසා යවන ලෙස ගරු උප සබාපතිතුමා ඉල්ලීමක් කළේය. සංවධර්නය කරන දුර ප්‍රමාණයත්, දැනගත යුතු අතර තොරතුරු ඉල්ලූ විට ලබා දිය හැකි පරිදි මේ සඳහා ලේඛන නඩත්තු කල යුතු බවත්, වැඩිදුරටත් උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කළේය.

07. පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කායර්ාලය, ගාල්ල විසින් යොමු කරන ලද අත්හැර දමන ලද ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ලබා ගැනීම සම්බන්ධ 2018.06.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

08. පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කායර්ාලය, ගාල්ල විසින් යොමු කරන ලද කායර්ාල පරීක්ෂණය සහා රැස්වීම් වාතර්ා පරික්ෂාව, නාගොඩ ප්‍රාදේශීය සභාව සම්බන්ධ 2018.09.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙහි සඳහන් අනවශ්‍ය දේ ඉදිරිපත් කර නැතවි බවත්, උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදුව මේ සම්බන්ධයෙන් වෙනමම සාකච්ඡා කර දැනුවත් වෙමු යන්න සභාපතිතුමාගේ තීරණය විය.

09. නියෝජ්‍ය විදුහල්පති, , පළමු ගාලු මහින්ද බාලදක්ෂ සමූහය, මහින්ද විද්‍යාලය, ගාල්ල විසින් යොමු කරන ලද 6 වන මිහිඳු අභියෝගතා ගවේෂන තරඟාවලිය සම්බන්ධ 2018.10.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

10. එච්. ඩබ්. පී අමරනාත් මයා, ම.සෞ.ප. විසින් යොමු කරන ලද ආහාර සාම්පල් කටයුතු සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම සම්බන්ධ 2018.09.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

11. සී/ර ගොණදෙනිය සණස සමිතිය විසින යොමු කරන ලද අක්කර 72 පාර දෙපස පිරිසිදු කර ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

12. ගරු ලේකම්, සත්සිත් භික්ෂු එකමුතුව විසින යොමු කරන ලද උත්තම පූජා මව්පිය හරසර සම්බන්ධ 2018.10.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් මේ සඳහා අපෙන් උපකාරයක් ඉල්ලල තියෙනව.ඉතිං මන්ත්‍රීතුමාල මේකට දායක වෙන්න.අපි පුලුවන් විදිහට උදව්වක් කරමු යනුවෙන් ප්‍රකාශ කළේය.

13. දෙමව්පිය සංගමය, ප්‍රාදේශීය සභා පෙර පාසල, තල්ගස්වල විසින් යොමු කරන ලද පෙරපාසලෙහි පවතින අඩුපාඩු සම්බන්ධව 2018.09.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

14. බී. ජී. තිලකරත්න මයා, තල්ගස්වල විසින් යොම  යොමු කරන ලද නවනගරයේ අවිධිමත් ලෙස මාගර්ය අවහිර කිරීම සම්බන්ධව 2018.10.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

15. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කායර්ාලය, නාගොඩ විසින් යොමු කරන ලද මාගර්යේ කාණු පද්ධතිය අවහිර කිරීම සම්බන්ධව 2018.10.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- මේ සම්බන්දව අදහස් දැක්වූ ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා මේ ගැටලුව පිළිබඳව පැහැදිලි කිරීමක් කළ අතර ගරු සභාපතිතුමා කියා සිටියේ මේ සම්බන්ඳව පරීක්‍ෂා කිරීම සඳහා තාක්‍ෂණ නිලධාරී යොමු කරන බවයි. මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා නැවත ඉල්ලා සිටියේ ගරු සභාපතිතුමනි ඔය කියන වරකපැල හේන විතරක් නෙවෙයි කොහේ තිබුනත් ඒ අවහිර කරන ලද ස්ථාන සියල්ල ඉවත් කිරීමට කටයුතු කරන ලෙසයි.

16. විදුහල්පති, නාගොඩ රාජකීය ජාතික පාසල විසින් යොමු කරන ලද කුමුදු විලට සඳ රැස් කළා දින සැමරුම සඳහා අනුග්‍රාහකත්වය ලබා ගැනීම සම්බන්ධව 2018.10.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- මෙහිදී ගරු සභාපතිතුමා කියා සිටියේ පාසල් දරුවන් වෙනුවෙන් අපට කරන්න පුලුවන් යම් උපකාරයක් කරමු. ගරු උප සභාපතිතුමා කියා සිටියේ පාසලෙන් අපට යම් යම් කටයුතු සඳහා උදවු උපකාර තිබෙන බැවින් මේ සඳහා සභාවේ පොදු අරමුදලින් හෝ පාසල් දරුවන් වෙනුවෙන් උපකාර කිරීම සුදුසු බවයි.

17. විදුහල්පති, නාගොඩ රාජකීය ජාතික පාසල විසින් යොමු කරන ලද මුදල්/භාණ්ඩ/උපකරණ ලබා ගැනීම සම්බන්ධව 2018.09.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

18. සහන ගොවි සංවිධානය, පරණතානායම්ගොඩ විසින් යොමු කරන ලද තල්ගස්වල සති පොළ සංවධර්නය කිරීමේ කමර්ාන්තය සමිතිය වෙත ලබා ගැනීම සම්බන්ධව 2018.09.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

19. අයි.එල්.ටී.පී. දිසානායක මහතා, උඩවැලිවිටිතලාව විසින් යොමු කරන ලද උඩවැලිවිටි තලාව මිල්ලගහ උඩුමුල්ල මාගර්ය සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

**07. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**08. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

01. 2018 අයවැය ලේඛනයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමානවත් නොවන බැවින් , නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මාපලගම මංසන්ධියේ පිහිටි පරණ කඩ කාමර අංක 01 කුලියට දීම මගින් එක්වන් මුදල් ලෙස රු. 1,016,406.25 ක් ලද අතර රු. 1,049,218.75 ක් ලැබිය යුතු වේ එම රු. 2,065,625.00 ක් වූ ආදායම 2018 අයවැය ලේඛනයේ කුලී ආදායම යටතේ ඇතුලත් නොවන බැවින් 2018 වෂර්ය සඳහා පරිපූරකයක් ලෙස යොදා ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපතිතුමා විසින් උක්ත යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

02.නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඉදිරි ගෙවීම් වාතර්ාව ඉදිරිපත් කිරීම

**2018.10.09 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාතර්ාව.**

01. **2018 ජුනි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| **I.** | 4501090200 | - මාපලගම වෙළද සංකීණර් කොරිඩෝව | - රු. 1868.70 |
| **II.** | 4593739918 | -මාපලගම උප කායර්ාලය | - රු. 569.40 |
| III. | 4592323912 | - යමුනා ස්ටෝසර් | - රු. 240.00 |

**2018 අගෝස්තු මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4509082908 | - උක්ඹිවිට පෙර පාසල | - රු. 258.30 |

**2018 සැප්තැම්බර් මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| **I.** | 4509082800 | - උදාර පෙර පාසල | - රු. 276.60 |
| **II.** | 4591713210 | - ප්‍රධාන කායර්ාලය | - රු. 4540.50 |
| **III.** | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 294.90 |
| **IV.** | 8617046104 | - උඩුගම බහු කායර් මධ්‍යස්ථානය | - රු. 1209.90 |
| **V.** | 4594192319 | - උඩුගම ප්‍රධාන කායර්ාලය | - රු. 1447.80 |
| VI. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 294.90 |
| VII. | 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| **VIII.** | 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 240.00 |
| IX. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| **X.** | 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| **XI.** | 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1758.90 |

| | | | |
|---|---|---|---|
| **XII.** | 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 258.30 |
| **XIII.** | 4501090200 | - මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 807.30 |
| **XIV.** | 4593739918 | -මාපලගම උප කාර්යාලය | - රු. 679.20 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී,**

**<u>2018 අගෝස්තු මස දුරකථන බිල්පත්</u>**

091-2296577 - මාපලගම උප කාර්යාලය -රු. 532.22

**03.ශ්‍රී ලංකා මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත - රු. 74.84

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2018.08.17 – 2018.09.17) -රු. 2700.20

**05.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. යටලමත්ත මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ ආහාර සාම්පල් කටයුතු සඳහා ලබ ගත් අත්තිකාරම් මුදල් පියවීම

එච්.ඩබ්.පී. අමරනාත් මයා, ම.සෞ.ප. - රු. 1000.00

II. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 සැප්තැම්බර් මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

**06.ගමන් වියදම් ගෙවීම**

**2018 අගෝස්තු මස ගමන් වියදම්**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>**

| | | |
|---|---|---|
| එම්.එච්.ෆසරීයා ෆවරීන් මිය | - ලේකම් | -රු. 580.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | -රු. 476.00 |

**2018 සැප්තැම්බර් මස ගමන් වියදම්**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>**

| | | |
|---|---|---|
| එම්.එච්.ෆසරීයා ෆවරීන් මිය | - ලේකම් | -රු.1080.00 |
| ආර්.ඒ.ඒ.එල්.රත්නායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 826.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 780.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | -රු. 926.00 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු.1400.00 |
| **<u>පුහුණු වැඩසටහන් සඳහා</u>** | | |
| කුසල් අසංක එදිරිසිංහ | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4330.00 |

**2018 ඔක්තෝම්බර් මස ගමන් වියදම්**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>**

එම්.එච්.ෆසරීයා ෆවරීන් මිය - ලේකම් -රු.1070.00
එස්.කේ.මල්ලවආරච්චි මයා - කළමනාකරණ සහකාර -රු. 900.00

**07.අතිකාල දීමනා ගෙවීම්**

**2018 ජුනි මස**

ඩබ්.කේ. සම්පත් සංජීව මයා (මුර සේවය වෙනුවෙන්) - ආදේශක රියදුරු - රු. 4500.00

**2018 අගෝස්තු මස**

යසරත්න විජේසේකර මයා - මුරකරු -රු. 5136.00
ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා - මුරකරු - රු. 5950.80
ඩබ්.කේ. සම්පත් සංජීව මයා (මුර සේවය වෙනුවෙන්) - ආදේශක රියදුරු - රු. 3000.00
එන්.එම්.රජිත මයා - ආදේශක මුරකරු - රු. 3000.00

**2018 සැප්තැම්බර් මස**

යසරත්න විජේසේකර මයා - මුරකරු -රු. 8239.00
ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා - මුරකරු - රු.6198.75
ඩබ්.කේ. සම්පත් සංජීව මයා (මුර සේවය වෙනුවෙන්)- ආදේශක රියදුරු - රු. 4500.00
එන්.එම්.රජිත මයා - ආදේශක මුරකරු - රු. 3750.00
චන්දිමා සෙනවිරත්න මිය - කළමනාකරණ සහකාර - රු. 426.65
එම්.ඒ.වසන්ත මයා -රියදුරු - රු.7034.00
ඩබ්.ඒ.ශාන්ත මයා -සංවර්ධන නිලධාරි -රු.1044.62 ඉෂානි
දීපිකා ගනේවත්ත මිය - පරිගණක ක්‍රියාකරු - රු. 757.62

**08.2018 සැප්තැම්බර් මස පරිවර්ථීත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සදහා)**

ආර්.ඒ.ඒ.එල්.රත්නායක මිය - සංවර්ධන නිලධාරී - රු. 3000.00
දිලිනි දිසානායක මිය - තාක්ෂණ සේවා නිලධාරී - රු. 4000.00
කුසල් අසංක එදිරිසිංහ මයා - තාක්ෂණ සේවා නිලධාරී - රු. 4000.00
කේ.ජී.ජයනි මිය - සංවර්ධන නිලධාරී -රු. 3000.00
ඩබ්.ජේ.ඒ.ශානක මයා -ආදායම් පරීක්ෂක -රු .3000.00

**09.එම්.එච්.ෆසරීයා ෆවරීන් මිය ,ලේකම් නාගොඩ ප්‍රාදේශීය සභාව**

ප.පා.ස.කො.ගේ අංක පා.පා.ස.කො./ගා/ආ/07/11 හා 2018/09/25 දිනැති ලිපිය අනුව 2018 සැප්තැම්බර් මාසයේ සති අන්ත දින වල සේවයේ යෙදීම වෙනුවෙන් දින වැටුප් ගෙවීම (2018/09/15 හා 2018/09/30) - රු.3595.50

**10.එච්. එල්.එන්.පී.කුමාර මයා, ම.සෞ.ප**

ආහාර සාම්පල් රැගෙන කලුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට යාම වෙනුවෙන් ගෙවීම - රු. 400.00

**11.එච්.ඩබ්.ප්‍රියන්ත අමරනාත් මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සදහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/09/07) - රු. 504.00
II. ආහාර පනතේ නඩු සදහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/09/14) - රු. 504.00

**12.ආර්. ඒ.රංජිත් මානෙල් මයා, හොටෙල් සීගිරි,නාගොඩ**

2018.09.11 දින පැවති මහ සභා රැස්වීම සඳහා සංග්‍රහ කිරීමේ වියදම් (ආහාර සඳහා) - රු.4040.00

**13.ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**

2018.09.11 දින පැවති මහ සභා රැස්වීම සඳහා සංග්‍රහ කිරීමේ වියදම් (තේ සඳහා) - රු. 2731.70

**14.ෆෝඩ් ඩ්‍රයිව්, ගාල්ල**

252-6478 කැබ් රථය සඳහා මඩ කවර සහ කාපට් ලබා ගැනීමේ බිල්පත -රු. 5400.00

**15.ෆින්ටෙක් මැනේජ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ 13**

I. Sharp AR 53/6 ගා/නාප්‍රාස/ආ/04/02 ඡායා පිටපත් යන්ත්‍රෙය් වාෂරීක සේවා ගිවිසුමේ බිල්පත පියවීම - රු. 14662.50

II. Sharp 1563 ගා/නාප්‍රාස/ආ/04/02 ඡායා පිටපත් යන්ත්‍රෙය් අලුත්වැඩියා සිදු කිරීමේ බිල්පත පියවීම - රු. 8914.80

**16.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**2018 අගෝස්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 575 ක් | - රු. 67850.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 260 ක් | - රු. 30680.00 |
| RD 1637 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 82 ක් | - රු. 9676.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 238 ක් | - රු. 28084.00 |
| RD 9457 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 42 ක් | - රු. 4956.00 |
| ගබඩාවට ඩීසල් ලීටර් 50 ක් | - රු. 5900.00 |

**17.ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී , කොළම 02**

Gestetner MP 2001 L ගා/නාප්‍රාස/ආ/04 ඡායා පිටපත් යන්ත්‍රෙය් අලුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම - රු. 14683.20

**18.ඒ. ඩී. කරුණාරත්න, සරත් ස්ටොසර්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2018 අප්‍රේල් | - රු. 5415.00 |
| 2018 අගෝස්තු | - රු. 5210.00 |

**19.එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2018 සැප්තැම්බර් - රු. 4030.00

**20.නීතිඥ හේමන්ත පී. ඩබ් විතාරණ මයා, කොටුව, ගාල්ල**

I. P 15977 දරණ 2018.09.12 දින පැවැති නඩුවෙහි නීතිඥ හා පෙනීසිටීමේ ගාස්තු - රු. 3000.00

II. L 16242 දරණ 2018.10.12 දින පැවැත්වීමට නියමිත නඩුවේ නීතිඥ හා පෙනීසිටීමේ ගාස්තු - රු. 3000.00

III. M 343 දරණ නඩුවෙහි පෙරකලාසි ගොනු කිරීමේ ගාස්තු හා 2018.05.10, 2018.10.04 දිනයන්හි නීතිඥ හා පෙනීසිටීමේ ගාස්තු - රු. 25000.00

**21.පී. එච්. ප්‍රේමලාල් මයා, උඩුගම**

2018.09.18 දින පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා වතුර බවුසරය ඇණවුම් කලද, එය ලබා නොගැනීම හේතුවෙන් ගෙවූ මුදලින් 25% ක රඳවුම් මුදල අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල නැවත ගෙවීම- රු. 3000.00

**22.තරිඳු මධුෂංක සෙනවිරත්න මයා, මාපලගම**

2018.09.07 දින පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා වතුර ටැංකිය ඇණවුම් කලද, එය ලබා නොගැනීම හේතුවෙන් ගෙවූ මුදලින් 25% ක රඳවුම් මුදල අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල නැවත ගෙවීම- රු. 750.00

**23.ටී.ජී. හාඩ්වෙයාර්, නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගෑස් සිළිංඩරය පිරවීමේ බිල්පත පියවීම - රු. 635.00

**24.දයානි පුද්ගලික සමාගම,මාපලගම**

I. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් උඩුගම බහුකායර් ගොඩනැගිල්ලේ ජල සැපයුම ලබා දීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු.5064.00
II. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් උඩුගම බහුකායර් ගොඩනැගිල්ලේ අක්‍රිය වූ පේනුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු.1745.00
III. උඩුගම උප කායර්ාල භූමියේ වාහන නැවතුම් අංගනයේ විදුලි ආලෝක පද්ධතිය සකස් කිරීමේ උපකරණ මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු.1515.00

**25.සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, මාතර**

නාගොඩ ප්‍රාදේශීය සභවේ කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමේ බිල්පත පියවීම - රු.51773.60

**26.පී.එල්.රංජන්,ඇල්බට් චිත්‍ර ශිල්පියෝ ,ගාල්ල**

I. ආදායම් පරීක්ෂක තනතුර සඳහා අවශ්‍ය නිල මුද්‍රාවක් ලබා ගැනීමේ බිල්පත පියවීම. -රු.1000.00
II. මාපලගම වෙළඳ සංකීණර්යේ ඉහළ මාලයට ප්‍රවේශවන ස්ථානයට වාහන නැවැත්වීම තහනම් යනුවෙන් බෝඩ් එකක් සවි කිරීමේ බිල්පත පියවීම. -රු.5000.00

**27.ඩී.ජී.රවින්ද්‍ර, කෞශල්‍යා ඉංජිනියරින් වකර්ස්,නාගොඩ**

252-6478 කැබ් රථයේ අලුත් වැඩියා කිරීමේ බිල්පත පියවීම (සීට් එක ගලවා අලුත් වැඩියා කර නැවත සවි කිරීම,පිටුපස කැබිනයට ඇණ දමා පෑස්සීම,සිග්නල් ලයිට් සෑදීම) - රු.2400.00

**28.ඊ බේස් කම්පියුටර් ටෙක්නොලොජී, මාපලගම ,ගාල්ල**

ප්‍රධාන කායර්ාලයේ භාවිතා කරනු ලබන Sharp වගර්යේ හා Gestetner වගර්යේ ඡයා පිටපත් යන්ත්‍ර සඳහා ටෝනර් කාට්ලේජ 4ක් මිලදී ගැනීමේ බිල්පත පියවීම -රු.39500.00

**29.කෙත්සිරි කොමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ටින්,තල්ගස්වල**

I. 2018 ඔක්තොම්බර් මස පැවැත්වීමට නියමිත සාහිත්‍ය නිමර්‍ාණ තරගාවලියේ නිමර්‍ාණ සඳහා දරුවන් වෙනුවෙන් සහතික පත්‍ර ලබා දීමට සහතික මුද්‍රණය වෙනුවෙන් දරණ ලද වියදම පියවීම -රු.11550.00

II. සාහිත්‍ය උත්සවයේ චිත්‍ර තරග සඳහා චිත්‍ර අඳින කොල මිලදී ගැනීමේ බිල්පත පියවීම -රු.2700.00

**30.සිංහගිරි ස්ටෝසර් ,උඩුගම**

I. ලෝක ළමා දින උත්සවයේ ළමුන්ට ත්‍යාග ලබා දීම සඳහා මිලදී ගන්නා ලද ත්‍යාග භාණ්ඩ බිල්පත පියවීම - රු.35405.00

II. ලෝක ළමා දින උත්සවයේ ශාලා සැරසිලි සඳහා මිලදී ගන්නා ලද උපකරණ බිල්පත පියවීම( බිල් අංක.1624 2018/10/03) -රු. 1320.00

III. ලෝක ළමා දින උත්සවයේ ශාලා සැරසිලි සඳහා මිලදී ගන්නා ලද උපකරණ බිල්පත පියවීම( බිල් අංක.1628 2018/10/04) -රු. 395.00

**31.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 සැප්තැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

**32.ලයන් ෆොටෝ ,ගාල්ල**

සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට සහ නිලධාරීන් ඇතුළු කායර් මණ්ඩලය සඳහා කායර්ාලීය හැඳුනුම්පත් සකස් කිරීමේ බිල්පත පියවීම -රු.20450.00

33. කේ.යු.කේ. සුපර් කූල් සවරීස්, නියාගම , තල්ගස්වල
එයාර් කටර්න් පද්ධතිය අලුතින් සපයා සවිකිරීමේ බිල්පත - රු. 26000.00

34. ඩී. ආර්. ඉන්ඩස්ට්‍රිස් ප්‍රයිවට් ලිමිටඩ්, ගාල්ල
නාගොඩ ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාව වායුසමීකරණය කිරීමේ බිල්පත - රු. 283230.00

35. පෝස්ට් මාස්ටර් ජනරාල්

තැපැල් ගාස්තු ගෙවීම ( 2018/10/08 දිනට හිඟ ශේෂය) - රු. 9263.00

**පොදු අරමුදල් කමර්ාන්ත**

**36.වසන්ත කැටිපෙආරච්චි ,මාපලගම**

උඩුගම හෝමදොළ 50 මාගර්ය ජේ.සී.බී.යන්ත්‍ර යොදා සංවධර්නය කිරීම වෙනුවෙන් ගෙවීම.
(මීටර් පැය 20) -රු.50000.00

37. ආරියතිලක මාවත කොන්ක්‍රීට් කිරීම සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීඹ සහ එම කමර්ාන්තයේ අලුත්වැඩියා කිරීමේ කම්කරු අත්තම් කුලි ගෙවීම

- ටී.ජී. හාඩ්වෙයාර්, ගා/නාගොඩ - රු. 16067.50
- එච්.ඒ.කේ.වීරසේන, වළකුඹුර - රු. 19222.50
- ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව - රු. 11600.00

38. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ

ලෝක ළමා දින උත්සවයේ සංග්‍රහ වියදම් බිල්පත - රු. 14517.00

39. චමින්ද ප්‍රේම කුමාර බ්ලොක්
නාරංගොඩ මාගර්ය පස් පිරවීම - රු. 67000.00
40. චමින්ද ප්‍රේම කුමාර බ්ලොක්
කුඹුරුහේන මාගර්ය සංවධර්නය කිරීම - රු. 32500.00

**රජයේ ආධාර කමර්ාන්ත**

**34.194 සී උඩවැලිවිටිතලාව නැගෙනහිර සුළු ගොවි සංවිධානයේ ගි/අං/272-2-001-6-0039899 ට බැර**
උඩවැලිවිටිතලාව මාගර්යේ සණස අසල සිට වෙල දක්වා මාගර්ය කොන්ක්‍රිට් කිරීම
කමර්ාන්තයේ 10% රුදවුම් නිදහස් කිරීම. -රු.67994.55

- මේ සම්බන්දව ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා,ඉදිරි ගෙවීම් යටතේ ලෝක ළමා දින උත්සවයේ සැරසිලි සඳහා වියදම් සමබන්දව සටහන් වී ඇති බිල්පත පිළිබඳ විමසන ලදී.එහිදී ඔහු කියා සිටියේ මෙම උත්සවයේ සැරසිලි පෙරපාසල්වලට භාරදී තිබුන බැවින් මෙම වියදම කුමක් සඳහාද යන්න දැන ගැනීමට කැමති බවයි.
- ඒ සම්බන්දව පැහැදිලි කළ ගරු සභාපතිතුමා කියා සිටියේ එම වියදම් ක්‍රේප් පටි,බැලුන් 100 ක්,ඉටි පන්දම් 01 ක්,ගෝල්ඩ් පේපර්,චිත්‍ර කොල 30 ක්,මිලදී ගැනීම සඳහා එම මුදල වැය වූ බවයි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් වාතර්ාව නිවැරදි බවට යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රි සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

03. LL 7650 දරණ වාහනය සේවා කිරීම සඳහා අඩුම මිළ ගණන් ලැබී ඇති උඩුගම මුතුහෙට්ටිගම ටයර් සවරීස් වෙතින් සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රි පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

04. LL 7650 දරණ වාහනයට අලුතින් ඉදිරිපස ටයර් යෙදීම සඳහා අඩුම මිළ ගණන් ලැබී ඇති නිව් විජය මෝටසර්, ගාල්ල වෙතින් සිදු කිරීමට යෝජනා කරමි

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රි වී. වී. සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

05. නියෝජ්‍ය විදුහල්පති, , පළමු ගාලු මහින්ද බාලදක්ෂ සමූහය, මහින්ද විද්‍යාලය, ගාල්ල විසින් යොමු කරන ලද 6 වන මිහිඳු අශියෝගතා ගවේෂන තරඟාවලිය සඳහා වතුර බවුසරය ලබාදීමට යෝජනා කරමි.

**ගරු උපසභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

06.නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් තල්ගස්වල, උඩුගම, උනන්විටිය සති පොළවල් 2019 වෂර්යට ටෙන්ඩර් කිරීම සම්බන්ධව යෝජනා කිරීම සහ අදහස් ලබා ගැනීම , ඒ සම්බන්ධව දැනුවත් කිරීම

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, අඩුගම පොළ අලුතින් ප්‍රතිසංස්කරණය කර ඇති නිසා 2019 වසරේ පොළ ටෙන්ඩර් නොකර සභාවෙන් නිලධාරීන් යොදවා මුදල් එකතු කිරීමට අදහසක් තියෙනවා.

මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා යන මන්ත්‍රීතුමන්ලා විසින් ප්‍රකාශ කර සිටියේ සභාවෙන් මුදල් එකතු කිරීම අසාථර්ක බවයි. පොළේ පවතින අඩුපාඩු සමඟ එසේ මුදල් එකතු කිරීම කල නොහැකි බවයි. නමුත් ගරු සභාපතිතුමාට හැකිනම් එසේ සිදු කර බලමු යන්න ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් එසේ නම් පොළ ටෙන්ඩර් කිරීම අවම ලංසුව වැඩිකර ටෙන්ඩර් කිරීමට යෝජනා කරන ලදී.

පොළවල්වල ඇති අඩුපාඩුත් සමඟ ටෙන්ඩර් ගාස්තු වැඩි කල විට ටෙන්ඩකර්රු එම මුදල සොයා ගැනීමට වෙළෙන්දන්ගෙන් වැඩි මුදලක් අය කර ගැනීමට උත්සාහ දැරීම තුළින් වෙළෙනන්දන් එම මුදල ගෙවීමට බඩු මිළ ඉහළ යැවීම නිසාත් එහි පහර වදින්නේ පාරිභෝගිකයාට බවත්, ටෙන්ඩර් මුදල ඉහළ නොයවන ලෙස ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා, ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් තම අදහස් ලෙස ප්‍රකාශ කරන ලදී.

පොළ ටෙන්ඩරයේ අවම ලන්සුව 10% කින් වැඩි කිරීම සඳහා යෝජනා කල අතර එවිට ලක්ෂ 02 කින් ලංසුව වැඩිවන බව ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා ප්‍රකාශ කළේය. නමුත් ගියවර ටෙන්ඩරය රු. 2260000.00 කට ලබා ගෙන ඇති බැවින් මෙවර අවම ලංසුව එම වටිනාකම විය යුතු බවත්, නමුත් මෙතෙක් කල් ටෙන්ඩර් කිරීමේදී එම ක්‍රමවේදය අනුගමනය කර ඇති බැවින් මෙවරද එසේ කිරීම සුදුසු බවට තීරණය විය. තල්ගස්වල උඩුගම හා උනන්විටිය පොළවල් 2018 වෂර්යේ ටෙන්ඩර් කල මුදල අවම ලංසුව වශයෙන් ගෙන 2019 වෂර්යේ ටෙන්ඩර් කිරීමට යෝජනා කරමි. එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ සියලු දෙනාගේ ඒකමතික එකඟතාවය පළ විය.

එම මුදලට ටෙන්ඩර් ලබා දීමේදී ටෙන්ඩකර්රුට යැවිය යුතු කොන්දේසි පිළිබඳව යෝජනා ලබා ගන්නා ලදී. මෙම කොන්දේසිවලට පටහැනිව කටයුතු කල හොත් ටෙන්ඩරය අහෝසි කරන බවද සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

- පොළ පිරිසිදු කිරීමත්, නිතිපතා පිරිසිදුව තබා ගැනීමත්, වැසිකිළි පිරිසිදුව තබා ගැනීමත්, ටෙන්ඩකර්රුට වෙන්දේසියකින් භාර දියි යුතු බව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කරන ලදී.
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට දැණුම් දී මසකට වරක් හෝ ාපාළවල් පරික්ෂා කර වාතර්ාවක් ලබා දෙන ලෙස ඉල්ලා එම වාතර්ාව අනුව ටෙන්ඩකර්රුට විරුද්ධව කටයුතු කිරීම සඳහා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා යෝජනා කරන ලදී. ඒ පිළිබඳව ගිවිසුමේද ඇතුලත් විය යුතු බව යෝජනා කරන ලදී

- කඩ කාමර සඳහා තක්සේරු කරන ලද  මුදලට වඩා හිතුමතේ ටෙන්ඩකර්රුට මුදල් අය නොකල යුතු බවට ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් යෝජනා කළේය.
- හදිසි ආපදා තත්වයකදී පොළ පැවැත්වීමට නොහැකිව ටෙන්ඩරකරුට සිදුවන පාඩු සම්බන්ධයෙන් සභාව විසින් ලබාගන්නා තීරණයට එකඟ විය යුතු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.
- රජයෙන් ආපදා තත්වයක් බවට ප්‍රකාශ කල අවස්ථාවේදී එම සහනය ලබා දිය යුතු බව ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා යෝජනා කරන ලදී.
- වසරකට ආපදා තත්ව කිහිපයක් ඇති වන බැවින් ටෙන්ඩකර්රුට එම සහන ලබා දීමේදී උත්සව අවස්ථාවල පැවැත්වෙන අමතර පොළවල් සඳහාද බදු අය කල යුතු බව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා යෝජනා කරන ලදී.

**ඉහත යෝජනා සියල්ල උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික එකඟතාවය පළ විය.**

07. 2019 වෂර්යට අදාළව ප්‍රාදේශීය සභාවේ ආදායම් රැස් කිරීමට අදාළ යෝජනා ඇතුලත් ආදායම් ගැසට් කිරීමේ කෙටුම්පත සභාවට ඉදිරිපත් කරන ලදී.

**එම යෝජනාව උප සභාපතිතුමා විසින් ස්ථිර කරනු ලදුව සභා සම්මත විය.**

08. ගිවිසුම් ගත වී නොමැති කඩ කාමර සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීම

**එම යෝජනාව උප සභාපතිතුමා විසින් ස්ථිර කරනු ලදුව සභා සම්මත විය.**

09. නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කායර්ාලයේ සංවධර්න අංශයේ වහළ අළුත්වැඩියා  කිරීම සහ . නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කායර්ාලයේ ළිඳ වටා බැම්මක් බැඳ සකස් කිරීම

**ගරු සභාපතිතුමා  විසින් කරන ලද  යෝජනා ගරු මන්ත්‍රි වී. වී. සහබන්දු  මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

10. උඩුගම බහු කායර් ගොඩනැගිල්ලෙහි කොඩි කණු වේදිකාවක් ඉදි කිරීම

**ගරු සභාපතිතුමා  විසින් කරන ලද  යෝජනා ගරු මන්ත්‍රි තරංග සුදශර්න  මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

11. ගංවතුර හේතුවෙන් ආපදා තත්වයට පත්වූ මාගර් යථා තත්වයට පත් කිරීමේ යෝජනාව

**ගරු සභාපතිතුමා  විසින් කරන ලද  යෝජනා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

12. ලේක්හවුස් ආයතනයෙන් නිකුත් කරනු ලබන සත්මඩල සඟරාව මිළදී ගැනීම

**ගරු සභාපතිතුමා  විසින් කරන ලද  යෝජනා ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

13. මහ සභා රැස්වීම සඳහා සහභාගී වන මාධ්‍යවේදී මහතුන්ට දීමනාවක් ලබා දීම

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී සී.වී සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

- **8.2 කමර්ාන්ත යෝජනා**

**ගරු දකුණු පළාත් කෘෂිකමර් අමාත්‍ය යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. තලංගහ වතුයායේ බොතේජු කොටසේ කාලිඅම්මා කෝවිල අසළ වතු නිවාස සඳහා ප්‍රවේශ මාගර්ය මීටර් 35 ක් කොන්ක්‍රීට් කිරීම රු. 200,000.00

**8.3. ගරු උප සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. උඩුගම දකුණ පොදු ක්‍රීඩාංගණය දැනට පවතින තත්වයෙන් මට්ටම් කර ක්‍රීඩා කල හැකි තත්වයට සංවධර්නය කිරීම

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්ත මහතා ගේ යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. කුඹුරුහේන නො.20 අතුරු මාගර්යට කාණු පද්ධතියක් නොමැති වීම හෙයින් මාගර්යේ වලවල් සෑදී ඇත. එම නිසා කාණු පද්ධතිය ක්‍රමවත් ලෙස ස්ථාපිත කර දෙන මෙන් යෝජනා කරමි.

II. බල ප්‍රෙද්ශයට අයත් 215 B අලුත් පහළ බටහිර මාගර්ය ඉතාමත් අබලන් වී ඇත. එම නිසා මාගර්යේ ඇති වලවල්වලට නිසි අයුරින් කොරිපස් පුරවා ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පී.ජී.රංජිත් ජයවීර මහතා ගේ යෝජනා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. උනන්විටිය කුකුලුවැල්දූව මාගර්ය පස් දමා ගොඩ කිරීම.

**තාක්ෂණ නිලධාරී වාතර්ාව අනුව මෙම යෝජනාව ඉවත් කරන ලදී.**

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. 218 C මොරගල්මුල්ල කොස්ගහහේන මාගර්ය J.C.B. යන්ත්‍රයක් මගින් ප්‍රතිසංස්කරණය කර සංවධර්නය කිරීම

II. 218 D උක්ඹිවිට 59 හේන බටහේන්ගොඩ මාගර්යේ වැටී ඇති පස් කඳු ඉවත් කිරීමට J.C.B. යන්ත්‍රයක් යොදා ගැනීම

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ගේ යෝජනා ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. උඩුගම අලුත්වත්ත සුදුවැලිපොත ගල්කන්ද මාගර්ය සංවධර්නය කිරීම

II. උඩුගම අලුත්වත්ත පැණිගලයාය, කොටිගල්ගේ මාගර්ය සංවධර්නය කිරීම

III. උඩුගම අලුත්වත්ත සුදුවැලිපොත හංදියේ සිට උඩුගම නැගෙනහිර යා කරන ගොඩේකන්ද මාගර්ය සංවධර්නය කිරීම

IV. උඩුගම අලුත්වත්ත පැණිගලයාය මාගර්ය සංවධර්නය කිරීම

V. උඩුගම අලුත්වත්ත පෙරෙට්ටු මඩුව අසළ සිට අලුත්වත්ත රෝහල් මාගර්ය (28 මාගර්යට යාවන අතුරු මාගර්ය සංවධර්නය කිරීම

VI. උඩුගම දකුණ සුදුවැලිපොත පොදු නාන ළිඳ ඉදිකිරීම

VII. උඩුගම දකුණ යූ.ජී. දයාවංශ මහතාගේ නිවස අසළ පොදු නාන ළිඳ අලුත්වැඩියා කිරීම

VIII. උඩුගම දකුණ සුදුවැලිපොත 13 කන්ද මාගර්ය සංවධර්නය කිරීම

IX. උඩුගම අලුත්වත්ත කොරගමලේ ක්‍රීඩාංගණය හා උඩුගම දකුණ සුදුවැලිපොත ක්‍රීඩාංගණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව් සභාපතිතුමාගේ විශේෂා අංක කො.474 ලිපිය මගින් ඉඩම් විකිණීමේ පදනම යටතේ ලබා ගන්නා ලෙස දන්වා ඇත. ඒ අනුව මැනුම් ගාස්තු හා මිළදී ගැනීමේ ගාස්තු ගෙවා ඉඩම් ලබා ගැනීම

මෙහිදී ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා පැහැදිලි කරමින් ගරු සභාපතිතුමනි මගේ යෝජනාවල හයවැනි යෝජනාව උඩුගම දකුණ සුදුවැලිපොත පොදු නාන ළිඳ ඉදිකිරීම මේ ලිඳ 1991 – 97 කාලවකවානුව තුල මට හරියටම මතක නැහැ. ප්‍රයෝජනයට ගත්ත ලිඳක් පසු කාලීනව කැඩිල විනාශ වුනා.අවුරුදු ගණනාවක් එහෙමම තිබුන දැන් එතන ලිඳක් නැහැ.පායන කොට වතුර නැති නිසා ලිඳක් අවශ්‍ය වෙලා තිබෙනව.ගැටලුව වෙලා තියෙන්නෙ අයිතිය පිළිබඳ.කලින් ලිඳ හදනකොට පචර්ස් දෙකක් වත්තෙන් අරගෙන තමයි හැදුවෙ.ඊයෙත් ඒ පැරනි ලිපිගොනුව සෙව්ව සොයා ගන්න බැරිවුනා.මේකෙ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් තියෙන්නෙ.කවුරුත් දන්නව එතන ලිඳක් තිබුන බව.මේ ප්‍රශ්නෙ නිරාකරණය කරල දෙන්න සභාපතිතුමනි.ලිඳ හදන්න සල්ලි සොයා ගන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා ගේ යෝජනා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. ගම්මැද්දේගොඩ බොකුටියවල මාගර්යේ ඇල්ලහේන දෙණිය ප්‍රදේශයේ ඇති ඇල මාගර්යට අවශ්‍ය සිළින්ඩර් දෙකක් ලබා ගැනීම

II. 217 A ගම්මැද්දේගොඩ සමූහ ගොවිපලට අයත් ගුලනවිල රදාදෙණිය පාර සඳහා සිළින්ඩර් දෙකක් ( 4x8) ලබා ගැනීම

**ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය ගේ යෝජනා ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. උඩවැලිවිටිතලාව මිල්ලගහ උඩුමුල්ල මාගර්ය සඳහා කොරි පස් කියුබ් 04 ක් ලබා ගැනීම
II. තලාව හොරංගල්ල මාගර්ය සංවධර්නය කිරීමේ යෝජනාව සංශෝධනය කිරීම (නව යෝජනාව - උඩවැලිවිටිතලාව ගල්ලෙනමුල්ල මාගර්ය සංවධර්නය කිරීම)

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ යෝජනාව ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී වී.වී. සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. යටලමත්ත විනිමුල්ල කන්ද පාර J.C.B. යන්ත්‍රයක් යොදා සංවධර්නය කිරීමට යෝජනා කරමි.
II. මහහේනවත්ත ඌරල උයන ප්‍රවේශ මාගර්ය J.C.B. යන්ත්‍රයක් යොදාඅළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී වී.වී. සහබන්දු මහතාගේ යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**9. කාරක සභා වාර්තා**

**9.1 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| | |
|---|---|
| උඩුගම 218 සී මොරගල්මුල්ල කොස්ගහහේන මාගර්ය සංවධර්නය කිරීම | රු. 22500.00 |
| උඩුගම 218 ඩී උක්ඕවිට 59 බටහේන්ගොඩ මාගර්ය සංවධර්නය කිරීම | රු. 25000.00 |
| තලංගහ වතුයායේ බොතේජු කොටසේ කාලි අම්මා කෝවිල අසළ වතු නිවාස සඳහා ප්‍රවේශ මාගර්ය කොන්ක්‍රීට් කිරීම | රු.200000.00 |

| | |
|---|---|
| මගහේනවත්ත ඌරල , උයන ප්‍රවේශ මාගර්ය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවධර්නය කිරීම | රු. 10000.00 |
| මාපලගම ආයුවෙර්දයේ හා පුස්තකාලයේ ජල සැපයුම් හා සනීපාරක්ෂක වැසිකිළි පද්ධතිය ස්ථාපනය කිරීම | රු. 165000.00 |
| උඩුගම පොළ සංවධර්නය කිරීම | රු. 350000.00 |
| උඩලමත්ත මීපෙ ගෙදර ලඟ ඒදණ්ඩ නැවත සකස් කිරීම සඳහා අදාළ සෘජු ශ්‍රමික ඇස්තමේන්තුව | රු. 65000.00 |
| නීල්ද අල්විස් මාවතේ දෙපස ජේ. සී.බී යන්ත්‍රය යොදා සංවධර්නය කිරීම | රු. 20000.00 |
| යටලමත්ත විනිමුල්ල කන්ද මාගර්ය ජේ. සී.බී යන්ත්‍රය යොදා සංවධර්නය කිරීම | රු. 55000.00 |
| පරණතානායම්ගොඩ මැටීමවත්ත පාලම අසළින් ඇති මාගර්ය කොනක්‍රීට් දමා සංවධර්නය කිරීම | රු. 300000.00 |
| කැප්පිටියාගොඩ පඹේදෙනිය සුදශර්නාරාම විහාරස්ථානය ප්‍රවේශ මාගර්ය සංවධර්නය කිරීම | රු. 25000.00 |
| නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කායර්ාලයේ සංවධර්න අංශයේ වහළ අළුත්වැඩියා කිරීම | රු. |
| නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කායර්ාලයේ ළිඳ වටා බැම්මක් බැඳ සකස් කිරීම | රු. |
| උඩුගම බහු කායර් ගොඩනැගිල්ලෙහි කොඩි කණු වේදිකාවක් ඉදි කිරීම | රු. |

**ඉහත ඇස්තමේන්තු ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**9.2 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

***SP LL 7366 ට්‍රක් බවුසරය සහ . SP LL 7650 කෘෂ කැබ් රථයේ බැටරි සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | මලිත් ටයර් ඇන්ඩ් බැටරි සර්විස් ගාල්ල | මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර් ඇන්ඩ් මෝටර් සෙන්ටර් උඩුගම | හදුන්නෙත්ති ටයර් ඇන්ඩ් බැටරි සෙන්ටර් උඩුගම |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| • ඇමරෝන් NT 700 (100ඇම්පියර්)<br>• ඇමරෝන් NT 800 (120ඇම්පියර්) | රු.22900.00<br>රු.32950.00 | රු.23100.00<br>රු.31050.00 | රු.22650.00<br>රු.30100.00 |

මෙම මිළ කැඳවීම සාධාරණ බව ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව **හඳුන්නෙත්ති ටයර් ඇන්ඩ් බැටරි සෙන්ටර් උඩුගම** වෙතින් මිළදී ගැනීමට ඒකමතිකව තීරණ විය.

***ලෝක ළමා දින උත්සවයේ ළමුන් සඳහා පිරිනමනු ලබන ත්‍යාග සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | හසාරෝ එන්ටර්ප්‍රයිසස් | දර්ශන ස්ටෝස් නාගොඩ | සිංහගිරි ස්ටෝස් උඩුගම |
|---|---|---|---|
| • මැජික්ලයිට් බෝල (ඒකක මිල) | රු.72.50 | රු.75.00 | රු.70.00 |
| • ප්ලාස්ටික් කැට (විශාල,) (ඒකක මිල) | රු.35.00 | රු.35.00 | රු.30.00 |
| • ප්ලාස්ටික් කැට (මධ්‍යම) (ඒකක මිල) | රු.33.00 | රු.30.00 | රු.25.00 |
| • ප්ලාස්ටික් කැට (කුඩා)(ඒකක මිල) | රු.30.00 | රු.26.00 | රු.20.00 |
| • ප්ලාස්ටික් ටී කප් (ඒකක මිල) | රු.30.00 | රු.27.50 | රු.25.00 |

**මෙම මිළ කැඳවීම සාධාරණ බව ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව සිංහගිරි ස්ටෝසර් උඩුගම වෙතින් මිළදී ගැනීමට ඒකමතිකව තීරණ විය.**

***Digital Duplicators (ඩුප්ලෝ ෆොටෝ කොපි ) මැෂින් සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | ජෝන් කීල්ස් ඔටෝමේෂන්, කොළඹ 02 | ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී, කොළඹ 02 | ගොල් අයි ටී සොලියුෂන්, ගාල්ල |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| Digital Duplicators (ඩුප්ලෝ ෆොටෝ කොපි මැෂිම) | රු. 287500.00 | රු. 265000.00 | රු.258000.00 |

**සභාපති මෙම ලබාගත් මිළ ගණන් තාක්ෂණ දැනුමක් ඇති නිලධාරීන්ගෙන් සැදුම්ලත් තාක්ෂණ ඇගයීම් කමිටුවකට යොමු කර වාතර්ාව ලබා ගෙන ඉදිරි සභාවට යොමු කිරීමට කටයුතු කරමි.**

***අයදුම්පත් මුද්‍රණය සඳහා ලැබී ඇති මිළ ගණන් - (ඉල්ලුම්පතක් සඳහා)***

| විස්තරය | අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල | චන්දිම ප්‍රින්ටර්ස්, ඇල්පිටිය | කෙත්සිරි කොමියුනිකේෂන්, තල්ගස්වල |
|---|---|---|---|
| • පෙර පාසල් ළමුන් ඇතුලත් කිරීමේ ඉල්ලුම්පත්‍ර | රු. 2.40 | රු. 2.50 | රු.2.25 |
| • අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ඉල්ලුම්පත්‍ර | රු. 3.40 | රු. 3.50 | රු. 3.25 |
| • පුස්තකාල සාමාජික අයදුම්පත(ළමා අංශය) | රු. 6.20 | රු. 6.50 | රු. 5.50 |
| • පුස්තකාල සාමාජික අයදුම්පත(වැඩිහිටි අංශය) | රු. 6.20 | රු. 6.50 | රු. 5.50 |

**මෙම මිළ කැඳවීම සාධාරණ බව ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව කෙත්සිරි කොමියුනිකේෂන්,තල්ගස්වල වෙතින් මිළදී ගැනීමට ඒකමතිකව තීරණ විය.**

***LL 7650 කෘ කැබ් රථයෙහි ටයර් සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර්, උඩුගම | ආසිරි ටයර් ට්‍රේඩසර්ස්, ඇතුමලේ | නිව් විජය මෝටසර්ස්, ගාල්ල |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 600x16 ටයර් (සියැට්) | රු. 13042.00 | රු. 13209.00 | රු.12700.00 |

**මෙම මිළ කැඳවීම සාධාරණ බව ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව නිව් විජය මෝටසර්, ගාල්ල වෙතින් මිළදී ගැනීමට ඒකමතිකව තීරණ විය.**

**LL 7650 කෘ කැබ් රථය සේවා කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර්, උඩුගම | ආසිරි ටයර් ට්‍රේඩසර්, ඇතුමලේ | ගිම්හානි ඔටෝ සවරීස්, වඳුරඹ |
|---|---|---|---|
| LL 7650 කෘ කැබ් රථය සේවා කිරීම | රු. 1950.00 | රු. 2500.00 | රු.1950.00 |

**මෙම මිළ කැඳවීම සාධාරණ බව ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර්, උඩුගම වෙතින් මිළදී ගැනීමට ඒකමතිකව තීරණ විය.**

## 10. ලැබීම් හා ගෙවීම් වාර්තා

**ලැබීම් හා ගෙවීම් වාතර්‍ා ගරු පී.ජී.රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

## 11.වෙනත් කරුණු :-

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රීවරුනි මම මේ කතා කරන්නේ වෙනත් කරුණු යටතේ නෙවෙයි. වෙනත් කරුණු යටතේ පසුව කතා කරනවා. නමුත් ගරු මන්ත්‍රීවරුන්ට ගරු සභාපතිතුමාට දැනගැනීම සඳහා දැනුවත් වීම සඳහා යම් කරුණක් මතක් කරන්නයි මම නැගී සිටියේ. අපි කවුරුත් දන්න පසුගිය දවස්වල තිබුන ව්‍යසනය නිසා සෑම අතුරු මාගර්යක ම

පස් කණ්ඩි කඩා වැටිලා බෝක්කු,ඇල මාගර් අවහිර වෙලා සෑම ගමකම සෑම වසමකම යම් යම් ප්‍රශ්න තියෙනවා. දැන් තියෙන තත්වය අනුව ඉක්මනට දවසින් දෙකෙන් මේ පාරවල් එළිපෙහෙළි කරලා මිනිස්සුන්ට දෙන්න ඕන. අද මේ සභාවට යෝජනා දැම්මත් මේ න්‍යාය පත්‍රය ඉවරයි. මම ගරු සභාපතිතුමා ගෙන් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මටත් තියනවා යෝජනා හතරක් පහක් ඒව ලොකු වැඩ නෙවෙයි. JCB එකක් යොදවලා පස් ටිකක් ඉවත් කරනවා වගේ දේවල්. යෝජනා සියල්ල පසුගිය න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා කටයුතු කරන්න. මේ අනුමැතිය ගන්න ඕන ප්‍රශ්නෙ නිසා.මේ න්‍යාය පත්‍රයට ඇතුළත් වුනා සේ සලකා මගේත් ඔබතුමන්ලාගේත් තියෙන යෝජනා ඇතුළු කරලා කටයුතු කරන්න. සියලු දෙනාගේ එකඟතාවය ලබා දෙන්න කියලා. මම මේ අවස්ථාවේ මතක් කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි පසුගිය දා ඇතිවුණ ව්‍යසන තත්වයෙන් මම හිතන්නේ සභාවක් හැටියට අපේ ගරු සභාපතිතුමා පසුගිය දවසේ අතිවිශාල සේවාවක් කළා. මෙහෙවරක් කළා කියන එක අපි පිළිගන්නවා. පසුගිය කාලය තුලදී මේ වගේ තත්වයක් ඇතිවුනාම අපට විදුලි බලය පවා දින ගණනාවක් යන තුරුම ලැබෙන්නෙ නැහැ. එදා රාත්‍රියෙදිම අපේ සභාපතිතුමා ක්‍රියාත්මක වීම තුලින් විශාල වැඩ කොටසක් කරල පැයක් දෙකක් වගේ කාලයක් යනකොට විදුලිය පවා ලබාදීමට කටයුතු කළා. එදා රාත්‍රියේ සිටම විශාල සේවාවක් සිදු කළායි කියන එකත් මම මේ අවස්ථාවෙදි සඳහන් කරනවා. ඒත් එක්කම පහුගිය ඉරිදා දින අපිත් වැඩසටහනක් යොදා ගෙන තිබුනා. අපට ඒ වැඩසටහන කරන්න බැරි වුණා. නමුත් අපි ඒ සඳහා අපේ මුදල් යොදවා බඩුමුට්ටු ගෙනැවිත් සූදානම් වුණා. අපේ අවාසනාවට වගේ අයහපත් කාලගුණික තත්ත්වය නිසා අපට ඒ දේ සිදු කරගන්න බැරි වුණා. නමුත් අපේ මුදල් ඒ සඳහා දැන් වැයවෙලා තියෙනවා. ඒ නිසා අපට ඊළඟ සභාව එනකම් ඉන්නේ නැතුව ඒ සඳහා මොනවා හරි තීරණයක් අරගෙන මුදල් අනුමත කර දෙන ලෙස මම ඉල්ලීමක් කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධමර්සිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, මම මෙතනදී විශේෂයෙන් අවධානය යොමු කරනවා. මේ ගංවතුර ව්‍යසනය පිළිබඳව. මොකද අපි 2003 සහ 2017 ගංවතුර අවස්ථාවෙදි ලබපු අත්දැකීම් එක්ක මෙදාපාර ආපු ගංවතුර ඊට හාත්පසින්ම වෙනස්. මොකද 2003 ගංවතුරින් අපි ඉගෙනගෙන 2017 ගංවතුරට අපි සූදානම් වුණා. නෙළුව, හිනිදුම ප්‍රදේශ සමග දුරකථන ඇමතුම් මගින් සාකච්ඡා කර සූදානම් වුණා. නමුත් මේ අවස්ථාවේදී දුරකථන ඇමතුම් ලබාගත් විට ඒ ප්‍රදේශවල වතුරක් නැහැ කියන එක දැනගත්ත. මම පොලිසියේ ස්ථානාධිපති තුමාට සභාපතිතුමාට කතා කළා. මොකද අපි ජනතාව වෙනුවෙන් මොකක්ද කරන්න ඕන කියලා. නමුත් කිසිම කෙනෙක් දැනුවත් වෙලා හිටියේ නැහැ.මේ විදිහට ගලයි කියල. ගඟ පිටාර ගැලීම පටන් ගත්තේ මේ ප්‍රදේශයෙන්. එතකොට ඉහල පැත්තෙන් අපට දැනගන්න හැකියාවක් ලැබුණේ නැහැ. මේ වෙලාවේ අපි ඒ නිසා අපහසුතාවයට පත් වෙලා රෑ 1.00 ට විතර තමයි අපට ප්‍රචාරය යන්න පුළුවන් වුණේ. එතකොට අපේ වාහනත් යටවෙලා. මොකද වෙනදාට වඩා අපට ලොකු අපහසුතාවයකට පත් වෙන්න සිදු වුණා. ඉතින් ඒ නිසා ඒවාට සූදානම් වෙන්න ප්‍රධානකොටම අපි සාකච්ඡා කරන්න ඕන. දැනටත් වතුර ගලාගෙන එන තත්ත්වයක් තිබෙන නිසා හදිසියේ එහෙම දෙයක් උනොත් අපි ජනතාවට කෑම ටික දෙන්නෙ කොහොමද කියන එක. මොකද මගේ කොට්ඨාසය වටෙන්ම යට වන ප්‍රදේශයක් බවට පත් වෙලා තියනවා. ඒ නිසා අපි ඉතාමත් අපහසුතාවයට පත් වෙනවා.විශාල වශයෙන් බඩු තියෙන කඩ ඇත්තෙත් නැහැ මාපලගම පරණ තානායම්ගොඩ ප්‍රදේශයට වෙන්න. ඒක නිසා ඔබතුමන්ලා අවධානය යොමු කරලා. උඩුගම පැත්තෙන් හරි නිසි විදිහට බෝට්ටුවකින් හරි ඇවිත් ආහාරපාන ලබාදෙන්න පුළුවන්කමක් අපට හදනවනම් ඉදිරියේදී යම් කිසි දෙයක් සිදුවුණොත් මට ඒකට සූදානම් වෙන්න පුළුවන්. ඒ ගැනත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ වගේම මගේ කොට්ඨාශයේ මේ අවස්ථාවෙ විශාල නායයෑමක් සිදු වෙලා එක ගෙයක් නැත්තටම නැති වෙලා තියනවා.ඊයේ දවසේ ඒ නිවස බලන්න ගිහිපු සභාපතිතුමාට අපේ හිටපු මන්ත්‍රීවරයෙක් කතා කරපු විදිහ හොඳ නැහැ කියලා මට දැනගන්න ලැබුණා. ගරුත්වයක් නැති විදියට කතා කරයි කියලා.ඒ ගැන මම මේ වෙලාවේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඒක නෙවෙයි මගේ ප්‍රශ්නය. ඒ නාය යාම ගිහිපු ඒ ගෙදරට ප්‍රාදේශීය ලේකම්තුමිය යන විට එතන හිටිය අය ප්‍රාදේශීය ලේකම්තුමියට ඒ නිවස පෙන්නුවෙ නැහැ. මෙහා පැත්තෙන් කඩා වැටිච්ච කන්ඩියත් පෙන්නලා, අර නිවස ලේකම්තුමිය දකින්න නැහැ. මොකද ගෙයක් තියෙන්න ඕන පේන්න. එතනදි ග්‍රාම නිලධාරි වරයත් දැනගන්න ඕන. මෙන්න මෙතන ගෙයක් තිබුණා ඒගේ යට වෙලා තියෙන්නේ කියලා පෙන්නන්න. එහෙම පෙන්නන්නෙ නැතුව එක්කගෙන ගිහිල්ලා එහා පැත්තෙ ඉන්න කට්ටියත් එක්ක කතා කර කර ඉන්නවා.ඇත්තටම ග්‍රාමනිලධාරි වරයා එතනදී කරපු කටයුත්ත ඉතාමත් හොඳ නැහැ. මොකද ඒ අවස්ථාවේදී නිවස අයිති අය මානසිකව වැටිලා ඉන්නේ. ඒ මිනිස්සු දෙන්නා කොහේවත් යන්න බැහැ. දරුවන්ගේ ගෙවල් වල ගිහිල්ලා ඉන්න බැහැ. බැනලාගෙ කතන්දර අහන්න බැහැ. කිය කිය ඒ මනුස්සයා විලාප තියන අවස්ථාවකදී ඇවිත් පොඩ්ඩක් ඒ අයට කතා කරන්න ඕන. අපි ඒ අයගේ මනස හදනවයි කියලා කියන්නේ ඒකට. එහෙම නොකරහම එතනදි ලොකු සට්ටනයක් ඇති වෙන්න ගියේ. ඒ වගේම ආපදා කළමනාකරණය හරි කොහෙන් හරි වහින දවසට ඉදිරිපස කාමරයට වෙලා ඉන්න කියලා දැනුම්දීමක් කරලා තියෙනවා. නමුත් ඉස්සරහ කාමරේත් දැන් නැහැ.හොඳ වෙලාවට එක්ක ගෙන ගිහිල්ල තියෙනවා. නැත්නම් ජීවිත හානියකුත් සිදුවෙනවා. ඒවගේම සභාපතිතුමනි ආපදා කළමනාකරණය මෙම ස්ථානය අවධානම් කලාපයක් කියලා කියනවනම්, අපි ඒ අයට නිවසක් ඉඩමක් ලබා දෙනවා නම්, එසේ ලබාදීමේදී අලුත්වත්ත ප්‍රදේශයෙන් ලබාදෙන්න කටයුතු කරයි කියලා කියනවා. නමුත් මේ වයසක දෙන්නට තමන්ගෙ කාත් කවුරුවත් නැති ප්‍රදේශයට ගිහිල්ලා කිසිම රැකියාවක් කිසිම ආදායම් මාගර්යක් නැතුව අලුතින් ජීවිතයක් පටන් ගන්නෙ කොහොමද? මේ අයට මේ ප්‍රදේශයේ ඉඩම් නැත්නම් කමක් නැහැ.දැන් තල්ගස්වල ශෙඩ් එකක් දාගන්න ඉඩමක් දීල තියෙනව. එතන ඕන තරම් ඉඩම් තියෙනවා. එහෙමනම් ඒ අයට කාට වුනත් පක්ෂ භේදයකින් තොරව තමන්ගෙ ගම වටපිටාවෙන් කොහෙන් හරි ඉඩමක් ලබා දෙන්න පුළුවන්කමක් තියෙනවා. මොකද මෙහෙ ඉඩම් නැති තැනක් නෙවෙයි. එච්චරටම නාගරික වෙලා නැහැ.රජයේ ඉඩම් තියනවා. ඉඩමක් ලබා දෙන විට ඒ ගැන අවධානය යොමු කරන්න ඕන. ඒ අය එතනින් ගිහිල්ල කිසිම කෙනෙකුගෙ පිළිසරණක් නැතුව,ආදායමක් නැතුව, මේ පැත්තෙන් ඉඩමක් ලබාදීම තුළින් කන්න නැත්නම් අල්ලපු ගෙදරින් හරි ඉල්ලගෙන මොනවා හරි කන්න පුළුවන්. කොස් ගෙඩිය පොල් ගෙඩිය හරි සොයා ගන්න පුළුවන්. එහෙම නැතුව දුෂ්කර පැත්තකින් ඉඩමක් ලබාදීම සාධාරන වෙන්නෙ නැහැ. මම දන්න විදිහට ආපදා තත්වයට පත්වෙලා තියෙන ප්‍රදේශයේ නිවාස තුනක් හතරක් වගේ තියෙනවා. ඒ අයට ඉඩමක් ලබාදීම සම්බන්ධයෙන් ගරු සභාපති තුමාගේ අවධානය යොමු කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ වගේම මුලන ප්‍රදේශයේ මට තවම යාමට නොහැකි වුනා. නායයෑම් සිදු වූ ස්ථාන කිහිපයක් තියෙනවා. ඒ පිළිබඳ සොයල බලල තමයි කියන්න ඕන. එහෙම තියනවනම්, ඒ ස්ථාන වලටත් ඉඩමක් ලබාදීම සුදුසුයි නම්, තල්ගස්වල දියවර ගම්මානය ප්‍රදේශය, ඊටපස්සෙ තල්ගස්වල වත්ත, දැන් ඔය දෙන්නෙත් අපේ රජයේ වත්තක් ඇල්පිටිය වතු සමාගම කියන්නේත් රජයේ. ඉඩම් පවරා ගන්නවා නම්, රජයේ වත්තක් මේ ප්‍රදේශයේ අයට තල්ගස්වල වත්ත ප්‍රදේශයෙන් පවරාගෙන ලබාදෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. යම්කිසි විදිහකින් මොනවහරි ආපදාවක් වෙනවා නම්, ඒකට මුහුණ දීලා කිසිම ප්‍රශ්නයක් නොවෙන්න මිනිස්සුන්ට උදවු කරන්න පුළුවන් ශක්තිය ලබාදෙන්න කියලා. සියලු දෙනාගෙන් ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලය අවසරයි. මගේ විශේෂ ඉල්ලීමක් තියනවා. නන්දන මන්ත්‍රීතුමා සහ වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමාට. අපිට මේ ගංවතුර ගැන නෙවෙයි වැහි වතුර ගැන ප්‍රශ්නයක් තියෙනවා. මාපලගම සහ අලුත් ඉහල කොට්ටාසයේ. මම හිතන්නේ ඔබ තුමාගේ ආදරණීය භායර්‍යාවගේ නිවසට මෙහා. එතකොට අපි සභාවක් වශයෙන් අප්‍රේල් 4 වෙනිදා ඉඳලා දැන් මාස 6යි දවස් පහක් ගිහිල්ලා තියෙනවා. අපේ සභාව අතිනුත් ඒ වැඩකටයුතු කිසිම දෙයක් සිදුවුණේ නැහැ. මොකද ඒ මාගර් යටවෙනවා ආසිරි සවරීස් එක ළඟ සහ මෙතුමගේ භායර්‍යාවගේ නිවසට මෙහා. මම හිතන්නේ අපේ සභාව මගින් මුකුත් නොකෙරුණත් පවතින රජය වශයෙන් සොයා බලන්න වටිනවා. ඒ මාගර්යේ වතුර බහින්නේ නැති එකට කරන්න පුළුවන් මොකක්ද කියලා. දැන් සවරීස් එක ළඟ හැමදාම වතුර.මේ පාරෙ වතුර පිරෙන තැන් දෙකෙන් පුදුම කරදරයක් තියෙන්නෙ.මේ සම්බන්ධව ගරු සභාපති තුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහතා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මුලින්ම ඊයේ සිදු වුණ සිදුවීම පිළිබඳව කණගාටු වෙනවා. අපේ ගනේවත්ත මන්ත්‍රීතුමන් කිව්ව විදියට කොට්ඨාසෙ මන්ත්‍රීතුමන් විදිහට දැඩි විපතක් සිදු වූ මොහොතක ඒ විපත සිදු වුණු මොහොත සෙනසුරාදා රාත්‍රී හතයි විසි පහට එතැන් සිට මම එතන හිටපු අයෙක්.මම නිතර ව්‍යසනය ට ලක්වුණු නිවෙස්වල, ඒ වගේම ඒ අසල අය සමඟ රෑ එළිවෙනකම් සහ ඊට පසු දවසෙත් එම ස්ථානයේ කටයුතු කළා.මම සභාපත්තුමාට මතක් කර සිටිනවා. අපේ ගනේවත්ත මන්ත්‍රීතුමන් කිව්ව වගේ අපි ඒ නායයෑමට ලක්වුනු නිවාස දෙක තුන සඳහා ,නායයෑමට ලක් වීමට තිබෙන නිවසත් ලක්වුනු නිවාස දෙකටත් අවශ්‍ය සියලු පහසුකම් දෙන්න ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු දේශපාලන අධිකාරිය කටයුතු කළා. මම රු සභාපතිතුමාගේත් මන්ත්‍රීවරුන්ගේත් දැනගැනීම සඳහා සිහිපත් කරන්න ඕන. මුලින්ම ඔය නිවාස දෙකට අපි ඇප්තොප් වත්තෙන් කොටසක් දෙන්න සකස් කරලා, එවකට අපට ඉඩම් බෙදලා දෙන්න හඳුනාගෙන තිබුණේ ඇප්තොප් වත්ත. ඊට පස්සෙ ඒකට ඒ අය කැමැති වුණේ නැහැ. ඒ වගේම දෙවන අදියර හැටියට පසුගිය කාලේ අලුත් වත්ත පුණර් ගංවතුර හානි වුන අයට නිවාස ලබා දෙන කොට ඒ අයට නිවාස දෙකට ඉඩම් කැබලි දෙකක් සහ ලක්ෂ දාහතරක් ඒ නිවාස සකස් කරගැනීමට ලබාදෙන්න කටයුතු කළා. ප්‍රාදේශීය ලේකම් කායර්‍යාලයට ගෙනැල්ලා ඒ සඳහා ඒ අය දැනුවත් කළාම ඒ අය කිව්ව. අලුත්වත්ත ප්‍රදේශය අපට දුර වැඩියි ඒ නිසා අපට ඒ ප්‍රදේශයට යන්න බැහැ කියල. ඊට පස්සේ තුන්වන අදියර හැටියට අපි ලක්ෂ 16 ක මුදලක් ඒ නිවාස දෙකට ලබා දෙන්න කටයුතු කළා. දේශපාලන අධිකාරියත් ප්‍රාදේශීය ලේකම් කායර්‍යාලය මැදිහත් වෙලා කොහෙන් හරි තමන් කැමති තැනක ඉඩමක් අරගෙන ගේ හදාගන්න මුදල් දෙන්න රජය නිදේර්ශ කරල තිබුණා. හැබැයි මේ සියලු අවස්ථාවන් තුළදිම ඒ කටයුතු වලට මේ අය කැමැති වුණේ නැහැ. හැබැයි මිනිස්සු මේක රහසක් හැටියට තියාගෙන ඊයෙත් පෙරේදත් කෙලින්ම රජයට තමයි චෝදනා කළේ.මේ අය පිළිබඳ සොයා බැලුවෙ නැත කියල.ඒකෙ ප්‍රතිඵලයක් හැටියට සභාපතිතුමා ඊයේ එම ස්ථානයට ගියා, එවිට වටේම හිටපු අය වටවුනා. අපිට කන්නත් නැහැ. අපි ගැන සොයා බලන්න කෙනෙකුත් නැහැ.අපට මොනවත් නැහැ. කෙලින්ම ග්‍රාම නිලධාරීවරයාට චෝදනා කළා. ඒ අවස්ථාවේදී කොට්ඨාසෙ මන්ත්‍රීවරය හැටියට,සභාපතිතුමා දේශපාලන පලපුරුද්දක් තියෙන කෙනෙක් හැටියට,මම අඳුන ගත්තෙ අවුරුදු තිහ හතළිහක් දේශපාලනේ ඉඳලා, ගාල්ලේ ලොකු ඉස්කෝලක ගිහිල්ලා ඉගෙන ගත්ත පුද්ගලයෙක් හැටියට, ඔබතුමාට බුද්ධිමත්ව තීරණයක් ගන්න තිබුණා. මෙතන ඉන්නව මේ කොට්ඨාසෙ මන්ත්‍රීවරයෙක් මන්ත්‍රීවරය හමුවෙලා පොඩ්ඩක් මන්ත්‍රීතුමා මොකක්ද මෙතන තියන තත්වය කියල අහන්න තිබුණා. නමුත් සභාපතිතුමා ඒ පිළිබඳව ඇහුවෙ නැහැ. ඒ අවට හිටිය මිනිසුන්ගේ කතා දිහා බලලා ආවේගශීලීව අරෙහෙට මෙහෙට දුරකථනයෙන් කතා කරලා එක එක කතා කිව්වා. මම ඇත්තටම කණගාටු වෙනවා එතනදී සභාපතිතුමාට යුතුකමක්

තිබුණා. මොන පක්ෂයේ වුණත් කොට්ඨාස මන්ත්‍රී තුමත් එක්ක අදහස් දක්වන්න.ඇත්තටම අපි කැමති නැහැ අපේ ආණ්ඩුව අපහසුතාවයට පත් වෙනවාට. මොකද ඔය වගේ සිද්දීන් වලදී අපි ගමේ මිනිස්සුත් එක්ක ඉන්න මිනිස්සු. දුකේදි සැපේදි ඉන්න මිනිස්සු. අපට අපේ ගෙවල් වල ඉන්න බිරින්දෑවරුන්ගෙන් දරුවන්ගෙන් තියෙන ඒ ප්‍රශ්නත් මග ඇරලා සමාජයේ කටයුතු වලට දැඩි කැපකිරීමක් කරනවා. එහෙම කරනකොට අපි අපහසුතාවයට පත් වෙනවා නම්, රජයේ නිලධාරීන් අපහසුතාවයට පත් වෙනවා නම්, අපි ඒ වෙනුවෙන් පෙනී සිටින්න ඕන. ඒක තමයි සිද්ධ වුණේ. ඇත්ත අපි දෙන්නම ඉක්මන් වුණා වැඩියි. අපි මේ මිනිස්සුන්ට සාධාරණයක් කළා. මේ මිනිස්සු ඒ අවශ්‍ය වෙලාවට ඒ ගොල්ල කැමැත්ත ප්‍රකාශ කළා නම් අද ඔය වගේ අඬා වැලපෙන්න ඕන නැහැ. පාරවල්වල ඉන්න ඕන නැහැ. පැහැදිලි රජයක් හැටියට රජයේ යුතුකම ඉටු කරලා තියෙනවා ඒ අයට. හැබැයි ඉතින් අද ඒ අයට අසාධාරණයක් සිදු වෙලා තියෙනවා. ඒ අය ඉල්ලන බිම් කැබැල්ල දැනට මේ වෙලාවේ හල් අත්තෙ ඇල ලඟ තියෙන තල්ගස්වල කොටසේ තියෙන බිම් කොටස NBRO එකෙන් පදංචියට නුසුදුසුයි කියලා වාතර්ාවක් දීපු නිසා තමයි ඒ අයට එතනින් ලබා දෙන්න බැරි වුනේ. දෙන්න පුළුවන්කමක් තිබුනානම් ප්‍රාදේශීය ලේකම් තුමියත් දේශපාලන අධිකාරියත් ඒ අවස්ථාව ලබා දෙනවා. කෙලින්ම දැඩිසේ කියාසිටියා මේ NBRO වාතර්ාව නිසා මේ ස්ථානයෙන් මේ අයට ඉඩක් ලබාදෙන්න බැරිය කියලා. ඒ බැරි තැන තමයි මේ අයට ලක්ෂ 16 ක මුදලක් දීලා තමන්ට කැමති තැනකින් නිවසක් හදා ගන්න ඒ අවස්ථාව ලබා දුන්නේ. මේවා ඔබතුමාලට ප්‍රාදේශීය ලේකම් ගෙන් දැනගන්න පුළුවන්. ඒක තමයි ඇත්ත කතාව ආණ්ඩුවක් හැටියට අහක බලන්නේ නැහැ. මේ වගේ දීඝර්කාලීනව විපත් සිදු වෙන්න තියෙන ස්ථාන වලට ප්‍රතිකමර් යොදලා තියෙනවා. ඉතින් මම හිතනවා සභාපතිතුමනි ඒ පිළිබඳව අර මම මුලින් කිව්වා වගේ කණගාටුවෙනවා. ඔබතුමාට යුතුකමක් තිබුනා. කොට්ඨාස නියෝජිතයා හැටියට තමන්ගෙ මන්ත්‍රීවරයෙක් ඉන්නකොට ඔහුත් සමග සාකච්ඡා කරන්න. කෑමබීම දෙන්න සියලු කටයුතු සූදානම් කරල තිබුණා. මේවා අපට එහෙම කරන්න බැහැ පහුගිය ආණ්ඩුවේ දේවල් වගේ. මේකට යම් නිණර්ායක තියෙනවා. යම් යම් අයගේ නිදෙර්ශ තියෙනවා. ගාලු දිස්ත්‍රික්කයේ සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගේ රැස්වීමක් තිබුණ.ඒ රැස්වීමෙන් පස්සේ තමයි මේ අයට වියළි සලාක දෙන්න ඕන. ඉන්න හිටින්න නිවසක් සඳහා රුපියල් 7,500 ක මුදලක් වෙන්කරලා නිවසක් සොයා දෙන්න ඕන. කියල ඒ සාකච්ඡාවෙන් පස්සේ තමයි තීන්දු වුනේ. එතකන් අපට තීන්දුවක් තීරණයක් ගන්න බැරි වුණා. හැබැයි අපි ඊට කලින් ඒ නිවෙස්වල අයගෙන් කෑම ඕනද කියලා ඇහුවා. අපි අපේ පෞද්ගලික සහයෝගයෙන් ග්‍රාම නිලධාරීත් සමග, නමුත් ඒ නිවාස දෙකේම අය ඒ නිවාස වල පදිංචි වෙලා නෙවෙයි හිටියේ. එක නිවසක අම්මයි තාත්තයි හිටිය තමන්ගෙ දුවගෙ ගෙදර. අනිත් නිවසේ වැඩිහිටි දෙපලක් හිටියේ ඒ අය හිටියේ මූලන ප්‍රදේශයේ මහගෙදර. මේ අය ඒව බලාපොරොත්තු වුණේ නැහැ. හැබැයි ඒ අය අඬා වැලපෙමින් අන්තිමේදී මාධ්‍ය ඉස්සරහදි කිව්වා අපට කන්නත් නැහැ. අපි ගැන හෙව්වෙත් නැහැ කියලා. ඒක ඇත්තටම වැරදියි එහෙම කියනවා නම්, ඒ අයට දෙන්න පුළුවන් උපරිම සහන අපි ලබාදීලා තියෙනවා. ඒ සිදුවීම සිදු වුණු වෙලාවේ ඉඳලා මේ වෙනකම් අපි ඒ අය පිළිබඳ සොයා බලනවා. මම හිතන්නේ සභාපතිතුමා ඒක නිවැරදිව තේරුම් ගත්තෙ නැති නිසා තමයි අර වගේ අවස්ථාවක් උදා වුණේ. ඒ පිළිබඳ මම තව බොහෝ දේ කතා කරන්න යන්නේ නැහැ. බොහෝ දේ කියන්න තියෙනවා. නමුත් අපි මහජන නියෝජිතයෝ හැටියට මනුස්සයෙකුට යම් අසාධාරණයක් කරදරයක් වුනා නම්, අපි පෙනී සිටිනවා. ඔබතුමාලා ඒ බව දන්නවා ඇති. මම තවත් දුරදිග කතාකරන්නේ නැහැ. ඒ වගේම ගරු සභාපතිතුමා මෙතනදි කිහිප දෙනෙක් කතා කළා වගේ අපට සුළු වෂර්ා තත්වයක් තුලත් දැඩි වෂර්ා තත්වයක් තුලත් අපේ ප්‍රදේශයේ නන්දන මන්ත්‍රීතුමන් කිව්ව වගේ, අද කණ්ඩි ගිහිපු නායයෑම් වලට ලක් වුනු, ඒ සියලු ස්ථාන දිහා බැලූ විට තමන් විසින්ම කර ගනිපු දේවල් වල ප්‍රතිඵල තමයි අද භුක්ති විඳින්නේ. මොකද අඩි 20 , 25, 30 උසට මහා පස් කණ්ඩි ඇදලා තියෙනවා. ඒ පල්ලමේ නිවාස හදාගෙන ඉන්නවා. දැඩි වෂර්ාවක් ඇති වුනු විට අර කණ්ඩි බුරුල් වෙලා ගෙවල් යටකරගෙන යනවා. මේ වන විට රජය

හැටියට අදාල ආයතන වල,අපේ ප්‍රාදේශීය සභාවෙන් ඒ වගේ ස්ථානවල නිවාස හදන්න අවසර දෙන්නේ නැහැ. අද මම මේ සභාවෙ කියනවා යම් කෙනෙක් අපේ පළාතේ ගෙයක් හදනවා නම්, ඒ නිවෙස සඳහා අනිවාර්යයෙන්ම ප්‍රාදේශීය සභාවෙන් අවසර ගත යුතුයි කියලා. ඒ වගේම ගෙපලක් කපනවා නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ගත යුතුයි. එහෙම නැති උනොත් මේ වගේ තත්ත්වයන් ඉදිරියේදී අපට වැඩි වැඩියෙන් උදාවේවි. මම දන්නවා සභාවේ නිනර්ායක අනුව ඔය වගේ විශාල ගෙපල් කපන්න දෙන්නේ නැහැ. ඒ ඉඩම තියෙන විදියට තට්ටු ක්‍රමයට තමයි නිවාස හදන්න අනුමැතිය ලබා දෙන්නේ. ඒ වගේ ක්‍රමවේදයන් අපේ කොට්ඨාසවල ග්‍රාම සේවා වසම් තුළින් දැනුවත් කරලා අපේ අලුතින් නිවාස හදන අයගේ ඒ නිණර්ායක අනුව නිවාස හදන්න සැලැස්මක් සකස් විය යුතුයි. ඒක නිසා මම ඒ බවත් සිහිපත් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි අර මුලින් මම කියාගෙන ආව වගේ මේ ඒ ප්‍රතිඵල ම තමයි අද සුළු වෂර්ා තත්ත්වයයක්, සාමාන්‍ය වෂර්ා තත්වයක් ආවත් අපේ පාරවල්වල ගමන් කරන්න බැහැ. මොකද පාර අයිනෙ තියෙන හැම ගෙදරකටම යන පාරවල් වලට බොක්කු දාලා තියෙන්නේ සුළු ප්‍රමාණයෙන් අනිත් තැන්වල පාර ගොඩකරලා කානුව වහලා තමන්ගේ ගෙදරට යනපාර හදාගෙන තියෙනවා. මේක මෙතනදි සඳහන් කලා වගේම  සභාවේ වගකීමක් ඒ අයට නීතිය මගින් හරි ක්‍රියාදාමයක් ගත යුතුයි. නැත්නම් ඉදිරියටත් අවදානම් තත්වයක් එනවා. සියලු මාගර් කානු පද්ධතිය අවහිර වෙලා ඒ නිසා සුලු වෂර්ා තත්ත්වයක් තුළ වුවත් පාරේ ගමන් කළ නොහැකි තත්ත්වයක් අද අපේ ප්‍රදේශවල ප්‍රධාන මාගර්වලත් අතුරු මාගර් වලත් තිබෙනවා කියලා සඳහන් කරන්න ඕන.

ඒ වගේම ගරු සභාපතිතුමනි තව එක ඉල්ලීමක් කරනවා පරණතානායම්ගොඩ ගල්වාන අරුක් ගොමුව මාගර්යේ ගමගොඩ යාවන මාගර්ය අපේ ප්‍රාදේශීය සභාවට අයිති පාරක්. මේ වන විට ඒ මාගර්ය සකස් කරන්න රජයෙන් යම් මුදලක් ලැබිලා තියෙනවා. නමුත් සකස් කරන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙනවා. ගමගොඩ ආසන්නයේ මාගර්ය සභාවේ පාරක් වුනත් මේ වෙලාවේ වල් බිහිවෙලා තියෙනවා. මේ මාගර්ය සංවධර්නය කරීම සඳහා මේ මාගර්ය පෙන්නුම් කරල දෙන්න. ගල්වාන අරුක් ගොමුව උඩුගම මාගර්යේ ඒ  ප්‍රදේශයේ අයට උඩුගමට යා හැකි කෙටිම මාගර්ය ලෙසට ගමගොඩ හරහා තිබෙන මාගර්ය සඳහන් කරන්න පුළුවන්. ඒ නිසා මේ මාගර්ය අපේ කාමරීක නිලධාරීන් යොදවා, සභාවේ කම්කරුවන් යොදවා මේ මාගර්ය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඉතිරි වැඩ වැඩිදුර සංවධර්නය කරන්න අපි මධ්‍යම රජයේ අරමුදලින් බලාපොරොත්තු වෙනවා. සභාවට අයිති පාර සභාව මගින් පෙන්වා දුන්නට පස්සෙ සභාවේ අයිතිය අපි ලබාගත යුතුයි.මොකද මේ වල් බිහිවෙලා තියෙන නිසා. ඒ වගේම ගල්වාන පන්සල ළඟ ඉඳලා කිරි ගහවත්ත දක්වා තියෙන මාගර්යත් සබාවේ මාගර්යක් මේකත් අද අඩිපාරක් හැටියට තමයි තියෙන්නේ. ගරු සභාපතිතුමනි මේ සඳහාත් මුදලක් ලැබිලා තියෙනවා සංවධර්නය කරන්න. සභාවට අයිති පාරක් වුනත් මේ වෙනකොට අඩි දෙකකට තුනකට වගේ නිමර්ාණය වෙලා තියෙන්නේ. මම දන්නේ නැහැ මේ සභාවේ පාරේ පළල කොපමණ තියෙනවද කියල. මේක පැරණි මාගර්යක් පරණතානායම්ගොඩ ගල්වාන කිරිගහවත්ත මාගර්ය. අපේ සභාවේ ලිපිලේඛන වල ඇති සභාව වෙන්කරලා තියෙන ප්‍රමාණය. ඒ අනුව අපට සභාවේ කාමරීක නිලධාරීන් යොදවලා පාර පෙන්වා දෙන්න. ඉදිරි සංවධර්න කටයුතු කරන්න මුදල් ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට මේ වන විට ලැබිලා තියෙනවා. ඉතින් ඒ කටයුතුත් ඉටු කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා. ඉතින් ඒ ගැන සඳහන් කරමින් මම වැඩිදුර කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද අද කාලගුණික විපයර්ාස තුලින් නැවතත් ගංවතුර තත්වයක් උදාවෙමින් පවතින නිසා.අපි අපේ අදාළම කරුණු කාරණා පමණක් සඳහන් කරමින්, මම කියපු කරුණු කාරණා ඉටු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ කතාව අවසන් කරනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මන්ඩලයෙන්, ලේකම්තුමිය ඇතුළු තිදෙනාගෙන් අවසරයි.මේ වෙලාවේ අපේ වනමල් මන්ත්‍රීතුමා ඊයේ සිදුවීම ගැන ප්‍රකාශයක් සිදුකළා. ගරු සභාපතිතුමා සමග වනමල් මන්ත්‍රීතුමා සිදුකළ ප්‍රකාශය මම මේ වෙලාවෙ සම්පූණර්යෙන් ප්‍රතික්ෂේප කරනවා. මොකද ඒ වෙලාවේ මම එම ස්ථානය සිටියා. පැහැදිලිව සඳහන් කරන්න ඕන. මොකද සභාපතිතුමාත් එක්ක මම ඒ අවස්ථාවේදී සංචාරයට සම්බන්ධ වුණා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ අපහසුතාවයට පත් වුණු සියලු දෙනා සොයා බලන්න. සභාපතිතුමා සමඟ ඊයේ දවස පුරා ප්‍රාදේශීය සභාව පුරාම ඇවිද්දා. ඒ වෙලාවේ සභාපතිතුමා තුමා ගරු මන්ත්‍රීතුමාව නොසලකා හැරියෙ නැහැ. ඔහොම දෙයක් සිදු නොවුනත් මම අද කතා කරන්න හිටියේ. එතුමා ඉස්සර වෙලා ඇවිල්ලා මාත් එක්ක කතා කළේ. අහිංසක මිනිස්සුන්ගෙන් ඡන්දය අරගෙන තමුසෙලා මිනිස්සු අමාරුවේ දානවා කියලා. මිනිස්සු අතරෙදි මාවත් සැහෙන අපසු තාවයට පත් කළා.ඒ නිසා මේ වෙලාවේදි මන්ත්‍රීවරයෙක් හැටියට අපි සියලූ දෙනාට ආත්ම අභිමානයක් තියෙනවා. ගරු සභාපතිවරය හැටියට එතනට එවෙලෙ සම්බන්ද වුනේ ප්‍රදේශයේ පළවෙනි පුරවැසියා විදියට. මෙතුමා තමයි බොහොම පහත් අන්දමින්, සභාපතිවරයෙකු ට කතා කලයුතු උචිත අන්දමින් නෙවෙයි කතා කළේ. මම මගේ ෆෝන් එකේ ඒ වෙලාවේ සම්පූණර්යෙන් සටහන් කර ගත්තා. මම සියලුම දෙනාටම සඳහන් කරනව. අපි මතක තබා ගත යුතුයි. පාට පක්ෂ මොනදේ උනත් නාගොඩ ප්‍රාදේශීය සභාවෙ සභාපතිවරයා පළවෙනි පුරවැසියා. එතුමන්ට මේ කොට්ඨාස 15 වේ ඕන තැනක ගිහිල්ලා ඕන රාජකාරියක් කිරීමේ හැකියාව තියෙනවා. ඉතින් ඒක නිසා මම මේ වෙලාවේ අපේ වන මන්ත්‍රීතුමා හැසිරුන විදිහ තරයේ ප්‍රතික්ෂේප කරනවා. එමෙන්ම තුමන් කරපු සියලූ ප්‍රකාශ පට්ටපල් බොරුය කියලත් කියනවා. ඒක නිසා අපි සියලු නියෝජිතයන් මේ අවස්ථාවේ වගකීමකින් වැඩ කරන්න ඕන. අපි මොන ලකුණින් ඡන්දය අරගෙන මෙතනට ආවාත්, මෙතන ජ්‍යොෂ්ඨ මන්ත්‍රීවරු ඉන්නවා එතුමන්ලා කවදාවත් එහෙම හැසිරෙනවා අපි දැකලා නැහැ. මට එතුමත් එක්ක පෞද්ගලික තරහක් නැහැ.එතුම ඒ කරපු ප්‍රකාශය පිලි අරගත්තා. ඒ පිළිබඳවත් අපි සිහිපත් කරමින් මම මේක කිව යුතුයි. මම මේ අවස්ථාවේ සභාපතිතුමාත් එක්ක හිටියා.ඇත්ත තත්වය ඒක නෙවෙයි. ඊට වඩා වැඩි දෙයක් එතන සිදු වුණා. මෙතුමන් අපි දැක්ක ගමන් කුපිත වෙලා හතර වටේ දුවන්න පටන් ගත්තා. ඒ ඇයි කියලා මම දන්නේ නැහැ.

අපේ උඩවැලිවිටියෙ හකුරුගොඩ ප්‍රදේශයේ මේවනවිටත් දෙන්නෙක් තුන්දෙනෙක් ගිලෙන ප්‍රමාණයට වතුර තියෙනවා. උඩවැලිවිටිය ප්‍රධාන මාගර්යේ එක් අවස්ථාවක අර ඉනෝකා මන්ත්‍රීතුමිය සභාවෙ ප්‍රකාශ කළා. ඒ ස්ථානය ගොඩ කරලා දෙන්න කියලා. ඒක නිසා ප්‍රධාන පාරේ වලක් වගේ ස්ථානයක් තියෙනවා.ඒ ස්ථානයේ එගොඩ මෙගොඩ උඩවැලිවිටිය සහ බද්දේගමට යන්න තියෙන මාගර්ය. මීට වඩා පොඩි වැස්සක් වැස්සත් යටවෙනවා. ඒ නිසා ඒ ප්‍රධාන මාගර්ය, අපි අවධාරණය කරනවා.ගරු සභාපතිතුමනි ආපදා කළමනා කරණයෙන් එනවනම් ඒ ස්ථානයත් පෙන්නලා එකටත් පිලියමක් යොදාගමු කියන ඉල්ලීම කරනවා. ඒ වගේම උඩවැලිවිටිය අපේ ගම්මැද්දේගොඩ මාගර්යක් දැනට කොන්ක්‍රීට් කළත් නිතරම වතුරට අහුවෙලා දැනට කොන්ක්‍රීට් නොකරපු හරිය යාමට අපහසු මඩ වගුරක් බවට පත් වෙලා තියෙනවා. ඒ වගේම සෝදාපාළුවට ලක්වෙලා තියෙනවා. උඩවැලිවිටිය තලාව ගල්ලෙන මුල්ල මාගර්ය දොල පාර ගිහිල්ලා සම්පූණර් විනාශයට පත්වෙලා තියෙනවා. ඒ සඳහා ආපදා කළමණා කරනයෙන් එනවනම් ඒ මාගර්යත් පෙන්නලා. ඒ කටයුතු ටිකක් සිද්ධ කරන්න කියන ඉල්ලීමත් මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම සමස්තයක් ලෙස අපි කවුරුත් අසරණ වෙච්ච වෙලාවක් තමයි මේ ගංවතුරක් ගැලුවට පස්සෙ මට විතරක් නෙවෙයි අපේ ධමර්සිරි මන්ත්‍රීතුමාට ගයාන් මන්ත්‍රීතුමාට සුභාෂි මන්ත්‍රීතුමියට ඒ වගේ මේ හැම මන්ත්‍රී කෙනෙකුට ම ගමන් කිරීමේ අපහසුවක් තියෙනවා. කොට්ඨාසවලින් හදිසියේ ආධාරයක් දෙන්න නැතත් මිනිසුන්ගේ දුක සැප හරි සොයන බලන්න යන්න ඒ අයට උදව්වක් කරන්න අපට දැඩි අවශ්‍යතාවයක් තියෙනවා බෝට්ටුවක. කොට්ඨාසයකට බෝට්ටුවක් හරි නැතිනම් යටවෙන කොට්ඨාස වලට බෝට්ටුවක් ජීවිතාරක්ෂක කට්ටලයක් දෙනවා නම් හොඳයි. විශේෂයෙන්ම ඔබතුමාල ආපදා රැස්වීමක්

පැවැත්වෙන අවස්ථාවක දැඩිව මේ අවශ්‍යතාවය පෙන්නලා මේ නාගොඩ ඉතාම ඉක්මනින් යටවෙන කොට්ඨාස වලට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ මන්ත්‍රීවරුන්ට ඒ සඳහා සහන සලසන්න. විශේෂයෙන් මේ ගමන් කිරීමට පාරුවක් හරි ජීවිතාරක්ෂක කට්ටලයක් හරි ලබාදෙන්න. නැත්නම් වතුර ගලලා බැහැල ගියාට පස්සේ තමයි ඒ මිනිස්සු ඉන්න තැනට අපට යාමට හැකියාව ලැබෙන්නේ. ඒ නිසා මේක බරපතළ ප්‍රශ්නයක් වෙලා තියෙනවා. එ නිසා ආපදා කලමනාකරන අමාත්‍යාංශය ඒ වගේම දිස්ත්‍රික් ලේකම් කායර්ාලය සමඟ සාකච්ඡා කරලා. අඩු තරමින් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා සමග හරි සාකච්ඡා කරලා. ඉතා ඉක්මනින් අපට ලබාගත යුතු දේ තමයි ජීවිතාරක්ෂක කට්ටලයක් සහ බෝට්ටුවක් නැතිනම් පාරුවක්. මම නැවතත් ඒ ගැන සඳහන් කරනවා මේ වෙලාවෙදි.

ඉතිං මේ වෙලාවෙදි අපි සතුටු වෙනවා. චන්දිමා දිල්රුක්ෂි මන්ත්‍රී තුමියගේ ආදරණීය දියණිය ශිෂ්‍යාත්ව විභාගය ඉහලින් සමත් වෙලා තියෙනවා. දරුවටත් අපි අධ්‍යාපන කටයුතු සාථර්ක වෙන්න කියලා සුබ පතනවා. අපේ වනමල් මන්ත්‍රීතුමාගේ යම් හිත් අමනාපයක් ඇති වුනා නම් ඒකටත් මේ අවස්ථාවේ සමාව භජනය කරමින් මම ඒ අවස්ථාවේ සිදුවුන සිදුවීම තමයි ගරු සභාපතිතුමා වෙනුවෙන් මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටියෙ. ඒවගේම අපේ ප්‍රාදේශීය සභාවේ අනගි කායර්යක් ඉටුකරන අපේ අවන්ත මහත්මයාගේ ආදරණීය පුත්‍රරත්නයත් ශිෂ්‍යාත්ව විභාගයෙන් ඉහළින් සමත් වෙලා තියෙනවා.ඔහුගේ පුතාටත් අධ්‍යාපන කටයුතු සාථර්ක වෙන්න කියලා අපි ආශිවර්ාද කරනවා. මේ වෙලාවෙදි මම දන්න අය පිළිබඳවයි සඳහන් කළේ. මම නැවතත් ඉල්ලීමක් කරනවා. අපේ ආපදාවන්ට ලක්වෙච්ච මාගර්යන් සකස් කර ගැනීම සඳහා අවට තියෙන ප්‍රාදේශීය සභා වලින් හරි සහයෝගය අරගෙන ඒ කටයුතු සිදු කරන්නේ කියන ගෞරවනීය ඉල්ලීම මේ අවස්ථාවේ සිදු කරමින් ඒ වගේම තව පොඩි ඉල්ලීමක් කරනවා. අපේ මන්ත්‍රීතුමිය සඳහන් කළා වගේ අපි කමර්ාන්ත කිහිපයක් කරන්න සියල්ල සූදානම් කර තිබියදී අයහපත් කාලගුණය නිසා කරගන්න බැරි වුණා. ඒ කටයුතු අවසාන වුණාට පසු ඊළඟ සභාවාරය එන්නට කලින් ගෙවීම් කටයුතු සිදුකරන හැටියටත් ඉල්ලීමක් කරනවා. තාක්ෂණ නිලධාරි මහත්මයාගේ අධීක්ෂණය යටතේ සියලු කටයුතු සිදු සිදුකරන්නෙ ඒ නිසා එසේ ඉල්ලමින් සියලු දෙනාට සුබ අනාගතයක් පතමි මම නිහඬ වෙනවා බොහොම ස්තුතියි

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අයහපත් කාලගුණය නිසා අපට වුවමනා ප්‍රශ්න විතරයි මම කතා කරන්නේ. ඒ වගේම අපි ඕනම දෙයක් යථාවාදීව සිතන්න ඕන. ඒක අපට මේ කතාවලදිත් තේරුම් ගියා. ඒ වගේම තමයි අපේ බල ප්‍රදේශයේ කුඹුරුහේන කොටසේ ගෙවල් 31 ක් ආපදාවට ලක් වෙලා තියනවා. මේ ගෙවල් 31 ආපදාවට ලක් වෙලා තියෙන්නේ ගල් පෙරලිලා. දියවර ගම්මානයේ ගෙවල් 15 ක් පස්කඳු ඇවිල්ලා ගෙවල්වල දොරවල් කැඩිලා තියෙනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපට දැන් පාරක් නැති තත්වයට පත් වෙලා තියෙනවා. මාරකන්ද පොද්දිවලට යන මාගර්යේ අක්කරයක පමණ විශාල ප්‍රමාණයක පස්කන්දක් ඇවිල්ල තියනවා. RD එකෙනුත් ගිහින් බැලුවා. ඒ අය කියන්නේ වියදම් කරන්න මුදල් නැහැ කියලා. ඒ ගැන ආපදා කළමනාකරණ ආයතනයට දැනුම් දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ඒ ප්‍රදේශයේ විදුලිය නැති ගෙවල් 11 ක් විතර තියෙනවා ඒ ගෙවල් වලටත් ඉතා ඉක්මනින් විදුලිය ලබා දෙන්න කියලා මම ඉල්ලනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම යෝජනාවක් ගෙනාවා. නාගොඩ ඉදල බැලුවහම කුඹුරුහේන නාවින්න ගොරකගස්තුඩුව පැත්තට යන්න බැහැ. වතුර ගැලුවයින් පස්සේ අපි කොටු වෙනවා. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ විධිමත් බෝට්ටුවක් හරි පාරුවක් හරි ලබාදෙන්න. ඒ වගේම තමයි පැය24 ජැකට් එකක් හරි ඉතා ඉක්මනින් ලබා දෙන්න. ඒ වගේම මම නාගොඩ පොලිසියට ස්තුතිය පුදකරන්න ඕන. අපි යටලමත්ත ප්‍රදේශයට කෑම පාසර්ල් 150ක්, මාපලගම 150ක් වගේ ලබා දුන්නා. එහිදී අපට යන්න බෝට්ටුවක් නැහැ. අන්න ඒ වගේ කරදර වලට මුහුණ පානවා. මේ සභාවේ දෙවෙනි වාරෙදි මේ වතුර ගලන්නත් ඉස්සෙල්ලා මම යෝජනාවක් ගෙනාවා. ඇත්තටම තවමත් සිදු වුනේ නැහැ. ඒ වගේම ගරු සභාපතිතුමනි, අලුත්වත්ත මාගර්යේ අවහිර වීමක් තියෙනවා. සේනපාල මහත්මයා කියලා මහත්මයෙක් මාත් එක්කම ඇවිත් කාණුවක් සම්බන්ධ පැමිණිල්ලක් ගෙනාවා.ඒකට කිසිම ක්‍රියාමාගර්යක් අරගෙන නැහැ. ඒ සම්බන්ධව මම තාක්ෂණ නිලධාරී මහත්තයත් දැනුවත් කළා. ඒත් නැහැ අන්න ඒ ටික කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපි සියලු දෙනාට ම උවමනා දැනටත් ඕන කරන දේ තමයි තෙල් සහ ගෑස්. මිල ඉහළ යාම ඒ ගැන මම යෝජනාවක් ගෙනාවා. මේකෙ විතරක් නෙවෙයි. ඒ යෝජනාව මුළු පලාත් සභා සියල්ලෙත්, ප්‍රාදේශීය සභාවලත් ගේන්න පුළුවන්. නමුත් ඒ යෝජනාව මෙතනට වැටුණේ නැහැ. පාලර්මේන්තු මන්ත්‍රීවරුවත් මේ මිල සූත්‍රය කියන්නේ මොකක්ද කියලා දන්නෙ නැහැ. අන්න ඒ වගේ තත්වයක් තියෙන්නේ. ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම සූකිරි මහත්මයගෙ ගෙදර ලගින් බහින තොටුපල මේ විසිපස් වෙනි දින අපි අළුත් වැඩියා කිරීමට හා ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ දවස් වෙනකොට මම හිතන්නේ වතුර බහීවි. අපට ඒකට තණකොළ කපන මැෂින් දෙක ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි සභාපතිතුමනි, තල්ගස්වල පොලේ ප්‍රශ්නය අපි ගිය සතියෙත් ගිහින් බැලුවා. එළවළු ටික දාල තියෙන්නෙ පොදු වැසිකිළියේ තමයි. ඒ අවස්ථාවේදී සිරසෙන් ඇවිත් වීඩියෝ කරගෙන ගියා. අපි දෙපාරක් කියලා බොහොම අමාරුවෙන් නවත්වා ගත්තා. මේ සැරේ නම් විඩියෝ එක අරගෙන ගියා. මම හිතන්නේ වීඩියෝ එක දාවි. මේ ගැන සභාවටත් කතා කරලා කියලා තිබුනා. නමුත් කිසිම පියවරක් ගත්තේ නැහැ. ඒ වගේම මෙතුමිය අර ෆොටෝ ගහල ගෙනත් පෙන්නුව අර කුණු කසල ඇත්තටම ඒව තියනවා. එහා පැත්තෙන් දොරුවක් තියෙනවා. එතනින් කබරු,හරක් වගේ සත්තු ඇවිල්ලා මාළු ලෑලි උඩ ලගිනවා. ඒව තමයි අපි ආහාරයට ගන්නේ. මම එදත් ගිහින් බැලුවා. පොළ හදනව කිව්වට කිසිම පිළිවෙළක් නැහැ. ඒ වගේම ආරක්ෂිත වැට කිසිම පිළිවෙලක් නැහැ. අන්න ඒ වගේ තත්ත්වයක් තමයි තියෙන්නේ. ඒවා ඉක්මනින්ම ප්‍රතිසංස්කරණය කරලා දෙන්න ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, ගංවතුර උවදුර නිසා හානියට පත්වුන නිවාස ගොඩක් තියෙනවා. ඒ ගැන අපි සොයා බලන්න ඕන. ඒවා සොයා බලලා ඉදිරියට කටයුතු කරමු කියා යෝජනා කරමින් සියලු දෙනාටම සුබ දවසක් වේවායි ප්‍රාථර්නා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රි මන්ඩලයෙන් අවසරයි. ඒ වගේම තමයි මගේ කොට්ඨාසයේ අංක 218 බටහිර කොටස ඉස්සෙල්ලම ගංවතුරෙන් යට වෙනවා. ඒ සම්බන්ධයෙන් මම මහජන නියෝජිතවරයා වශයෙන් නිරන්තරයෙන්ම ජනතාවත් එක්ක බද්ධ වෙලා ඒ අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න උත්සාහයක නියැලෙනවා. ඒ වගේම පස් කඳු ගොඩක් කඩාගෙන ගිහිල්ලා තියෙනවා. ගෙවල් ඇතුලෙන් වතුර ඇවිල්ලා තියෙනවා. තරංග සුදශර්න මන්ත්‍රීතුමාත්

බලන්න ගිහිල්ල තියෙනවා. අපි හිතන්නෙවත් නැති විදියට කන්ද උඩ තියෙන වතුර ටික ගේ ඇතුලෙන් ඇවිත් ගේ යට වෙලා තියෙනවා. ඉතින් ඒ වගේ ආපදා අවස්ථාවලදී අවශ්‍ය තැන් නියෝජනය කරන්න මම කොට්ඨාසයේ වගකියන මන්ත්‍රීවරයෙක් හැටියට අපටත් අවස්ථාවක් ලබා දෙන්න කියන ආයාචනය මම ඔබතුමාගෙන් කරනවා. මොකද ඔබතුමාට මේ සමස්ත 27 දෙනාගෙම ප්‍රශ්න ටික කියන්න තරම් ඔබතුමා දැනුවත් නැහැ. ඒක දන්නෙ කොට්ඨාස මන්ත්‍රීවරයා. ඉතින් ඒ නිසා මම කියන්නේ අපිව නියෝජනය කරන්න, නියාමනය කරන තැනට අපිව ගිහිල්ලා දාලා අපෙනුත් අදහස් අරගෙන ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න ටික ගෙනියන්න පුළුවන් තැනකට ඔබතුමා අපිව මෙහෙයවන්නෙ කියලා මම බොහොම ආදරයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, පසුගිය දින කීපයේම උඩුගම පොළ හදන්න කම්කරුවෝ ඇවිල්ලා හිටියා. ඉතින් මේ සම්බන්ධයෙන් සැහෙන වගකීමෙන් කටයුතු කරන මම හොඳින්ම දන්නවා. මොකද හේතුව නිරන්තරයෙන්ම ඒ සඳහා කැප වී වැඩ කරනවා. මෙතැනදී ගරු සභාපතිතුමනි අපේ කම්කරුවෝ හත්දෙනෙක් ඉන්නවා. සාමාන්‍යයෙන් වැඩකරන මාසෙක දින 22 සම්පූර්ණයෙන්ම ඕනම නිලධාරියෙක් සහ කම්කරුවෙක් සේවය කරන්න ඕන. සාමාන්‍යයෙන් මාසයකට දින 04 ක් නිවාඩු ගියොත් කම්කරුවෙක් සහ ඕනම සේවකයෙක් දින 18ක් වැඩ කරන්න ඕන. දින 18ක් වැඩකලාම මාසෙට කම්කරු අත්තම් 126 ක් එකතු වෙනවා. මේ සභා කාල පරිච්ඡේදය තුළ මාස හතක් ගිහිල්ලා 126 x 7 වැඩි වුනාම 882 කම්කරු අත්තම් ප්‍රමාණයක් වැය කරලා තියෙනවා. රජය මේවට මුදල් ගෙවලා තියෙනවා. මම අහනවා මේ කම්කරු අත්තම් 882න් මේ සභාවට ගන්න පුළුවන් ඵලදායිතාවය මොකද්ද? මේ අත්තම් 882 කායර්ක්ෂමතාවයක් වුනාද? සභාව බලාපොරොත්තු වන කරුණු කාරණා ඉෂ්ට සිද්ධ වුණාද? කියන එක ගැන ප්‍රශ්නයක් තියෙනවා. ගරු සභාපතිතුමනි මේ කම්කරුවන්ගේ ප්‍රශ්නෙදි එතුමන් කරන කායර්ය භාරය තුළ තමයි අපේ සභාවේ හොඳ නරක දෝලනය වෙන්නේ. ඉතින් ඒ නිසා මෙතැනදී වැඩ පාලක වරයකුගේ අවශ්‍යතාවය තදින්ම තියෙනවා. නැත්නම් මේක අසාථර්ක පාලනයක් සහිත සභාවක් විදියට ඉස්සරහට යන්න වෙන්නේ. ඒක නිසා මම වැඩ පාලකවරයකු අවශ්‍යතාවය මතු කරමින් හැමදාමත් කතා කළා. අදත් කතා කරන්නේ මොකද එක දවසක් ආවා චේන්සෝ එක අරගෙන, චේන් සෝ එක අරගෙන ඇවිල්ලා කියනවා මන්ත්‍රීතුමා, කළු තෙල් නැහැ කියලා. කළු තෙල් ටික අරගෙන එනකොට 2T නැහැයි කියල කිව්වා. ඉතින් මෙන්න මේ වගේ ඊළඟ දවසේ වැඩපිළිවෙළ ගැන පෙර සූදානමක් නැහැ. ඒ කිසිම කෙනෙක් දැනුවත් නැහැ. හෙට වැඩක් කරන්න තියෙනවා නම් අද පෙර සූදානමක් තියෙන්න ඕන. ගරු සභාපතිතුමා අපි ගිහිල්ල වැඩ බැලුවහම මේ සේවකයන් අපට බනිනවා. ඉතින් ඒ වගේ තත්ත්වයකට සභාපතිතුමා අපිව පත් කරන්න එපා. මොකද අපිට පුළුවන් ගිහින් බලන්න විතරයි. අපට වැඩ පවරන්න බැහැ. මොකද අපි වැඩ පාලකයො නෙවෙයි. අපි ගිහිල්ල බලන්නෙ අපේ කොට්ටාසයට ආවම මගේ කොට්ඨාස වැඩ ටික කරගන්න මම ගොඩක් මහන්සි වෙනවා. ඉතින් ඒ මහන්සි වීමේ දී සමහර වෙලාවට වැඩ පාලකවරයාගේ කතර්ව්‍ය මට කරන්න සිදුවෙනවා. අන්න එතකොට ඒ කම්කරුවන් එක්ක තියෙන සම්බන්ධය ගොඩක් ඈත් වෙලා යනවා. ඉතිං අපි වැඩ පාලකවරයෙක් නෙවෙයි අපි මහජන නියෝජිතයෙක් විදියට ඒ ගරුත්වය ආරක්ෂා කරන්න ඔබතුමා වැඩපිළිවෙළක් හදන්න. මම නැවතත් යෝජනා කරන්නේ මේ වැඩ ටික කරගන්න තාවකාලිකව හරි වැඩ පාලකවරයෙක් බඳව ගන්න කියලා. ඒ තුළින් කායර්ක්ෂමතාව ඇති වෙනවා. එවිට සභාව ඵලදායි තත්වයට ගිහිල්ලා සභාව දියුණුවෙලා සභාවේ වැඩ කොටස් ඉතාම වේගයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ නිසා මම හිතනවා හැම දේකටම අවශ්‍යන හොඳ සුදුසු වැඩපිළිවෙළක් ඔබතුමා හදාගන්න කියලා යෝජනා කරනවා.

ඒ වගේම තමයි සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ මගේ ගෙදරට යන පාරෙ හැමදාමත් ලයිට් කණුවක් ගැන කතා කරනවා. ඒ නිසා මම හිතනවා 1987 අංක 15 දරණ ආඥා පනත යටතේ අංක 59 බාධක ඉවත් කිරීම සම්බන්ධව ඔබතුමාට බලය තියෙනවා. විදුලිබල මණ්ඩලය රු. 87000 ක

ඇස්තමේන්තුවක් අපිට ගෙවන්න කියලා එවලා තියෙනවා. මම හිතනවා මාගර් සම්බන්ධයෙන් අපට තියෙන බලතල අනුව ඔබතුමාට ක්‍රියාත්මක වෙලා මිනිසුන්ගේ ජනජීවිතය සහ මාගර් අවදානමකට පත් කිරීම පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයට නඩු පැවරීමට ඔබතුමාට පනත තුලින් බලය පැවරී තියනවා. ඒ අනුව ඉදිරියේදී ඔබතුමා ක්‍රියාත්මක වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒවගේම තමයි ගරු සභාපතිතුමනි, මම විශේෂ සභාවාරයේදී සඳහන් කළා. බාර් හන්දියෙ ධීවර සංස්ථාව තියෙනවා. එය පවරා ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමාට පනත යටතේ හිමිකම් ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලය ක්‍රියාත්මක කිරීමේ බලය අංක 55 යටතේ පනත තුලින් තියෙනවා. එම හිමිකම් ඒ අයට තියෙනවද කියලා ඉදිරිපත් කරලා ඒ අවශ්‍ය කරන ගොඩනැගිල්ල අපට පවරගෙන අපේ බලය යටතේ ක්‍රියාත්මක කරන්න ඔබතුමාට බලය තියෙනවා. මම හිතන්නේ ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු වේවිය කියලා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, පොල් ඉඩම සම්බන්ධව මම කතා කරන්න ඕන. එය ගත්ත විතරයි. පොල් කැඩුව විතරයි. තාම ගෙඩියක්වත් ආවද කියල අපට හොයාගන්න බැරි වුනා. පොහොර ටිකක් දාන්න බැරි වුනා. ඉතින් මම හිතන්නේ අවුරුද්දක කාල සීමාවක අපි රුපියල් 60600.00ක් ගෙවලා ගත්තෙ ලාභයක් ලබා ගන්න ලාබ ලබන්න පුළුවන් විදිහේ වැඩපිළිවෙළක් සකස් කරන්න. එහෙමනම් පොහොර ටිකක් දාලා ගස් ටික නඩත්තු කරලා ඒ වැඩ ටික කරන්න කියලත් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි උඩුගම මොරගල්මුල්ල කොස්ගහහේන පාර සංවර්ධනය කරන්න කියලා මම ඉල්ලල තියෙනවා. මට සභාව හමුවට කියන්න තියෙන්නේ එපමණයි. ඒ නිසා මා කියූ කරුණු ගැන වැඩි අවධානය යොමු කර ඒ සියලූ කටයුතු වඩාත් ඵලදායි ලෙස සභාවේ නියාමනය කරන්න ඔබතුමාට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් ඔබ සැමට ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, ගරු ලේකම්තුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් හා සියලු දෙනාගෙන් අවසරයි. ඇත්තටම යටලමත්ත ප්‍රදේශය ගැන කතා කරනකොට පසුගිය සෙනසුරාදා රාත්‍රී 7ට විතර නොසිතූ විදියට ගංවතුරෙන් අපි ලොකු ආපදාවට ලක් වුණා. ඒ මොකද මෙතෙක් කල් මම හිතන්නේ හැට ගණන් වල වතුර ගැලුවට පස්සේ ලොකුම ගංවතුර තමයි යටලමත්ත ප්‍රදේශයට මේ සිදු වුණේ. එතනදි යටලමත්ත නැගෙනහිර උඩලමත්තට ගොඩක් අලාභහානි සිදු වුණා. බෙම්බඩට 219 ග්‍රාම සේවක වසම බටහිර වසමේ BD5 පැත්තෙත් ලොකු පොඩි අසාධාරණකම් වෙලා තියෙනවා. මාමණදොළ යටලමත්ත හරහා යන ඇල ඒ ඇළේ සම්පූර්ණ හිර වීම් තියෙනවා. ඒ නිසා අපි කොහොමහරි සභාව එකමුතු වෙලා හරි අපේ ප්‍රජාවත් අරගෙන ඇළ ඉවුර සුද්ද කලොත් ගොඩක් දුරට ගංවතුර තර්ජනය වළක්වාගන්න පුළුවන්. නැත්නම් ඉස්සරහට ඔයිට වැඩිය අවදානම් තත්වයක් ඇතිවෙන්න පුළුවන්. ඇත්තටම දැනුත් අවදානම් තත්ත්වයක තමයි අපේ නිවස වුනත් තියෙන්නේ. ඒ නිසා මං හිතන්නේ හැකි ඉක්මනින් ඒක සකස් කරලා දෙන්න. ඇළ ඉවුරෙ වැව්ච්ච උණ ගස් තියෙනවා. ගස් ඇළට වැටිලා තියෙන්නේ ඒ වතුර පාර ආවම කොහේ හරි කණ්ඩියක් කඩා ගෙන වතුර පාර යනවා. ඉක්මනින් ඒක පිළිසකර කරලා දෙන්න වැඩපිළිවෙළක් හදන්න. මම සමිති ස්වේච්ඡා සංවිධාන වලින් සාමාජිකයන් ටිකක් එකතු කර ගන්නම්. ඒ ඇළ ඉවුර අයිනේ ඉන්න අයට කියලා අපට පුළුවන් මේවා කරගන්න. අපට එම අවසරය අරගෙන ඉක්මනින් එක නිම කරල දුන්නොත් ඒ ව්‍යසනයෙන් වැළකෙන්න පුළුවන්. ඒ වගේම අපේ සභාපතිතුමාට ගංවතුර අවස්ථාවෙ මං කතා කරල කච්ච අපි ඉන්න තත්වෙ. ගරු සභාපතිතුමා ඊට පස්සෙන්ද උදේම ආවා. ඇවිල්ලා එතුමා උදේට කෑම වේල හදලා දුන්නා. අපේ උඩලමත්තෙ පාලිත හාමුදුරුවො උඩලමත්තෙ අයට උදේට කෑම හදලා දුන්නා. ඒ වගේම ඒ ගංවතුර තත්වය අඩු වුණාට පස්සේ දවල් ආහාරය මෙතුමා සම්බන්ධ වෙලා උයලා බෙදුවා. රාත්‍රිය ආහාරයක් එහෙමයි. ඇත්තටම ඒ වෙනුවෙන් ස්තූතියක් කරන්න ඕන. ඒවගේම අද වෙනකොටත් ගංවතුර තත්වයක් උදා වෙලා තියෙනවා.අපේ හන්දියෙ අය ආපදා එකට කිව්වහම ඒ

අය කිල තියෙනව දැනට නම් අපට කරන්න දෙයක් නැත කියල. දැන් ප්‍රාදේශීය ලේකම් එකෙන් ගිහින් තියෙන.වා අපේ ආපදා විස්තර ගන්න ඒ තොරතුරු ගන්න ගිය විට ග්‍රාම සේවා නිළධාරීතුමිය පින්තූර දෙකක් ඕන කිව්වා. ගංවතුරෙන් මේ වෙච්ච දේවල් වල හැටියට ඒ අවස්ථාවේ පින්තූර ගන්න තියා මොනවත් කරන්න වෙලාවක් නැහැ. පැය බාගෙන් ඔක්කොම යට වෙලා ඉවර වුනා. රෑ හතේ ඉදන් උදේ 4 වෙනකම් වතුරෙ තමයි හිටියේ. ගේ ඇතුළෙත් වතුර වාඩිවෙන්න වත් විදියක් නැහැ. පුටු පවා යට වෙලා ලොකු කරදරයකට මුහුණ පෑවා. ඒ වගේ දේවල් කරනකොට කොළඹ පැත්තෙන් තීරණ ගන්න කොට පිංතූර ඉල්ලනවා. ප්‍රායෝගිකව කියන්න තියෙන්නෙ පින්තූර ගන්න එක නෙවෙයි. යටවෙච්ච එකට විසඳුමක් දෙන එක ඒ නිසා ඒ ගැන සොයලා බලලා ඒ ගනිපු තීරණය වෙනස් කරලා හරි මිනිස්සුන්ට සාධාරණය ඉෂ්ට කරල දෙන්න කියා ඉල්ලමින් මම නිහඩ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදශර්න මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අපි ඉතාමත් කනගාටුවට පත් වෙනවා පසුගිය වෂර්ාපතනයත් එක්ක අපේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ලොකුම හානිය සිද්ධ වුණා. අර මහා ගංවතුරක් නොවුනට කෙටි කාලයක් ඇතුළත පැයක්, පැය දෙකක් ඇතුළත සිදු වුන හානිය මහා ගංවතුරෙන් සිදු වූ හානියට වඩා විශාලයි කියලා මම හිතනවා. විශේෂයෙන්ම අපි ප්‍රාදේශීය සභාවක් හැටියට අපේ ගරු සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රීවරුන් යටලමත්ත නාගොඩ ප්‍රදේශ වලට විශාල සේවාවක් කරන්න උත්සාහයක් ගත්තා. කවුරුත් බලාපොරොත්තු වන ආකාරයට ප්‍රාදේශීය සභාවේ නිලධාරින්ට සීයට සීයක්ම මේ කටයුත්ත කරන්න හැකියාව ලැබෙන්නේ නැහැ. කොහොම හරි උපරිම උත්සාහය අරගෙන සභාවෙ සේවකයෝ සහ ඒ සියල්ල යොදාගෙන එතුමට මේ සභාව වෙනුවෙන් කරන්න පුළුවන්, ප්‍රාදේශීය සභාවක් තියෙනවා කියලා පෙන්නන්න හරි එතුමට කරන්න පුළුවන් උපරිම කටයුතු කරපු බව අපට ආරංචි වුණා. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම නාගොඩ ප්‍රාදේශීය සභාව කියන්නෙ  බද්දේගම ආසනයක් හිනිදුම ආසනයත් එකතුවෙලා සකස්වුනු ආසනයක් නිසා මේ ප්‍රකාශය මම කරන්න ඕන. මොකද ප්‍රාදේශීය සභාව විදියට මෙවර උඩුගම කොටසට විශාල හානියක් සිදු වුණා. අපේ වෙරංග මන්ත්‍රීතුමා ඇතුළු අපේ උඩුගම නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා ඒ බව දන්නවා. එතුමන්ලා ගිහින් ඒ කටයුතු කළාට අපි ප්‍රාදේශීය සභාවක් විදියට මෙහෙනුත් දෙයක් කරන්න ඕන. සභාපතිතුමා හෝ සභාවේ වාහනයක්වත් මම හිතන්නේ ඒ පැත්තට ගියේ නැහැ.  සභාපතිතුමා මෙහෙන් පත් වෙලා ඉන්නකොට උප සභාපතිතුමා අපේ කොටසෙන් පත්වෙලා ඉන්නවා. අනිත් මන්ත්‍රීවරු ඉන්නවා. ඒ නිසා අඩුම තරමින් ප්‍රාදේශීය සභාවෙන් ඒ කොටස ගැනත් සොයා බලන්න ඕන. ඒ ප්‍රදේශයේත්  අඩුපාඩු හොයලා බලලා දැන් හරි කරන්න ඕන. බදු ගෙවන ජනතාව සහ ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම කටයුත්ත කරන්න අපි උපරිම සහයෝගය ලබා දෙන්නම්.  මේ සඳහා ඔබතුමා වැඩපිළිවෙළක් යොදලා කටයුතු කරන්න කියලා මම මුලින්ම ඉල්ලා සිටිනවා. ප්‍රාදේශීය සභාවට ආපු අපේ මන්ත්‍රීවරු දැන් අපි අලුත් ක්‍රමයකට ඉදිරිපත් වෙලා පක්ෂවලින් ජයග්‍රහණය කරපු සහ පත්කරපු මන්ත්‍රී පිරිසක් ඉන්නේ. මම නියෝජනය කරන පක්ෂය විදියට අපි හත්දෙනෙක් ඉන්නවා. විපක්ෂය විදිහට අපි දොලොස් දෙනෙක් ඉන්නවා. මගේ කොටසෙයි මගේ ග්‍රාම සේවා වසමෙයි කියලා අපට කතා කරන්න හැකියාව ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ එක මන්ත්‍රීවරයා යි. අනෙක් පක්ෂයෙන් තව කෙනයි. අපි හත්දෙනයි. අනිත් පැත්තෙන් තුන්දෙනයි. එහෙම ඉන්න වෙලාවක අපට සමහර වෙලාවට කොට්ඨාස නොවුණට සභාව ගැන කතා කරද්දි අපට නාගොඩ ගැන, උඩුගම ගැන එහෙම නැත්නම් උනන්විටිය ගැන කතා කරන්න වෙයි. මොකද මේ ප්‍රාදේශීය සභාවට අපි කණ්ඩායමක් විදියට මුළු ප්‍රාදේශීය සභාවම නියෝජනය කරන්න අපට සිද්ධ වෙනවා. ඒ නිසා අපි මැතිවරණයට එහෙම ඉදිරිපත් වුණාට, අපි කටයුතු කරන්න ඕන සභාවක් විදියට. විශේෂයෙන්ම මම

උඩුගම කොටස ගැන, අපේ ආසනය ගැන කතා කළොත්, උඩුගම උතුර ඉඳලා උඩුගම බටහිර දක්වා ප්‍රදේශය තුළ විශාල හානි සිදු වී තිබෙනවා. එක ස්ථානයක ලක්ෂ හත අටක් හානි වෙලා තියෙනවා. ගෙවල් වලට, ගෙවල් වල ඉන්න බැරි ගානට බිත්ති කඩාගෙන ගිහිල්ලා. ප්‍රදේශයේ දැඩි හානියක් සිදුවෙලා තියෙනවා. නමුත් ග්‍රාම සේවා නිලධාරි මහතා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුමා හැරෙන්න වෙන කිසිම කෙනෙක් ඒ වෙලාවෙ හැටියට යන්න විදියක් නැහැ. අද වෙනකොට උඩුගම ප්‍රදේශයේ අදාළ ආයතනවලින් ඇවිල්ලා මේ වන විට ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒවා කරන බව ආරංචියි. ඉතින් කොහොමහරි රජයක් විදිහට ගිය 2017 ගංවතුර වෙලාවේ මම හිතන්නේ කරන්න ඕන කෑම පැකට් එකේ ,පාන් ගෙඩියේ ඉඳලා දෙන්න ඕන සෑම සහයෝගයක්ම මේ ගංවතුර දක්වාම ලබා දුන්නා. මාසෙකට දෙකකට වරක් ඉතිහාසයේ කවදාවත් මොනම රජයකින් වත් නොකරපු ආකාරයට ගංවතුරට මුහුණ දෙන්න ඕන, සැලසුම් සහගතව කරන්න පුළුවන් සෑම කටයුත්තක්ම ඒ ගංවතුර වුන අවස්ථාවේ හමුදාව පොලීසිය නේවි එක දාලා ඒ කටයුතු ආරම්භ කළා. ඒ වගේම ඒ අවුරුද්ද පුරාවටම අවුරුද්දකටත් වැඩි කාලයක් දෙන්න පුලුවන් සෑම ආකාරයකම සහන කිසිම රජයකින් නොකරපු සහ පසුගිය කාල වකවානුව තුළ මහජනතාව බලාපොරොත්තු නොවූ ආකාරයට සහන සැලසීම සිදු කළා. අපේ ප්‍රාදේශීය සභාව හැටියට විශේෂයෙන්ම අපේ සභාවටත් ඉල්ලා සිටි උපකරණ කට්ටල් සහ අනිකුත් දේවල් ලබා දෙන්න. උපරිම වශයෙන් මැදිහත්වෙලා අරන් දෙන්න කටයුතු කරන්නම්. මොකද ඊයේ වෙනකොට මම දැක්කා. අපේ කවුරුත් මොනවත් නොකරයි කිව්වට, ගාල්ලේ අපේ වජිර අබේවධර්න මැතිතුමා දිස්ත්‍රික්කෙම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ මේ ආපදාවට මුහුණ දෙන්න ඕන ඒ නිලධාරීන් සියල්ල ගෙන්නලා අතිගරු ජනාධිපතිතුමාගේ ඇතුලු සියලුම දෙනාගේ උපදෙස් මත ලබා දිය යුතු උපදෙස් ලබා දුන්න. ඇතැම් වෙලාවට ග්‍රාම නිලධාරීන්ට එන්න බැහැ. මොකද මම දන්නවා උඩුගම හෝමදොල වසමට ඉන්න ග්‍රාම නිලධාරි ඉන්නේ තල්ගස්වල. එතුමාට ගංවතුර පණිවිඩය දුන්නට පස්සේ මේ ගේ බලන්න එන්න කියලා එතුමාට එන්න විදිහක් නැහැ. ඒ වගේ තාක්ෂණික ගැටලු තියෙනවා. මේ වගේ ආපදාවකදී කවුරුත් මේක කල් ඇතුව බලාපොරොත්තු වුණා නම් ඒක කරන්න තිබුණා. නමුත් කරන්න ඕන යුතුකම් ඉදිරි දින කිහිපය ඇතුළත හරි ආකාරයට කෙරේවි. තදින්ම වහින වෙලාවේ මම අපේ වෙරංග මන්ත්‍රීතුමාටත් සභාපතිතුමාටත් කතා කළා. උඩුගම ප්‍රදේශයේ අර පසුගිය දවස්වල යෝජනාවක් වෙනස් කරලා කරපු උඩුගම ඩිපෝව අසල ක්‍රීඩාංගනය පසුගිය දවස්වල අලුතින් ඉදි කරපු ක්‍රීඩාංගණය තියෙන්නේ කණ්ඩිය පැත්ත විශාල වලක් වගේ. අනිත් පැත්ත උසයි. සුද්ද කළාට පස්සේ තවත් ඒ ගැටලුව වැඩිවෙලා තියෙනවා. සම්පූර්ණ පිට්ටනිය වතුරෙන් පිරෙනවා. ඒ වතුර බහින්නේ නැහැ. එවිට වැවක් වගේ වෙලා. ඒකෙ පහත් ම තැන තමයි. මම හිතන්නේ ඔබ තුමන්ලගෙ කණ්ඩායමෙන් පහුගිය මැතිවරණයට ඉදිරිපත් වුණු අපේ දිල්ශාන් රන්කෝද්දුවල කියන අපේක්ෂක තුමාගේ නිවස පැත්තට ඒ වතුර පාර පහත්වෙලා. ඊ වෙනකොට ඒ ගෙවල්වල ඉන්න බැරි තත්ත්වයට පත්වෙන්න ගිහිල්ලා. අපේ වෙරංග මන්ත්‍රීතුමා දන්නවා ඇති. බොහොමත්ම අපහසුතාවයට පත්වෙලා තියනවා. ඒ හරියෙ උසම තැන තිබුණ පිට්ටනිය. කවදාවත් එම ස්ථානයේ තෙතමනයක් තිබුණේ නැහැ. දැන් පැය ගානක් ජලය රැදී තිබුණ නිසා ඒවා  පොළොවට උරාගෙන නාය යන තත්ත්වයට ලක් වෙලා තියෙනවා. මොකද අර පහුගිය දවස්වල ඉදිකිරීමක් කරපු foundation එකක් කඩාගෙන යන මට්ටමට ගිහිල්ලා තියෙනවා. ඉතිං ඒ නිසා අපි මේ මොන වැඩ කලත්, අපි රුපියල් 15000ක් විතර ඇස්තමේන්තුවක් තිබුනා.  මෙහෙමයි මෙච්චර කල් වෂර්ාව වැස්සට, ගංවතුර ගැලුවට ඔය වගේ හානියක් වුණේ නැහැ. මම කියන්නේ මේක හින්ද නෙවෙයි. සංවධර්නය කරාට පස්සේ තමයි ඒ ගැටලුවට ලක් වුණේ. දැන් වතුර බහින්නේ  අර දිල්ෂාන්ලගේ ගෙවල්වලින් පල්ලෙහාට තියෙන කුරුන්ද මුලු ගම්මානේ හරහා තමයි.  ඒකේ වතුර බස්සන්න කානුවක් තියෙනවා. ඒ කානු පද්ධතිය සකස් කරලා නැහැ. විශේෂයෙන්ම කියන්න ඕන අපි තාක්ෂණ සේවා නිලධාරි ගිහිල්ලා පැය මෙච්චරයි කියලා දාලා ආවට සභාවේ කායර්ය වන්නේ ඒකෙ බිල ගෙවන එක නෙවෙයි. ඒක නිසියාකාරයෙන් සිදු වෙනවාද කියලා නිරීක්ෂණයක් කරන්න

ඕන. නමුත් ඒ කාණුව පාදලා නැහැ. සමහරවිට වෙරංග මන්ත්‍රීතුමාට වෙලාවක් නැතුව ඇති, ඒ ගැන අවබෝධයක් නැතිව ඇති. මම මන්ත්‍රීවරයෙක් විදියට යෝජනා ඉල්ලුවට මොකක්ද වුණේ කියලා මම දන්නේ නැහැ. මොකක්ද මෙතන තාක්ෂණික ක්‍රමය කියලා. වඩා හොඳ කරන්න ගිහිල්ලා අපට ඊට වඩා බැනුම් අහන්න වෙනවා. ඒ නිසා දැඩි හානියක් එතන තියෙනවා. ඒ පැත්තට කවදාවත් එහෙම වෙලා නැහැ. කාණු පද්ධතියක් තියෙනවා. කානුව පාදල තිබුනනම් හරි. ඕනම දේ කරලා නැහැ. මම එක උදාහරණයක් කිව්වේ. ඒ ගැන සැලකිල්ලක් දක්වන්න ඒ අදාල නිලධාරීන්. ඒ වගේම දිගින් දිගටම කතා කරපු උඩුගම පොළ ගැන, මම පහුගිය දවසක මාසෙකට විතර කලින් පොළේ ගියපු වෙලාවේ වෂර්ාවෙ බඩු අරගෙන ඉටිකොලේ යටින් යන වෙලාවෙ මගේ ඔලුව වහලෙ සීට් එකක තදින්ම වැදුණා. පස්සේ බලනකොට වහලක් පහත්වෙලා. සීට් එකක් පහත් වෙලා. එතනින් තමයි වහල පටන් ගන්නේ . කිසි දෙයක් පේන්නේ නැහැ. එතන හිටපු මුදලාලි දන්නෙ නැහැ මම කව්ද කියලා. මේ ප්‍රාදේශීය සභාවට හොඳ වචන ටිකක් කිව්වා. මමත් පිට කෙනෙක් වගේ ඒ කතාව අහගෙන එතනින් පහත් වෙලා ගියා. පොළ ගැන අපි හැම සතියෙම කතා කරනවා. අපි පොළ හදන්න ඕන. මොනවා කළත් අපි ඒ ඕන දෙයක් කරපු බවක් පේන්නේ නෑ. කලින් එහෙම ගැටලුවක් තිබුණෙ නැහැ. මමත් ඔතනින් ගිහින් තියෙනවා. බැලුවොත් ඇත්නම් සේවකයො පොළේ වැඩ කරනවා. නමුත් මෙහෙම දෙයක්වත් කරලා නැහැ. මේක අද ඊයේ නෙවෙයි එදා ඉඳලම අපි කතා කලාට කවුරුවත් කළේ නැහැ. ඇත්තම කතාව දැන් යම් උත්සාහයක් දරනවා. ඒ නිසා ඒ සල්ලි වියදම් කරන ඒවයි හරි ප්‍රතිඵල නෙලාගෙන හරිම දේ, කරන්න ඕන දේ කරනවා නම් හොඳයි. මොකද උඩුගම පොළ කියන්නේ ඇත්තටම අපායක්. හැමදාම ඔය වහලවල් තාවකාලිකව පොඩි සෙල්ලම් ගෙවල් වගේ ඉටි රෙදි ඇද්දට වැඩක් නැහැ. මොනවහරි වැඩපිළිවෙලකට ගිහිල්ලා ණය මුදලක් හරි අරගෙන මෙය සිදු කළ යුතුයි. අපේ සභාවේ තියෙන ලොකුම ආදායම, අපි ආදායම ගැන කතා කරනවා අපි සභාවෙන් පොළ කරන්න කතා කරාට අපි බලන්නේ ආදායම් පැත්තෙන් විතරයි. අපට එන මුදල නෙවෙයි අපි මිනිසුන්ට පෝෂ්‍යදායී ආහාර වේලකට එලවළු ටික හරි ගෙනියන්න. ඒ සහනය සභාවක් විදිහට ලබාදෙන්න ඕන. ඒ ගැන නැවතත් සලකා බලන්න කියලා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මේක අපි කාටවත් තනියෙන් කරන්න පුළුවන් වැඩක් නෙවෙයි. මේක මේ සභාවේ පොදු දේපල. ඒව තමන්ගෙ කොට්ඨාසයක පිහිටලා තිබුණ කියල ඒක තමන්ගෙ දෙයක් නොවෙයි. මේක සභා අරමුදලින් කරන්න. විශේෂයෙන්ම ශ්‍රවණාගාරයේ අඩුපාඩු සියල්ල කොට්ඨාසයේ මන්ත්‍රීවරයා යෝජනා කරන්න ඕනේ නැහැ. සභාවේ සියලු දෙනා එක්වෙලා පොදු ආදායම් හදා ගන්නවා වගේම ඒ පහසුකම් සැලසීම මීට වඩා විධිමත් කරන්න කියල ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි අපි නිරන්තරයෙන් පාලක පක්ෂය හැටියට ඔබතුමාලා රජය එක පැත්තක තියෙද්දි පලාත්සභාව තව පැත්තක තියෙද්දි අපි යම් යම් දේවල් කරගෙන යනවා. නමුත් අපි මේ පළාත් සභා වෙනුත් ඉතුරු වුන මුදලක් පහුගිය කාලේ ලැබුණා. නමුත් අපේ සභාපතිතුමා ඒක වියදම් කරන්නේ අත්‍යවශ්‍ය දේකට විතරයි. කොහොම නමුත් පහුගිය දවස්වල අපෙනුත් යෝජනා ගත්තා. නමුත් ඒ ඇස්තමේන්තුවක් වත් කරලා නැහැ. මමත් යෝජනා දෙකක් දුන්නා. සමහර ඒවා මෙතන කියනවා. අපි බලාපොරොත්තු වෙනවා මේ මාසෙවත් අපි දීපුව කෙරෙයි කියලා. විශේෂයෙන්ම මම කනගාටුවෙනවා ගෝණදෙනිය ගැන ගෝණදෙණිය කොට්ඨාසයේ අපේ ග්‍රාම සේවා වසම් තුනක් තියෙනවා. මේ සභාව පත්වෙලා මාස 6 ක් වෙනවා. අඩුම ගානේ ගෝන්දෙනිය වසම් දෙකක ලයිට් එකක්වත් දාගන්න බැරි වුනා. මේ සභාවේ මන්ත්‍රීවරු අපි තුන්දෙනෙක් ඉන්නවා. පාලක පක්ෂෙන් ධනංජය මන්ත්‍රීතුමා, අනිත් පැත්තෙන් තවත් මන්ත්‍රීවයෙක් ඉන්නවා, මම ඉන්නවා. අපි අඩුම ගානේ ඒ කරන සාධාරණ වැඩපිළිවෙළවල් අපේ කොට්ඨාසයටත් කෙරෙයි කියල. නමුත් මේ වෙනකන් ගෝණදෙනිය ප්‍රදේශයේ අඩුම තරමින් එකම ලයිට් එකක් වත් හයි කරගන්න බැරි වුනා. ඒ නිසා ඔබතුමන්ලාට අපි පුද්ගලිකවත්, මේ කටයුත්ත කෙරෙන්නේ නැති නිසා තමයි අපේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් සම්බන්ධ කරගෙන මුදල් ගෙන්න ගන්න කටයුතු කළේ. ඒ ගැන මන්ත්‍රීවරු මොන දේ කිවුවත් සමහරු සමහර කොට්ඨාශවල වැඩ ඇති වෙන්න කරල

තියෙනවා. ඒක මම හිතන්නේ නැහැ සියයට සීයක් සම්පූර්ණ කරන්න බැහැ. යම් ආකාරයකින් හරි විශේෂයෙන්ම ගෝනදෙනිය ගැනත් මීට වඩා සොයා බලන්න. අපි යෝජනා කරන ඒවත් නොසලකා හරින්න එපා. අඩුම ගානේ ඇස්තමේන්තුවක් හරි කරලා ඒ ගැන සලකා බලන්න කියලා නැවතත් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගිය සභා වාරයේදී මට වේලාසනින් බැහැරව යන්න සිද්ධ වුණා. මේ සභාවේ වාතර්ාව කියවලා බැලුවට පස්සේ මට පුංචි ප්‍රශ්නයක් ඇති වුණාම මොකද මම සභාවට ආවා. වාතර්ාවේ අඩුපාඩුවක් නොවෙයි මම කියන්නෙ. උදාහරණයක් විදියට ගත්තොත්, අපේ දිසානායක මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවෙන් බැහැරව ගියපු වෙලාවේ එතුමා සභාවට ආවයි කියලා තියෙනවා. වාතර්ා බැලුවම එතුමා ඉඳලා තියෙනවා. නමුත් එතුමා සභාවේ කතා කරලා නැහැ. සමහරවිට මේ වාතර්ාව දැක්කොත් උනන්විටිය ප්‍රදේශයේ එතුමාගේ කොට්ඨාසයෙ දන්න කෙනෙක් බලයි මේ මනුස්සයා ගියාට සභාවේ මුකුත් කතා කරල නැහැනේ කියලා. ඒ වගේ කතා කළා හරි නොකළා හරි අපි සභාවෙන් බැහැර වෙනවා නම් දැනුවත් කරලා ඒ බැහැරවීම සටහන් කරනවා නම් එක වැදගත්. මොකද එදා මම බැහැර වෙච්ච වෙලාවේ ගොඩක් වැදගත් තීන්දු තීරණ වගයක් අරන් තියෙනවා. පිට කෙනෙක් වාතර්ාව කියෙව්වහම හිතාවි මන්ත්‍රීතුමා හිටියට අඩුම ගානේ සභාවේ මේ ගැන වචනයක් වත් කතා කරලා නැහැ කියලා. ඒ නිසා අපේ වාතර්ාවට ඒක ඇතුලත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එතකොට වාතර්ාව කියාගෙන යනකොට තේරෙනවා මේ මනුස්සයා මේ වෙලාවෙ හිටියේ නැහැ කියලා. ඊටත් වඩා නීත්‍යානුකූලව ඉදිරියේදී වෙන මොනවහරි කටයුත්තකදී, අධිහාරයක් ගෙවන්න වුනොත් අර මන්ත්‍රීවරයාත් ඒකට එකඟයි කියලා පේනවා. මොනවා හරි ගත්තු තීන්දු තීරණ වලට එකඟයි කියලා පේනවා. මීට වඩා අද දවසේ මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අවසාන වශයෙන් අපේ සභාවේ අපේ මන්ත්‍රීතුමිය වන චන්දිමා දිල්රුක්ෂි මහත්මියගේ දයාබර දියණිය , අපේ සභාවේ සේවක අවන්ත මහත්මයාගේ පුතණුවනුත් විභාග පාස් වෙච්ච බවට අපි දැනුවත් වෙලා හිටියා. ඊට අමතරව සභාවේ තවත් සේවකයන්ගේ ළමයි හතර දෙනෙක් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වී ඇති බව සභාපතිතුමා දැනුම් දුන්නා. ඒ සියලු දෙනාට සභාවේ මන්ත්‍රීවරු විදිහට සුභ පැතුම් එකතු කරමින් අවසාන වශයෙන් තව එක කාරණයක් තියෙනවා. සභාපතිතුමනි, කොට්ඨාශ වල වැඩ කරනකොට අපේ යෝජනා ක්‍රියාත්මක නොවන තැන, අපි පළාත් සභා මන්ත්‍රීවරු හරි සම්බන්ධ කරගෙන ප්‍රතිපාදනයක් ඉල්ලගෙන ජීවත්වන ප්‍රදේශයට යම් වැඩක් කරන්න උත්සාහ කරනවා. ඒ උත්සාහ කිරීම ගැන සමහර අය සමහර තැන්වල ගිහිල්ලා විවේචනය කරලා තියෙනවා. මම ගෝණදෙනිය ප්‍රදේශයේ පාරවල් 5ක් පහුගිය දවස්වල පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මන්ත්‍රීතුමාගේ පොඩි ගානක් ඉල්ලගෙන ස්කැවේටරයක් දාල පාරවල් 5ක් සංවධර්නය කරන්න කටයුතු කළා. සමහර තැන් වල කතා කරලා තියෙනවා මේකට දාන්න ඕන, මේක නෙවෙයි JCB එකක් දාන්න ඕන, ගමේ මිනිස්සු එහෙම කියනවා. අපි මේ පිටින් සල්ලි සොයාගෙන අපි කරන හැටි දන්නෙ අපි. නමුත් ඒකත් මේ අපේ සභාවේ වගකිවයුතු මන්ත්‍රීවරු ගිහිල්ලා විවේචනය කරළා තියෙනවා. එතකොට අපිට පොඩි කණගාටුවක් ඇතිවෙනවා අපි මේ සල්ලි පිටින් හොයං ඇවිත් බොහොම අමාරුවෙන් කරන වැඩේ ඒ විදියට විවේචනයට ලක් වෙනවා. අපි කරන්න පුළුවන් දේ තාක්ෂණික පැත්තෙන් අපි හරියට කරල තියෙනවා. අපි කරපු වැඩවලින් කවදාවත් කෙනෙකුට හානියක් නැහැ. නමුත් සමහර මන්ත්‍රීවරුන් වගකීමක් නැතුව ඒ දේවල් ගැන දන්නෙ නැතුව කතා කරනවා නම් ඒක වැරදියි. ඒ නිසා කොහොමද සල්ලි කාගේ සල්ලිද කාගෙන් ගෙනාවත් කොහොමත් රටේ සල්ලි තමයි පළාත් සභා මන්ත්‍රී දුන්නත්. නමුත් අපි මේ පොදු අරමුදලෙ රුපියලකට වත් හානියක් නොකර සල්ලි පිටින් හොයාගෙන ඇවිල්ල තමයි මේ සභාවේ යම් දෙයක් කරන්න උත්සාහ කළේ .ඒ නිසා අපටත් අර විදිහට දෙනවනම් කරන හැටි අපි හොඳටම දන්නවා. ඒ නිසා නැවතත් ඉල්ලා සිටින්නේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු 27 ටම එකා වගේ සලකනවා කියලා ඔබතුමා ප්‍රකාශ කලාට, ඔබතුමාට ඒක කරන්න වුවමනාව තිබුනට ඒකට අවස්ථාව මොන ආකාරයකින් හරි ලැබෙන්නේ

නැතිව ඇති. කොහොමහරි පළාත් සභාවේ සහය අපට අවශ්‍යයි නම් මධ්‍යම රජයේ සහය අපට අවශ්‍යයි නම්,මොකද මේ ඉතිහාසෙ කතා කරල තියෙනවා අපි LRC එකට ගියා. අපි මේ ඉඩම ඉල්ලුවා ගයන්ත ඇමැතිතුමා ළඟට ගියා. වජිර ඇමතිතුමා හමුවුනා. වජිර ඇමතිතුමා මෙහෙම කිව්වා කියල බලාපොරොත්තු වන අපි මේ ප්‍රාදේශීය සභාවේ ඉන්න විපක්ෂ කණ්ඩායම විදියට කොන්කරලා එක කණ්ඩායමක් විතරක් වැඩ කරගෙන යනවනම් ඒක වැරැද්දක්. ඒ වැරැද්ද කරනවනං අපටත් පුළුවන් ඔබතුමාලාට එහෙම කරන්න. ඉතිහාසය ගැන හිතල කරන්න එපා. වෙන කණ්ඩායම් නායකවරුන්ගෙ, සංවිධායකවරුන්ගේ උපදෙස් වලට මේ සභාව කරගෙන යන්න එපා. සභාපතිතුමාට අපි ඉතාම සහයෝගයෙන් 26 දෙනෙක් ඉන්නවා. ඔබතුමාගේ ඒ තියෙන සුවිශේෂී හැකියාවන් එක්ක ඔබතුමා මන්ත්‍රීවරයෙක් වෙලා ඉඳල එතනට ගිහිල්ල සභාපති වෙලා ඔබතුමා දන්නවා මන්ත්‍රීවරයෙක්ගෙ කාලෙ තත්වය මොකක්ද කියලා. එනිසා ඒ ගැන සලකා බලා කාටත් පොදුවේ කටයුතු කරන්න. වෙනදා කලේ එහෙම නෙවෙයි. වෙනද වගේ තනි පළාත් සභාවක්, තනි ආණ්ඩුවක් තනි සභාවක් තියෙන කාලේ කරපුව නෙමෙයි. දැන් සියල්ල ඒකාබද්ධ වෙලා යන්නෙ. ඉතින් ඒ නිසා ඒ හැමෝගෙම සහයෝගය අපටත් අරන් දෙන්න පුළුවන්. ඔබතුමන්ලගේ සෑම කටයුත්තකටම අවසරය අනුමැතිය සහයෝගය මුදල් ලැබෙන්න ඕන ඒ සඳහා අපටත් දක්වන්න පුළුවන් උපරිම දායකත්වය ලබාදෙන්න හැකි ආකාරයෙන් මේ සභාවේ විසිහත් දෙනාටම එක සමානව කටයුතු කරන්න කියලා නැවතත් ඉල්ලා සිටිමින් ,පහුගිය ගංවතුරෙන් හානිවුන පවුල් වල සියලුම දෙනාට අපේ කනගාටුව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ඒ වගේම ඌරල ප්‍රදේශයේ ජීවිත හානියකුත් සිදුවෙලා තියෙනවා. ඒ ගැනත් අපේ කණගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ගෙන් ද, ලේකම්තුමිය ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන් මන්ත්‍රීතුමියන්ලාගෙන් ද අවසරයි. මේ අවස්ථාවේ මම නැගී සිටියේ මම ගියවර සභාවාරයේදී ප්‍රකාශ කළා. අපේ උඩවැලිවිටිය ප්‍රධාන මාගර්ය මේ වන විට කැඩිලා ගල් ඉවත් වෙලා පාර පුරා විසිරිලා තියෙනවයි කියලා. මොකද අධික වෂර්‍ා තත්ත්වය නිසා මේ වන විට අර තිබුණට වඩා විශාල ප්‍රමාණයක් වළවල් හැරිලා තිබෙන බව අද මම දැක්කා. අපේ ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය ගැන කියනවනම්, මගේ නිවස දෙපැත්තේ, පාර දෙපැත්තෙම ගංවතුර මම රෑ 1.30 ට විතර ගරු සභාපතිතුමාට කතා කළා. එතුමා ඒ වෙලාවේ ඒ ප්‍රදේශයට ප්‍රචාරය කිරීමට ඒමට නොහැකි බව පැවසුවා. ඒ වගේම අපේ 2019 අයවැය සඳහා ඔබතුමා පාරවල් දෙකක් ඉල්ලුවා. ඒ අනුව මම මුලින්ම ලබා දුන්නේ මාලා මහත්මියගෙ නිවස අසල සිට පින්වත්ත පාර හදලා දෙන්න කියලා. කියන්න සතුටුයි. මේ වන විට සිංහරාජ ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 20ක මුදලක් ඒ වෙනුවෙන් පාස්වෙලා, මැනලා දැන් අවසන්. තව සති දෙකකින් පාරේ වැඩ පටන් ගන්නවා. ඒ ගැන මම සතුටු වෙනවා. ඒවගේම තමයි ගියවර ලක්රුවන් මන්ත්‍රීතුමා අපේ උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ මාගර්යට නඩුවක් තියෙනවා. ඒක නිසා ඒ පාර හදන බව එතුමා දන්නෙ නැහැ කියලා ප්‍රකාශ කළා. නමුත් සිංහරාජ ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 20 කින් ඒ පාරේ වැඩ අවසන් කළා. ඒ වගේම තමයි ගරු අගමැතිතුමාගේ ආර්ථික සංවධර්න අමාත්‍යාංශයෙන් තව ලක්ෂ 5ක මුදලක් ඒ පාරටම වෙන්වෙලා තියෙනවා. ඒකත් මැන්නා. ඒ වගේම ගම්පෙරළිය යටතේ තව ලක්ෂ දහයක් ඒ පාරටම ඇවිල්ලා, ඒ පාරත් මැණීම් කටයුතු සිදු කළා. එතන ලක්ෂ පහළොවක් තියෙනවා. මම හිතන්නේ ඒ පාරේ වැඩ නිම කරගන්න මේ අවස්ථාවේ දී හැකිවේවි කියලා. ඒ ගැනත් මම එතුමාට මතක් කර සිටිනවා. පාරවල් කොන්ක්‍රීට් කළත්, දැන් අපි යන පාර ප්‍රදේශයේ මේදවස්වල පවතින අධික වෂර්‍ාව නිසා පාර දෙපැත්තෙ තියෙන පඳුරු පාරට නැමිලා තියෙනවා. පසුගිය වසර වල නම් ස්වේච්ඡා සමිති මගින් ඒවා සුද්ද කළා. නමුත් දැන් ජනතාව පවසන්නේ සභාවක් තියෙනවා ඒ සභාව මගින් ඒව

කරන්න ඕන, අපි මහන්සි වෙන්නෙ මොකටද කියලා. ඒ වගේම ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමා පසුගිය මාස දෙකකට විතර පෙර ශ්‍රමදානයකින් ඒ පාර සුද්ද කළා. නමුත් ඊට වඩා විශාල ප්‍රමාණයකින් දැන් කැලෑව වැවිලා. යතුරුපැදියක වත් යන්න බැරි තත්ත්වයක් තමයි දැන් තියෙන්නෙ. උඩවැලිවිටියත් උඩවැලිවිටිය බටහිර ප්‍රදේශයටත් ඒ වගේමයි. ඒ ගැන මතක් කරනවා.

ඒවගේම මේ ගංවතුර අවස්ථාවේ අපේ ප්‍රදේශයේ එක නිවසක් තමයි ගංවතුරට යට වුනේ. ඒත් ඔවුන්ට ඒ අවස්ථාවේදීත්, ඊට පෙරත් එයින් අයින් වෙන්න කියලා තියෙනවා. උඩුගම ප්‍රදේශයෙන් ඉඩමක් ලබා දීල තියෙනවා. ඔවුන් එය භාර ගෙන නැහැ. ඊට පස්සෙ ලක්ෂ 12 ක මුදලක් ලබා දී තියෙනවා. වෙනත් ඉඩමක් හොයා ගෙන අපට පවසන්න කියලා ඒක ගත්තෙත් නැහැ. ලක්ෂ 6ක මුදලක් රක්ෂණභාර අරමුදලෙන් දීලා එම ස්ථානයේම ඒ නිවස හදලා ඒත් වහල ගහගන්න බැරි වෙලා තියෙනවා. ඒ නිවස තමයි මේ අවස්ථාවේදීත් යට වෙලා තියෙන්නෙ. ඉතින් එතුමාගේ නොලැබීම තමයි මට හිතෙන්නේ. ඒ ගැන තමයි මට කියන්න තියෙන්නේ. ඔබතුමාගේ අවධානය යොමු කරලා අපේ පාර දෙපැත්තෙ තියෙන ඒ මාන පඳුරු ටිකවත් ගලවලා දෙන්නෙ කියල නැවතත් ඉල්ලා සිටිනවා. යහපාලන රජය මගින් කොන්ක්‍රීට් නම් අපේ පැත්තට මේ අවස්ථාවේ ලබාදෙනවා. ඒ ගැන සඳහන් කරමින් සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් සහ ලේකම්තුමිය ගෙන් අවසරයි. පසුගිය අපදා තත්වයේදී ගොඩක්ම ආපදා තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදුවුණේ මගේ අංක 218 උඩුගම බටහිර කොටස තමයි. ඒකෙ අක්කර හත කියන තැන, තැනින් තැන කඳු කඩා වැටීම් ගොඩක් තියනවා. ඉතින් වෙරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ එක් ස්ථානයක නොසිතූ විදියට කන්ද උඩින් ආපු වතුර පාර ගේ ඇතුලෙන් තමයි ගිහින් තියෙන්නෙ. ගෙදර සියලුම දේ විනාශ වෙලා තියෙනවා. අපේ තරංග මන්ත්‍රීතුමාත් ඒක හොඳින් දැක්කා. එතන උඩ බෝක්කුවක් හරස් කරපු නිසා ඒ ගේ ඇතුලෙන් වතුර පාර ආවා කියල තමයි ඒ ගෙදර අය කියන්නේ. ඒ ගැන තව සොයා බලන්න වෙනවා. ඒ වගේම හෝමදොළ පැත්තට වෙන්නත්, කැටගොඩ හරියට වෙන්නත් කඳු කඩා වැටීම් ගොඩක් තියෙනවා. උඩුගම පස් ටික අයින් කරගන්න අපි ඉක්මනින්ම JCB යන්ත්‍රයක් ඉල්ලා සිටිනවා. දැන්ම අයින් කරගත්තෙ නැත්නම් පසුවට අයින් කරගන්න අමාරු වෙයි.

ඊළඟට කියන්න තියෙන්නේ ඇප්තොප්වත්තේ මැස්සො ප්‍රශ්නය මම කලිනුත් ඒ ගැන කිව්වා. දැන් මේ දිනවල ගංවතුර ආපදාවට අහුවෙච්ච කුණු අද්‍රව්‍ය සියල්ලම ඇප්තොප් කන්දට තමයි ගිහින් දාන්නෙ. ඒකේ දැන් මැස්සො ප්‍රශ්නේ වැඩිවෙලා. ඒ නිසා අර මැලතියන් කියන එක හරි ගහලා ඒ මැස්සො බෝ වෙන එක වළක්වන්න මොකක් හරි ක්‍රමයක් යොදන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ඒ ගඳත් මිනිසුන්ට උහුලන්න අමාරුයි. ඒ වගේම තමයි පොලිතීන් ප්‍රශ්නය අපේ අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය නිතරම ප්‍රකාශ කළා. අපද්‍රව්‍ය කලමනාකරණයකින් තොරව එතනට යන නිසා පොලිතීන් තව තවත් ගොඩගැහෙනවා. වෙරංග මන්ත්‍රීතුමා පොල් ඉඩම ගැන කතා කළා. පොල් ගස් අනූ ගානක් තිබුනා. දැන් තියෙන්නෙ පනස් ගානයි. පොලිතින් ප්‍රශ්නය නිසා තමයි පොල් ගස් මැරිලා තියෙන්නෙත්. දැන් අර කොම්පෝස්ට් හදලා ඉතුරුවෙන පොලිතීන් ටිකක් එතනම පිටිපස්සට දානවා. එතනත් දැන් පොලිතීන් කඳක් ගොඩගැහෙනවා. කුණු කන්දක් උඩුගමට එපා කියල ඉල්ලා සිටිනවා. පොලිතින් ප්‍රමාණය වැඩි වෙනකොට පොල් ඉඩම තව විනාශ වෙනවා. ඒ වගේම අපේ නෙළී මන්ත්‍රී තුමිය ආපදා තත්වයට මුහුණ දුන්නා. ඒ වෙනුවෙන් අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. අපේ චන්දිමා මන්ත්‍රිතුමියගේ දියණිය සහ අපට ගොඩාක් සහාය වන අවන්ත නිලධාරී මහතාගේ පුතනුවන් ශිෂ්‍යත්වයෙන් පාස් වීම ගැන සුබ පතනවා. මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි මන්ත්‍රී මන්ඩලයේ ඔබ සියලු දෙනාගෙන් අවසරයි. ලේකම්තුමිය නිලධාරි මහත්මා ඇතුළු අපේ මාධ්‍යවේදී මහතාගෙන් අවසරයි. මම දීඝර් වශයෙන් කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ආපදා තත්ත්වය පිළිබඳ සියලුම මන්ත්‍රීවරුන් අද සභාවේ කතා කරන අවස්ථාවක්. අපි සාමාන්‍යයෙන් බැලුවම. පසුගිය සෑම වෙලාවකම. ආපදාවක් එන්න කලින් අපි සූදානම් වෙනවා. හැබැයි ස්වභාවධමර්ය අපට ඉඩ දෙන්නෙ නැහැ. කවමදාකවත් පෙර සූදානමක් ඇතිව මේ සියල්ලට මුහුණදෙන්න. ඒක ස්වභාවධමර්යෙන් ලෝකෙ කොහෙටවත් ඉඩ දෙන්නෙ නැහැ. මම ඊයේ පෙරේදා බැලුවා. ඔබත් අහල ඇති සුමාත්‍රා දූපත අසල ද කොහෙද මගේ මතකයෙ හැටියට ඉන්දුනීසියාවේ. ඒ රටේ ඉතාමත් හොඳින් සන්නිවේදන පද්ධතියක් ක්‍රියාත්මක වෙලා එක අක්‍රිය කළාම තමයි නැවත ස්වභාවික විපත ආවේ. ඒ නිසා ස්වභාවික විපත් වල ස්වභාවය ඒකයි වෙනද වගේ අපි මහා ගංවතුරක් බලාපොරොත්තුවෙන් සූදානම් වුනහම. ඒක වෙන ක්‍රමයකින් ඇවිල්ලා හරි, ස්වභාව ධමර්ය අපට එහෙම තමයි සලකන්නේ. ඒ නිසා අපේ පෙර සූදානම හොඳයි. හැබැයි ඒකෙදි අපි අවධානය යොමු කරන්න ඕන එක පැත්තකට නෙවෙයි හැම පැත්තතටම. මම හිතනවා මෙතන ඉන්න වැඩි පිරිසක් ගිං ගඟේ ආපදාවට නැත්නම් ගංවතුර තජර්නයට යටත් වෙන බොහෝ පිරිසක් ඉන්නවා. අජිත් එඩේරආරච්චි හිටපු සභාපති තුමත් මමත් ඒ අතින් බැලුවහම ඒ ආපදාවට ලක් වන්නේ නැහැ. නමුත් ඔබ වගේම අප ප්‍රදේශවලත් බරපතල ගැටලු තියෙනවා. එතුමා ඊයේ පෙරේදා දවස් දෙක තුනේම ඇවිදලා තිබුනා. මමත් ඉඩ තිබුන පරිදි සොයන්න බලන්න ගියා. අලුත් වත්ත ප්‍රදේශයේ උඩුගම දකුන ප්‍රදේශයේ මහා විශාල කන්ඩි ඇවිල්ලා. සමහර ගෙවල් ඉතාම බරපතළ ලෙස හානියට ලක් වෙලා තියෙනවා. අපි ඒ ස්ථානවලට ගියාම මෙතැනදී අපට තියෙන එකම ප්‍රශ්නයක් තමයි අත්දැකීමෙන් අපි දන්න දේ තමයි මේකෙදී ග්‍රාම නිලධාරි අදාල රජයේ නිලධාරීන් ඇවිත් ඒව ලියාගෙන ගිහිල්ලා. ඒකට ගැලපෙන නිවැරදි තක්සේරුවක් කරලා. ඒවා නිවරදිව ලැබෙයි කියලා. ඒ මිනිස්සු බලාපොරොත්තුවෙන් ඉන්නවා. හැබැයි අත්දැකීමෙන් නම් තියෙන්නේ එහෙම දෙයක් නෙවෙයි. අපිට දෙවැනි සැරේ යනකොට බැනුම් අහන්න තමයි වෙන්නේ. කොපමණ ආකාරයෙන් එහෙම කලත් ඒව නිවැරදි වෙන්නෙ නැති ක්‍රමයක් තියෙනවා. කොහේ හරි අඩුපාඩුවක් තියනවා. තක්සේරු කිරීම් සමහර වෙලාවට ගැලපෙන්නෙ නැති තක්සේරු කිරීම් කියලා අපට ඉතා හොඳින් තේරෙනවා. ඒ නිසා අපි ඒ අවස්ථාවලදී අවධානය යොමු කළ යුතුව තියෙනවා. ඒ නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා හරි ඒ අයට නිවැරදිව ඒ කටයුතු ඉටු වෙන්න ඕන කියන කාරණය තියෙනවා. ඊළඟට අපේ සභාපතිතුමා සඳහන් කළ පරිදි උප සභාපති තුමාගේ ඉල්ලීම පරිදි අපේ අජිත් එඩෙආරච්චි මන්ත්‍රීතුමාත් මේ කරුණු ටිකම ඉදිරිපත් කරාවි. අලුත්වත්ත ප්‍රදේශයේ පැණි ගලයාය ගම්මානයට යාමට තියෙන මාගර්යේ කීප පලකම පස් කණ්ඩි ඇවිත් තියෙනවා. ඒ වගේම උඩුගම නැගෙනහිර මම ජීවත් වන ප්‍රදේශයේ ඇටිකෙහෙල් කන්ද කියන ප්‍රදේශයේ මාගර් අවහිර කම් කියනවා. බංගම පාරෙ ඒ වගේ අවස්ථාවන් කිහිපයක් තියෙනවා. ඒවගේම අලුත් වත්ත අක්කර පහ ප්‍රදේශයේ අතුරු මාගර්යක ඒවගේ පස් කණ්ඩි කිහිපයක් ඇවිල්ල තියෙනවා. ඒවගේම දාවුල්හේන ප්‍රදේශයේ මගේ කොට්ඨාසයට අයිති ප්‍රදේශයේ ස්ථාන තුන හතරකම මාගර් අවහිර වීම් කියනවා. මම ඊයේ සභාපතිතුමාත් එක්කත් කළා. ඒ නිසා මම හිතනවා අපේ උප සභාපති තුමා සඳහන් කළ පරිදි අපට ඒවා පිළිසකර කර ගන්නට අවස්ථාව සලසා දෙන්න කියන කාරණයත් සිහිපත් කරනවා. ඒ එක්කම මම මේ වෙලාවේ විශේෂ සඳහන් කිරීමක් කළ යුතුව තියෙනවා. උඩුගම නැගෙනහිර ප්‍රදේශයේ මගේ කොට්ඨාසයේ ජනතාව පිළිබඳව. අපේ සභාපතිතුමා පසුගිය දවස්වල ගිහිල්ලා ඇවිත් තිබුණා. ඒ ප්‍රදේශය කඳුකර ප්‍රදේශයක්.මම හිතන්නේ ඔබටත් වඩා බියෙන් ජීවත්වන ප්‍රදේශයක් බවට ඒ ප්‍රදේශය පත්වෙලා තියෙනවා. අක්කර 80 ප්‍රදේශය සහ මම ජීවත් වන මගේ නිවස තියෙන ප්‍රදේශය. එකක් තමයි කඳු මුඳුන් වල තියෙන අපිට හිතන්නවත් බැරි මහා විශාල ප්‍රමාණයේ ගල් පහලට ඇවිල්ල. ඒ ජනතාව මහා බියකින් තමයි මේ දවස් වල ජීවත් වෙන්නේ. ඒව දැනුම් දුන්නම නිලධාරීන් ඇවිත් දෙන උපදේශය තමයි ගෙදර බුදිය ගන්න එපා කියන එක. ඉතින් ඒ මිනිස්සු ගෙදර ගෙදර බුදිය ගන්නෙ නැහ. අවට ගෙවල් වලට ගිහිල්ලා බුදිය

ගන්නවා. නින්ද යන්නෙත් නැහැ. ඊලගට අනිත් කාරණය තමයි එතන වටපිටාවේ තව නිවාස රාශියක් තියෙනවා. එතකොට නිලධාරීන් ඇවිල්ල සොයලා බලල කටකතාවට කියලා යනවා. මෙන්න මේ ගෙවල් ටික අවදානම් කියලා. එතකොට ඒ ගෙවල්වල මිනිස්සුන්ටත් නින්ද යන්නෙ නැහැ.ගෙවල් පහලවක් විස්සක් විතර තියෙනවා. ඒකට හරියට නිශ්චිතව නිලධාරියෙක් උත්තර දීලා නැහැ. ඒ කටකථා මගින් ගිහිල්ලා ඒ මිනිස්සු නිදාගන්නෙත් නැහැ. මුළු කන්දෙ ම ගල් ඒවි කියලා බලාපොරොත්තුවෙන් ඉන්නවා. මම මේ සම්බන්ධව පුංචි යෝජනාවක් හැටියට ගේනවා. අපේ හිටපු උප සභාපති තුමාටත් අපේ සභාපති තුමාටත් මේ පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවේ කතා කළ යුතුව තියෙනවා. ඒ විතරක් නෙවෙයි ප්‍රදේශයේ තවත් බරපතළ ගැටලුවක් තියෙනවා. ඊටත් වඩා වැඩි ප්‍රමාණයකට. පසුගිය දිනවල අපේ ප්‍රදේශයේ නිවෙස් කීපයකට ගිහිල්ලා සංසනනයක් කරලා තියනවා. මේ නිලධාරීන් ඒ ගෙවල්වල මිනිසුන්ට කියන්නේ ඔයගොල්ලන්ගේ දේවල් නාය යනවා. ඒ නිසා උඩින් ගිහිල්ලා මොනවද ගත්තම අපි දන්නේ නැහැ අලුත් තාක්ෂණයත් එක්ක මොනවා කලාද කියලා. ඒවට අනුව නාය යනවා. ඒ නිසා ඉවත් කරන්න අවශ්‍ය තොරතුරු ගන්නවා කියලා. ඉතින් එහෙම කියල හරියටම ඒකෙ තොරතුරක් දන්නෙත් නැහැ. නිවැරදි තොරතුරක් දීලත් නැහැ. නිලධාරියෙක් මේකට හරියට උත්තරයක් දෙන්නෙත් නැහැ. ඒ නිසා මේ තුළ පවුල් පනහක් හැටක් මහා බියකින් මේ දවස් වල ජීවත් වෙනව.උඩින් ගතිපු පිංතූරවලට අනුව මේ ගෙවල් ටික ඔක්කොම නාය යනව කියල තමයි කියල තියෙන්නෙ. මගේ ගේත් ඒකට අයිති වෙලා තියෙනවා.මමත් ඒ මට්ටමෙන් තමයි ජීවත් වන්නෙ. ඒ නිසා මම හිතනවා අපේ සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් හැටියට මෙය ගෙනවිත් මේ පිළිබඳ ඉතා ඉක්මනින් නිවැරදි තොරතුරක් අරගෙන නාය යනවා නම් වහාම බලාගෙන ඉන්නේ නැතුව ඒ අයට විකල්පයක් ගත යුතුව තියෙනවා. ඉතින් ඒ නිසා එහෙම නැතුව නිකං කටකතා පදූරු වල ග්‍රාමනිලධාරී තුමා කියනව එහෙම එකක් නැහැ කියල.ඕක පිංතූරවලින් ගනිපු එකක් තියෙන්නෙ කියල. ඊලගට අනිත් නිලධාරිය ඇවිල්ලා කියනවා නෑ නෑ එහෙම අවදානමක් තියෙනවා කියලා.ඒ නිසා තමයි ඔය ගෙවල්වලට වන්දි දෙන්න ගෙවල්වලින් ඉවත් කරන්න මේව කරන්නෙ කියල. ඒ නිසා මේවා නිවැරැදි විය යුතුයි.ඒ නිසා අපේ ප්‍රදේශයේ ජනතාව ලොකු ගැටලුවකට මුහුන පාල ඉන්නව. ඒවගේම මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අක්කර 80 ප්‍රදේශයේ තියෙන ගැටළුවට මම හිතන්නේ පවුල් දහයක් පහළොවක් පමණ සිටිනවා. ඒ අයට විසඳුම එතනම තියෙනවා. මම කියන්නේ ඒ භයානක ප්‍රදේශ වල අවදානම් සහිත ප්‍රදේශවල ඉන්න පිරිස් ටිකට දෙන්න පුළුවන් ඉඩම් ප්‍රමාණයක් අක්කර 80 ප්‍රදේශයේම වෙනම තියෙනවා. එනිසා සම්බන්ධීකරණ කමිටුවට යෝජනා කරන්න ඒ ඉඩම් ටික අරගෙන ඒ ප්‍රදේශයේ අයට බෙදලා දෙන්න කටයුතු කරන්න කියල ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව ඔබතුමන්ලා දෙපළගෙන් ම සම්බන්ධීකරණ කමිටුවේ කතා කරලා ඒ කාරණය ඉෂ්ට කරයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ එක්කම මම මේ සඳහන් කරපු මාගර් ටික සහ නිවෙස්වල අර කියපු කාරණයට මුහුණ දෙන ගමන් ඒ නිවෙස්වල විශාල ගැටළු ප්‍රමාණයක් තියෙනවා. ඔබ සියලු දෙනාම වගේ අපටත් මේ කාලයේදී අවදානම් සහගත තත්ත්වයන්ට මුහුණ දෙන්නට සිදු වෙලා තියෙනවා. අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපි සඳහන් නොකලත් මම ඉල්ලීමක් නොකළත් අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වට අපේ ප්‍රදේශයට නම් අපේ අවසරය අරගෙන නෙවෙයි එතුමා සොයලා බලල අවශ්‍ය වෙලාවේ ඒ මිනිස්සු හමුවෙලා ඒ කටයුතු කළ කටයුතු කිරීම ගැන ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒක්කම ගරු සභාපතිතුමනි මම පුංචි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබුනා අර උඩුගම දකුණු ප්‍රදේශයේ ක්‍රීඩාංගනය පිළිබඳව. මම ඒකෙදි විශේෂ ඉල්ලීමක් කරනවා. උඩුගම ප්‍රදේශයේ තියෙන පාසල් අතරට ක්‍රීඩා භූමියක් නැති එකම පාසල මගේ පාසලයි. මට මතකයි කලින් මේ සභාවෙ මම මන්ත්‍රීවරයා හැටියට සිටිද්දි උඩුගම නැගෙනහිර ආනන්ද විජය විද්‍යාලයේ ක්‍රීඩා පිටියත් තිබුනේ නැහැ. සභාවේ මැදිහත්වීමෙන් අපි ක්‍රීඩා භූමියක් ලබාගත්තා. දැනට අපිට විද්‍යාලයට ක්‍රීඩා භූමියක් නැති නිසා මම දකුණේ ඒ ගම්මානේ තියෙන ක්‍රීඩාංගනය අපට ඉදිරි වෂර්යේ ක්‍රීඩා කටයුතු කරන්න පුළුවන් පරදී

පිළිසකර කර ගන්නට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලීමක් කරනවා. මම හිතනවා මේ වෙලාවේ තවදුරටත් කරුණු තිබුණත් මේ ආපදාව පිළිබඳව පත්වුණ ඒටම විතරයි කතා කළේ. අපේ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව කරුණු දක්වාවි.ඒ සහයෝගය දෙන්න කියන ඉල්ලීමත් කරමින් ඒ එක්කම විශේෂයෙන් අපේ වෙරංග මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි අපි සභාවේ කටයුතු කරගෙන යාමේදී අපි දකින අපට පෙනෙන යම් අඩුපාඩුවක් තියෙනවා. දැන් මාස තුන හතරකින් අපේ විදුලි කාමරීක ශිල්පියා මොනවද කරන්නේ කියන එක පිළිබඳ අපට ප්‍රශ්නයක් තියෙනවා. මෙහෙම ඒ අය සභාවේ වැටුප් ලබන නිලධාරීන් වැටුප් ලබන අය හැටියට, අපට දැනගන්න තියෙන පරිදි මේ කටයුතු කරන්න අවශ්‍ය උපකරණ නැහැ. වැටුප් ගෙවනවා. නමුත් ඒ නිලධාරි මොනවද කරන්නේ කියලා, එතකොට ගෙවන වැටුපට සරිලන සේවයක් කරනවද? මම කියන්නේ light සවි කරන්නෙ නැත්නම්, බල්බ් නැත්නම්, ඒ ද්‍රව්‍ය නැත්නම් වෙන මොකක් හරි කාරණයකට හරි ඒ නිලධාරීන් යොමු කරල තියෙනවද? ඒ පිළිබඳව අපි පොඩ්ඩක් කණගාටු වෙනවා. ඇත්තටම මොකද අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනව. නැවතත් සඳහන් කරනවා නම් පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාටම බලපාන ප්‍රශ්නයක් තමයි මේ විදුලිය පිළිබඳ ප්‍රශ්නය. නැවත වතාවක් ඒ පිළිබඳව ගරු සභාපතිතුමාට සිහිපත් කරනව. මේ පිළිබඳ ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්නේ කියන කරන්න කියන සිහිපත් කිරීමත් කරමින් ඔබ සියලු දෙනාට සුබ දවසක් ප්‍රාථර්නය කරමින්, ඒ එක්කම අර සියලුම මන්ත්‍රීවරු සඳහන් කළ පරිදි ශිෂ්‍යත්ව විභාගය සමත්වුණු අපේ මන්ත්‍රී තුමියගේ නිලධාරි තුමන්ගේ සහ අනෙකුත් අපේ සභාව විතරක් නෙවෙයි සමත්වුණු සියලුම දූවාදරුවන්ට සුබ අනාගතයක් වාසනාවන්ත අනාගතයක් ප්‍රාථර්නා කරමින් මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී එන්.වී සමන් මහතා**

ගරු සභාපතිතුමනි උප සභාපතිතුමා ලේකම්තුමිය සහ සියලුම මන්ත්‍රී මන්ඩලයේ අවසරයි. අයහපත් කාලගුණය නිසා හෝමදොල කොට්ඨාසය තුල දැනට ගෙවල් 7කට විතර කඳු කඩා වැටිලා අලාභහානි සිදු වෙලා තියෙනවා. ඒවගේම ගල්ලන්දල ප්‍රදේශයේ ගෙවල් 18 ක් විතර කඳු කඩා වැටිලා අලාභහානි සිදු වෙලා පාරවල් හිර වෙලා තියෙනවා. හෝමදොල ප්‍රදේශයේ පාරවල් හිර වෙලා තියනවා. තරංග මන්ත්‍රීතුමාත් යන්ති මන්ත්‍රීතුමිය අපි සියලු දෙනා ගිහිල්ල සොයා බැලුවා. නමුත් ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරන්න ඕන. උඩුගම අපි මන්ත්‍රීවරු විදිහට ගංවතුර ගලද්දී උඩුගමට අපට සභාවෙන් කියලා මොකක් හරි උදව්වක් කරන්න. ඔබතුමාගේ අවධානය යොමු කරන්න. උඩුගම අපි සියලු දෙනා හිරඋනාට පස්සේ සභාවෙන් උදව්වක් ගන්න ගියාට පස්සෙ ඔබතුමා සම්බන්ධ කරගන්න ගිහිල්ලත් ලොකු වෙලාවක් යනවා. ඉතින් ඒ ගැන අවධානය යොමු කරලා පසුගිය ගංවතුරෙ දි ඔබතුමා 11.00 – 12.00 වෙද්දි උඩුගමට ගිහිල්ලා අපිව මුන ගැහිලා සොයා බැලුවා. ඒ ගැන ඔබතුමාට ස්තුතිය පුද කරනවා. උඩුගම, ගල්ලන්දල, ගමගොඩ, උඩුගම ප්‍රදේශය හිර උනාම ගංවතුරෙන් අපට බලන්න යන්න විදියක් නැති තත්වෙට පත්වෙනව. මොකද තරංග මන්ත්‍රීතුමාත් කාන්ති මන්ත්‍රීතුමිය අපි සියලු දෙනා ගිය අවස්ථාවේ. අපට ගිහිල්ලා කඳු කඩා වැටුන තැන් බලල එන්න විතරයි තිබුනේ. මොකද අපි සභාවක් විදියට අපිට කරන්න පුලුවන් දෙයක් කියන්න විදියක් නැහැ මේ දේවල් කරන්නම් කියලා. පාරවල්වල හිරවෙච්ච පස් ටිකවත් අයින් කරලා දෙන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා. ඒ වගේම අපේ හන්දිවල තිබූ ලයිට් ටිකත් ගලවාගෙන ඇවිල්ලා දැනට සභාවේ දාලා තියෙනවා. අපට දැන් මළගෙදරකට පිරිත් ගෙදර දානෙ ගෙදරට ගිහිල්ලා ඉන්න විදියක් නැහැ. මන්ත්‍රීතුමාල මොකක්ද කරන්නේ අපේ හන්දි වල තිබුණ බල්බ් ටිකක් අපට නැහැ කියලා. ඒ නිසා අපි ඔබතුමාගෙන් දිගටම ඉල්ලීමක් කළේ අපට ගම්වලට ලයිට් ටික නැත්නම් ප්‍රධාන පාරවල් ටිකේ බල්බ් ටිකවත් දාල දෙන්න. අයහපත් කාලගුණයත් එක්ක ඔබතුමා කරන්න පුළුවන් යුතුකම් කොටස අපට ඉතාමත් හොඳින් ඉෂ්ට සිද්ධ කරනවා. ඒවගේම උඩුගම ප්‍රදේශයේ අපි

අත්හැරලා නැහැ ඔබතුමා අපිව සොයා බලන බවත් සිහිපත් කරන ගමන්ම නමුත් ගම ඇතුලෙ ලයිට් ටික දාන එක කෙසේවෙතත් අපට කැටගොඩ ඉඳලා බාර් හන්දිය දක්වා බල්බ් ටිකවත් දාන්න කියන ඉල්ලීම අපි දිගින් දිගටම කළා. මිනිස්සු අපෙන් අහනව ටවුන් එක මොකද කරුවලේ කියල. ඒ නිසා ගරු සභාපතිතුමනි ඉතා ඉක්මනින් අපේ ගලවන් ගිය ටිකවත් සවි කරලා දෙන්න කියන ඉල්ලීම නැවතත් කරනවා. මොකද කැටගොඩ බස් නැවතුම්පොල ලග බාර් හන්දියෙ සියලුම බල්බ් ටික ගලවගෙන ඇවිල්ල. එලිය නැත්නම් බල්බ් ටික හරි තියෙනවා.දැන් ඒකත් නැහැ.මේ කාලගුණ තත්වෙ යහපත් වුනාට පස්සෙ ඒ බල්බ් ටික සකස් කරල දෙන්න.ඒ වගේම පිලිස්සුන වීපී ලාම්පු ටිකත් සකස් කරල දෙන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා. අපි උඩුගම මන්ත්‍රීවරු විදියට අපට ගංවතුරක් ආවට පසු සභාවෙන් කරන්න පුළුවන් යුතුකම් කොටස ඉතාමත් හොඳින් සොයා බලා ඉෂ්ට සිද්ධ කර දෙන ලෙස ඉල්ලීම කරමින් පාරවල් වල තියෙන පස් කඳු ටිකත් මොකක් හරි ක්‍රමවේදයකින් අස් කරලා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. මම මේ අවස්ථාවේදී ගරු සභාපත්තුමාගෙන් ඍජු පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. උඩුගම ප්‍රදේශය මේ වන විට පස් කඩා ගෙන වැටුනු නිවාස හා ආයතන තියෙනවා. මම ඍජු පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. ඒවා ඉවත් කිරීමට ක්‍රමවේදයක් අපට සකස් කරල දෙන්න.අපට ලබා දෙන්න JCB රථයක් හෝ අපි JCB යන්ත්‍රයක් සොයා ගත්තොත් ඒ සඳහා ගෙවීම් කරනවද කියල මම අහනව.මොකද කීප පළකින්ම කතා කළා පස් ඉවත් කරල දෙන්න කියල.ඒ සම්බන්දව ඍජු පිළිතුරක් මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. මම මේ අවස්ථාවේදී

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා**

ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. සභාපතිතුමනි ජයතිස්ස අබේසුන්දර මහතාගේ ගේ ඉදිරි පස තිබෙන වතුර වල සම්බන්ධයෙන් මම RDA එකටත් කතා කළා. ඔවුන් කියන්නේ සභාපතිතුමාට මේ සම්බන්ධව ඍජුවම සම්බන්ධ වෙලා කටයුතු කරන්න පුළුවන් කියලා. පාසල් ළමුන්ට ගමන් කළ නොහැකි තත්වයේ තමයි පවතින්නේ. ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ JCB යන්ත්‍රයක් යොදා පාර දෙපස කාණු කපා පිළිසකර කර දෙන ලෙසයි. අවහිර වුන පාරවල් 4 තියෙනවා.ඒ පාරවල් යථාතත්ත්වයට පත් කරලා දෙන්න කියලා ඉල්ලීම් කරනවා. මම ඊයේ දිනයේදි නායගිය ගෙවල් 28කට පමණ ගියා.ඒ වගේම ඊයේ දිනයේදි වසන්ත මන්ත්‍රීතුමා සමඟ ඇතිවුන ප්‍රශ්නයේදී ඔබතුමාගේ නිහතමානී ගුණය නිසා එම ප්‍රශ්නය වැඩිදුර නොගොස් නිරාකරණය වුන බව අපි දන්නවා. එය අපි අගය කරනවා. මේ ආයතනයේ සේවය කරන නිලධාරීන් සේවකයන් කිහිප දෙනෙක් හැර අනිත් අයගේ ඔබට අවනත නොවන බව පෙනී යනව. ඒ ගැන ඔබ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. පසුගිය කාලයේ මත් ජාවාරමක් නිසා අත්අඩංගුවට ගත් තරුණයා ඒකට සම්බන්ධ නොවන බව මම හොඳින්ම දන්නවා. ඔහුගේ ව්‍යාපාර කටයුතු දියුණු වන විට එය දරාගන්න බැරි කෙනෙක් තමයි මෙම චෝදනාව කරල තියෙන්නෙ. ඒ වගේ තරුණයින් අපි රැක ගත යුතුයි යන්න තමයි මගේ මතය. වසන්ත කුමාරගේ මහතා පැවසූ විදිහට පොහොට්ටුව පක්ෂයෙ අය නෙවෙයි ඔබතුමා හොඳටම දන්නවා කාට දේශපාලනය කරන අය ද දැන් ජාවාරම් කරන්නේ කියලා. අපි ඔය ජාවාරම්කරන කිසි කෙනෙක්ගෙ උදව් උපකාර අරගෙන නැහැ. ඒ ගෙවල් වලට පොලිසියෙන් යවන්න එපා කියලා අවසර දුන්නේ එසත් ජාතික පක්ෂ පාලරීමේන්තු මන්ත්‍රීවරු. ඔවුන්ගේ බයිසිකල්

බේරගන්න ඔබතුමාලගේ පක්ෂ අය තමයි පොලීසියට ගිහිල්ලා තියෙන්නේ. ඔබතුමා කියනවා මහින්ද මහත්තයාගේ කාලේ තමයි කුඹුරු ටික නැතිවෙලා තියෙන්නේ කියලා. 2015 වෂර්යේ සිට මේ වන විට කුඹුරු වලට වෙලා තියෙන දේ පේනවද? මහින්ද මහත්තයට දුන්න නම් මේ තියෙන ඔක්කොම ටික වැඩ කරාවි.චන්දිමා දිල්රුක්ෂි හත්මියගේ සහ කායර්ාලය අනෙකුත් නිලධාරීන්ගේ ශිෂ්‍යාත්ව විභාගය සමත් වූ දූ දරුවන්ට සුබ පතමින් මම මගේ කතාව අවසන් කරනවා ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරුනි දීසර් වශයෙන් ම කතා කලේ ගංවතුර හා පාලනය පිළිබඳවයි. සේරටම වඩා වෙලා තියෙන්නේ අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වියසනයක්. මේ මොහොත වන විටත් වියසනයක්. මම දකින විදිහට මේ වියසනය කරගත්තේ අපේම මිනිස්සු. ඉඩම් ගොඩ කිරීම පිළිබඳව මහජන ආයතනයක් හැටියට අපි මීට වඩා ඉදිරියේදී සැලකිලිමත් වෙන්න ඕන. අපේ සභාපතිතුමා ඒ වගේම මෙතන ඉන්න බොහෝ දෙනෙක් මේ ප්‍රදේශයේ අවුරුදු 10 ය,15 ව නැත්නම් අවුරුදු 50 හා 60 ජීවත් වෙච්ච උදවිය. ලංකා ඉතිහාසෙ පලවෙනි වතාවට තමයි යටලමත්ත ප්‍රදේශයේ අඩි හතක් උසට යටවුණේ. එහෙනම් මෙතන මොකක් හෝ වරදක් තියෙනවා. මේවා වැස්ස වලාහක දෙවියොත් නෙවෙයි, කාලගුණය නෙවෙයි, මේ සේරම වෙනස් කෙරුවා ගොඩකිරීම් තුල. පාරෙ යනකොට දෙපැත්ත බලාගෙන යන්න ගොඩකිරීම් කොපමණ තියෙනවද ඒක තමයි න්‍යාය ඉතිහාසය. ඒ නිසා අපි සභාවක් හැටියට ආයතනයක් හැටියට මේ පිළිබඳව සැමවිටම සැලකිලිමත් වෙන්න ඕන. ඒවගේම ගොඩනැගිලි හදනකොට කීදෙනෙක් අනුමැතිය අරගෙන ගිහිල්ලා තියනවද කියලා බලන්න. මම හිතන්නේ බොහොම ස්වල්ප දෙනයි එහෙම අනුමැතිය අරගෙන තියෙන්නෙ. එහෙම ආවනම් අපේ නිලධාරීන් එතැනට ගිහිල්ලා පරික්ෂා කරල බලනවා. මීට පස්සේ පළමුකොටම කරන්න ඕන වැඩේ තමයි අනුමැතිය දෙන කොට ඉඩම් ගොඩ කිරීම් එන කොට මේවා සොයා බලා නතර කිරීමට කටයුතු කිරීම අපේ වගකීමක් වෙනවා. ඒවගේම ඊයේ පෙරේදා ගංවතුරෙන් ගෙවල් හානි ඇරුනාම සිදුවුන ලොකුම වියසනය වුනේ ඌරල ප්‍රදේශයට. ජීවිත හානියක් සිදුවුනා. එහිදී අහිංසක අවුරුදු හැට එකක් වයස මනුස්සයෙක් කුලී වැඩට ගිහිල්ලා බස් එකෙන් බැහැල යනකොට අනපේක්ෂිත ලෙස ඌරල පල්ලෙහා දී ඒ පුද්ගලයා ජීවිතක්ෂයට පත්වුණා. ඒක දරාගන්න බැරි අහිංසක පුද්ගලයෙක් නිසා. නමුත් ආණ්ඩුව හැටියට තමුන්නාන්සේලා මේක මෙතනදි කියන්න තියෙන්නේ මේක අපිටමයි වෙන්නෙ. අපේ මේ වකවානුව තුළ කුණු කන්ද කඩා වැටුනා ගංවතුර ආවා පැවිල්ල ආවා කෝච්චි පෙරලුනා නොයෙකුත් විපත් දිගට හරහට වෙන්න පටන් ගත්තා. ඒ සැම දේකටම වතර්මාන ආණ්ඩුව හැටියට මම හිතනවා ලංකා ඉතිහාසයේ කවදාවත් මේ වගේ වැඩ කොටසක් මේ වියසන වෙලාවෙදි කර අරින්නෙ නැතුව ඉතාමත් නිහරීත ව ඉතාම ශක්තිවන්ත ඒවට මුහුණ දුන්නයි කියන එක කියන්න ඕන.අපි ඒක උනාට දහවල් 11.00 වෙනකොට ඒ මියගිය පුද්ගලයාගේ ගෙදරට ගිහිල්ලා රුපියල් ලක්ෂයක චෙක් පතක් ලබා දුන්නා. ඒකෙන් අපි සෑහීමකට පත් වෙනවා නෙවෙයි. ජීවිතයක් ලක්ෂයකට සීමා කරන්න බැහැ. නමුත් ජීවිත හානිය සිදු වුණු වෙලාවේ දිස්ත්‍රික් නායකයා හැටියට ස්වදේශ කටයුතු අමාත්‍ය වරයා ඒ කටයුත්ත සිදු කළා. ඒ විතරක් නෙවෙයි ඉතිහාසයේ අමතක කරන්න එපා මම හිතන විදියට අපේ ප්‍රදේශයට මේ වගේ ගංවතුර තුන හතරක් ආවා. 2003 මගේ වකවානුව තුළ ඊට පස්සේ පසුගිය ගංවතුර ආවා. නැවතත් මේ සුළු ගංවතුර ආවා. මම ඉතිහාස පොඩ්ඩක් මතක් කරලා දෙන්න ඕන. නැත්නම් වතර්මානයේ මේ ආණ්ඩුව මොනම දෙයක්වත් කළේ නැහැයි කියනවා. 2002 ඉදලා 2004 වෙනකම් එජාප ආණ්ඩුව තිබුණ 2003දී මහා ගංවතුරක් ආවා. ඒ වෙලාවේ ජනතාව වෙනුවෙන් දෙන්න ඕන සියලුම දේ ලබා දුන්නා. ඒ වගේම නිවාස හදා ගන්න ඉඩම් ලබා දුන්නා. මෙකේ එදා මම සභාපතිවරයා. ඇප්තොප් වත්ත බෙදලා දුන්නා. නිවාස හදන්න සල්ලි දුන්නා. ගෙදරට ඕනකරන සියලුම දේ ලබා දුන්න. ඊට පස්සේ පසුගිය දවස්වල මහා ගංවතුරක් ආවා.එතනදි නිලධාරීන් අතින් වරදක් වුණා. අපි ඒක හරිය කින්නෙ නෑ. මේ පැත්තට 75000 මේ පැත්තට 75000 මැද හිටිය මිනිහට රු.2500 ඒක අපි අනුමත කරන්නේ නැහැ. එදා ප්‍රාදේශිය සභාවක්

ක්‍රියාත්මක වුණේ නැහැ. මහජන නියෝජිතයෝ හිටියේ නැහැ. සොයන්න කෙනෙක් හිටියේ නැහැ. නිලධාරීන්ට ඕන විදියට එදා කටයුතු කළා.අපි මොන ආණ්ඩුව තිබුණත් නිහර්යව කියනවා එහෙම වැරදි වුණා. ඉදිරියේදී මම හිතනවා අපි සියලූ දෙනාම පාට පක්ෂ දිහා බලන්නේ නැතුව. මහජන නියෝජිතයො හැටියට සෑම දේටම හඬක් නගන්න අපට අයිතිය තියනවා. මීට පස්සේ ඒ වගේ වරදක් උනොත් තමුන්නාන්සේලා අපි සියලූ දෙනාට මේ හයිය තියෙනවා. මේ දේ වැරදියි කියලා නිලධාරි ගාවදි මේක කතා කරන්න. ඒක තමයි ඇත්ත සිද්ධිය. ගංවතුර එනකොට ඇජ්තොප් එක එහෙන් බෙදුවා. අලුත් වත්ත බෙදුවා. මේ පැත්තෙන් ඌරල කොතේ ගොඩකන්ද බෙදුවා. මේවා බෙදුවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තුළ ඉඩම් විතරක් නෙවෙයි දුන්නේ නිවාස හදා ගන්න මුදල් දුන්නා. දැන් කතාවලින් කිවුනා සමහර උදවිය ගෙවල් වලින් යන්න කිව්වම යන්නේ නැහැ කියලා. ලක්ෂ දහයක් දොළහක් දෙන්නම් යන්න කියලා. නමුත් ඒ උදවිය ඉවත් වුණේ නැහැ කියලා. ඒක අපේ වරදක් නෙවෙයි. ඒක නිසා මේ සියල්ලට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වගකිව යුතු වන්නේ නැහැ. ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා ඉතිහාසෙට ගියොත් ඒ වකවානුව තුළත් මේ ගං වතුර ආවා හොඳටම කෑම ඕන්නම් සැමන් ටින් එකක් පාන් ගෙඩියක් රුපියල් 5000ක් දෙන්න ඇති. අද ලක්ෂ ගණන් දීලා තියෙනවා දැන් දක්ෂ 12 - 15 යි ගෙවල් හදනවා. මම තමුන්නාන්සේලාට අභියෝග කරනවා. හෙට ඉල්ලලා අස්වෙනවා. මේ වගකීමෙන් කියන්නේ තමුන්නාන්සේලා එක ගෙයක් හදල දීල තියෙනවද කියල බලන්න. ගංවතුර කීයක් ආවද මහින්ද මහත්තයාගේ කාලේ ලොකු ගංවතුර ආව සැමන් ටින් එකයි දීල තියෙන්නෙ. ඉතිහාසය අමතක කරන්න එපා. තමුන්නාන්සේලා ඔය වගේ කතා කිව්වේ ඊයේ පෙරේදා වැඩේ අසාථර්ක වෙනකොට යූඑන්පී කාරයෝ ගිහිල්ලා කිරි පැකට් වලට වස දාලා දුන්න කියලා. රස පරීක්ෂකවරයා කියනව මොන වසක්වත් නැහැ. තමුන්නාන්සේලට ජනතාව අඩු වෙනකොට ජනතාව ඉවත් වෙනකොට ඕවා තමයි කතා කරන්නෙ. මේ පිළිබඳව මම දීඝර් වශයෙන් කතා කරන්නේ නැහැ. අපි මේ ව්‍යසනයට උත්තර හොයමු. අපි ගිය ආණ්ඩුවත් මේ ආණ්ඩුවත් කරපු දේවල් නෙවෙයි ඉස්සරහට කෙරෙන්න ඕන කටයුතු කරන්න ඕන. ඒ නිසා අපි සියලුදෙනාම යෝජනා කරනවා. මේ වගේ හිටිහැටියේ ව්යසනයක් ආවම එන්න පුළුවන් මන්ත්‍රීවරු ටික සභාවට කැඳවන්න. සියලු දෙනාගේ සේවය අරගන්න. එදා ඒ වෙලාවට මරණ මංචකේ ඉන්න මිනිහට යූඑන්පී කාරයෙක් ද ජේවීපී කාරයෙක් ද ශ්‍රී ලංකා කාරයෙක්ද කියල බලන්නෙ නැහැ. ඒ නිසා සියලු දෙනා අත්වැල් බැඳගෙන කටයුතු කරමු. එහෙම නැති වෙලාවට අපි වාද විවාද කරමු. ඒ වගේම මම තමුන්නාන්සේට කියනවා. මේ වන මල් මන්ත්‍රීතුමා ගැන දැන් කීප අවස්ථාවකදිම කතා වුණා. ව්‍යසනයක් උනහම දෙමව්පියෙක් ව්‍යසනයට පත් වුනහම වේදනාවට තමන් කතා කලේ මොකක්ද කියලා තේරෙන්නේ නැතුව ඇති. ඒ නිසා යම්කිසි වචනයක් එහා මෙහා වෙලා තියෙනවනම් ඒක පහර ගහන්න තරම් දෙයක් වෙන්නේ නැහැ. ව්‍යසනය වෙලා තියෙන්නෙ එයාගේ ඥාතියාට කොටින්ම කියනවා නම් එයා රැස්වීම් තියපු භූමිය ඒ වෙලාවට කොච්චර කෙරුවත් මදි. තමන්ගේ දෙමව්පියෝ නැති වෙච්ච වෙලාවට තමන්ට පණ දෙන්න පුළුවන් පන දෙනවා. ඒ වගේ ව්යසනයක් වෙච්ච වෙලාවක තමයි වනමල් මන්ත්‍රිතුමා මේ විදියට හැසිරිලා තියෙන්නේ. අපිත් ඔය වගේ අවස්ථාවලට පත් වෙනවා. ඊළඟට අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වා යෝජනා නම් අරගෙන තියෙනවා. නමුත් මොනම දෙයක්වත් නැහැ කියලා. ඒකත් සභාපතිතුමා කරන්නේ අර පොඩි අය අඬනකොට සමහර අම්මලා කිරි ටිකක් හදල ගහනව සූප්පුව කටේ. එතකොට බඩ පිරෙනවා. ඔන්න පොහොට්ටුවේ කට්ටියට කිරිත් දාලා ගැහුව සූප්පුව. අපට සභාවදාට හුලං තියෙන සූප්පුවක් ගහනවා. අද කෑ නොගහා ඉඳපං කියලා. අපි ඒ සූප්පුවා ඉරුවට මුකුත් එන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේට මම කියනවා. පොඩ්ඩ පොඩ්ඩ හරි මේ දරුවන්ටත් කිරි උගුර උගුර හරි ලබාදෙන්න කියලා. අවුරුදු හතරක් තමුන්නාන්සේත් එක්ක මේ ගමන අපට යන්න තියෙනවා. ඒක ශක්තිමත් කරගන්න කිරි උගුර උගුර හරි මේ දරුවන්ටත් දෙන්න කියලා. තමුන්නාන්සේලා ආඩම්බර වෙන්න ඕන. බලන්න අද පත්තරයක් අරගෙන සභාපතිවරයාට විරුද්ධව කොච්චර නැගිටිනවද කියල. වතුර බෝතල් වලින් ගහගන්නවා. අපට නම්

ලැජ්ජයි එහෙම නගින්න. ඒ වගේ උගත් භාවයක් තියෙන පිරිසක් මෙතන ඉන්නෙ. මම දකින්නේ 1992 ඉඳලා විසිවෙනි අවුරුද්ද විතර ප්‍රාදේශීය සභාවෙ කවදාවක්වත් එවැනි සිද්ධියක් නාගොඩ වුණේ නැහැ. ඒ ගැන අපි ආඩම්බර වෙන්න ඕන. අපි රණ්ඩු වෙනවා රණ්ඩුවෙල එළියට බහිනවා. නමුත් කවදාක්වත් වතුර බෝතලයක් නෙවෙයි කඩදාසි කෑල්ලකින් වත් අපි ඉලක්ක කරලා නැහැ. ඒ නිසා අපි සන්තෝෂ වෙන්න ඕන. එහෙම නම් සභාපතිතුමා ඔබතුමාට වගකීමක් තියෙනවා. මෙවන් දරු පිරිසක් තමුන්නාන්සේට විතරක් නෙවෙයි හැම අම්ම තාත්තටම හම්බ වෙන්නේ නැහැ. මේ ටික ආරක්ෂා කරගන්න ඕන. එහෙමනම් හිස් සූප්පුව ගහන්න එපා. ඊළඟ සභා වෙනකොට මේ දොළොස් දෙනාට කිරි උගුරක් පොවල තියන්න. ඉතිං මීට වැඩිය මම තමුන්නාන්සේලාට වැඩිය කාලය ගන්නේ නැහැ. අර තෙල් ගෑස් කතාවකුත් කවුද කිව්වා. ඉතිහාසයේ අමතක ඇති රාජපක්ෂ පාලන කාලය ගැන අපි තවම එතනට ආවේ නැහැ. බොරතෙල් බැරල් එක 500 ට ගිහිල්ල හරි රු.100 ගිහිල්ලා හරි ලංකාවේ පාරිභෝගිකයට ඒ පාඩුව දරාගෙන අපට ඩීසල් ටික පෙට්‍රල් ටික ගෑස් ටික දෙනවා නම් අපට එච්චරයි ඕන. ඒක තමයි තාම ගෑස් එතැනට ගියේ නැහැ. මේ අපේ මන්ත්‍රීවරියො දන්නවා ගෑස් එක තිබුණේ කීයටද කියලා. ඒ කාලේ රුපියල් 2500 යි තාම එක්දහස් ගානයි. තව රුපියල් හත්සීයක් ඉතුරු වෙනවා. ඉතිහාසයේ ඩීසල් මිල අඩුකරන්න කියලා කිව්වා ඒත් අඩු කලේ නෑ. ඒවෙලාවෙ උසාවිය තීන්දුවක් දුන්නහම මොකද කළේ අග්‍රවිනිශ්වයකවරියත් ගෙදර යැව්වා. ඒ වගේ ආණ්ඩුවත් තමයි තිබුනේ අද ප්‍රජාතන්ත්‍රවාදයත් තියෙනවා.පොලිස්පතිගෙ වැරුද්ද මොකද්ද පොලිස්පති යවන්න අවශ්‍ය නැහැ. තමුන්නාන්සෙල එක එක විදියට එක එක පුද්ගලයන් දකිනවා. මේ සභාපති වරයා දකිනවා අපේ මේ සභාවතුල හතර පස් දෙනෙක් හිටිය එක එක්කෙනාගෙ දශර්න තියෙනවා. මෙතුමා දකිනකොට කියන්න පුළුවන් දුවර්ල සභාපති කෙනෙක් කියලා. එයා අතපය විසි කරන්නේ නැහැ.එයා අතනයි මෙතනයි ගිහිල්ලා කායර්ාල කඩන්නෙ නැහැ. එතුමා බොහොම හික්මීමෙන් වැඩගන්න පුද්ගලයෙක්. ඒ වගේම මෙයා සින්දු කියන්න පුළුවන් වේදිකාවට ගිහිල්ල. බයිලා කාරයෙක් කියන්න පුළුවන්. තව තැනකට ගිහිල්ලා තව විදිහකට හැසිරෙන පුළුවන්. එක එක එක්කෙනාගෙ ජාන වල හැටි අපි දැකල තියෙන සමහර පොලිස්පති වරුන්ට සාමාන්‍ය මිනිහෙකුට කෙට්ටු වෙන්න බැහැ. සාමාන්‍ය මිනිහෙකුට ඇහුම්කන් දෙන්නේ නැහැ. මේ පොලිස්පති වරයා සරල පුද්ගලයෙක්. ඒ නිසා හැමදේම ලසු කරන්න එපා.මම මීට වැඩිය කාලය ගන්නේ නැහැ.ඒ කතා ඇති අන්න ගලනවකවුරුත් එක්ක ඒකට සූදානම් වෙමු. අපි සල්ලි දාල හරි ව්‍යසනයක් උනොත් අපි ප්‍රාදේශීය සභාවේ කෑම ටික උයලා බෙදන්න කියලා යෝජනා කරනවා. තමුන්නාන්සේලා සියළු දෙනා වෙනුවෙන් පාට පක්ෂ බලන වෙලාවක් නෙවෙයි මේක. ගිලිලා මැරෙනකොට අනේ මම යූඑන්පී කාරයෙක් කියලා ශ්‍රී ලංකා කාරය බලන් ඉඳීද?මම ගිලුනොත් තමුන්නාන්සෙල පැනලා ගන්නවා. මේක තමයි සිංහලයාගේ හදවත. ඊළඟට මම අර ෆොටෝ කතාවක් මේ මගේ ෆෝන් එකෙනුත් ගහන්න බැහැ. ඇයි දෙයියනේ සභාපතිතුමා මම දැන් ගංවතුර යනකොට මේකෙන් ෆොටෝ ගහන්න පුලුවන්ද? දැන් ඔය පිළිබඳව අපි දුරකථනයෙන් ඇහුවා ගරු සභාපතිතුමනි එහෙම එකක් තියෙනවා නම් දෙන්න කියලා කියලා තියෙන්නේ. මේකට විරුද්ධ නිසා ඇහුවේ මේක නිවැරදි විය යුතුයි. මොන රාජ්‍ය නිලධාරියා ගිහිල්ලා කිව්වත් මෙහෙ අපේ නෙළි මන්ත්‍රීතුමිය ගංවතුරට අහුවෙලා පාවෙනවා ෆොටෝ ගහන්න පුලුවන්ද? ඒ නිසා ඒ වගේ දුවර්ල වචන පාවිච්චි කරලා එයාලා කියනවා නැහැයි කියලා. එහෙම දෙයක් තියෙනවා නම් ඉදිරිපත් කරන්න කියලා තියෙනවා. ඒ වචන මම හිතන්නේ නිවැරදි විය යුතුයි. ඒ නිසා බය වෙන්න එපා ෆොටෝ එකක් ගැහුවේ නැතුවට ඒ වගේම අපේ චන්දි මන්ත්‍රී තුමියගේ අපේ අවන්ත මහත්මයගේ අනිත් දෙපළ කවුද කියලා කියන්න මම දන්නේ නැහැ.ඒ අයගෙ දරුවන් ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වීම ගැන සතුටු වෙනවා. ඒ දරුවෝ මේ ප්‍රදේශයේ නම් මේ සභාවට ඇවිල්ලා අර පුටුවෙන් වාඩි වෙන්න වාසනාව ලැබේවා කියා මම ප්‍රාථර්නා කරනවා. ඉතිං හොඳ පුරවැසියෙක් වෙලා රටට ජාතියට වැඩදායක දරුවෝ හතර දෙනෙක් හදලා තියෙනවා. ඒ ගෞරවය අම්මලා හා තාත්තලා හතරදෙනාටත් පුද කරනවා. මේ වෙලාවේ තමුන්නාන්සේලා අපි දීසර් වශයෙන් සාකච්ඡා කළා.

ඉදිරියෙදි හෙට දවසේ වෙන්න ඕන දේ අපි කරමු කියන පණිවිඩය දෙන ගමන් මුන්නාන්සේලා සියලු දෙනාට එවැනි ව්‍යසනයකට මුහුණ දෙන්න ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාථර්නා කරනවා. තමුන්නාන්සේලාට ජයවේවා. තමුන්නාන්සේලාට තවදුරටත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තුළ ඉඳගෙන මේවා වැඩි වැඩියෙන් බෙදලා දෙන්න හැකියාව ලැබේවා කියා ප්‍රාථර්නා කරනවා. ඒ වගේම ගාල්ල දිස්ත්‍රික් නායක එක්සත් ජාතික පක්ෂයේ ස්වදේශ කටයුතු අමාත්‍යවරයාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මොකද සෑම ගංවතුර අවස්ථාවකදිම උදුරගෙන ඇවිල්ල මෙහේට සල්ලි දුන්න. නමුත් ආපසු හැරිලා බලන්න මේ ශාලාවල් වල ඉඳගෙන කෝටි ගණන් බෙදුවා. ඒකේ අඩුපාඩු සිදු වුනා. මේ ගංවතුරටත් එතුමාගේ දෙනෙත් හැර මේ ගංවතුරත් සාමාන්‍ය දෙයක් හැටියට සලකා සියලු දෙනාට ඒ ශක්තිය තුළින් ආධාර කඳක් ගලාගෙන එනවා කියලා කියමින් මේ රජයෙන් ලැබිය යුතු සෑම දෙයක්ම ලැබෙනවා කියා කියමින් තමුන්නාන්සේලාට ජය ප්‍රාථර්නා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාගේ අවසරයි. මම පළමුවෙන්ම කතා කරන්න ඕන. පහුගිය දින විශේෂයෙන් අපේ ගමට, යටලමත්තට විශාල ව්‍යසනයක් වුණා. ඒ අවස්ථාවේ ව්‍යාපාරික ප්‍රජාව මගෙන් ඉල්ලා සිටියේ ඒ පිළිබඳ ඔබතුමා ඇතුළු කායර් කායර් මණ්ඩලයට ස්තුති කරන්න කියලා. අපි දැක්කා ගරු සභාපතිතුමා ඔබතුමා බොහොම මහන්සි වෙලා ඒ පිළිබඳව සොයලා බලලා කටයුතු කරනවා. කවුරු මොනව කිව්වත් අපේ සභාවේ බවුසර් රථය ලබාදුන්නා. ඒ වගේම සියලුම සේවක මහත්වරු ගිහිල්ලා බොහොම කැපවීමෙන් වැඩ කරලා සභාවෙන් ඉතාම වටිනා සේවයක් අපේ ගමට සිදු කරලා දුන්නා. පොඩි පොඩි අඩුපාඩු කම් ගැන මටනම් අහන්න ලැබුනේ නැහැ. කිව්වේ හොඳ තමයි. ඒ නිසා ගරු සභාපතිතුමා ඇතුළු උදව් උපකාර කල සියලුම සේවක මහත්වරුන්ට, ඒ වගේම ඒ වාහන වල රියදුරු මහත්වරුන්ට අපේ ප්‍රදේශයේ ජනතාවගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම ඒ ජනතාවට ඇඳිවත පමණයි ඉතුරු වුණේ. ඉතිහාසයේ කවදාවත් නොමැති විදියට වතුර ගැලුවා. සහබන්දු මහත්මයා කිව්ව වගේ ගෙවල්වල අඩි හතක් වතුර තිබුණා. ව්‍යාපාර තමන්ගේ දේවල්, තමන් හම්බ කරපු දේවල් පාවෙනවා බල බලා පින්තූර ගන්න මිනිස්සු ලෑස්ති වෙලා හිටියෙ නැහැ. ඒ නිසා ඒ පින්තූර කතා, විහිළු කතා වැඩක් නැහැ. අපි නිලධාරි මහත්වරුන්ට කියනවා. ඒ පිළිබඳ සොයන්න බලන්නේ නැතුව විපතට පත්වූ ජනතාවට උදව් උපකාර කරන්න කියලා. ඒ වගේම අපේ උපසභාපතිතුමන් ගිහිල්ලා අපට උදව් කළා. එවගේම උඩලමත්ත පන්සලේ හාමුදුරුවොත් එක්ක ගිහිල්ලා ගරු උප සභාපතිතුමන් යටලමත්ත ප්‍රදේශය ගැන සොයා බැලුවා. ඒ පිළිබඳවත් සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තුති කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මතක් කරනවා යටලමත්ත ප්‍රදේශයේ ඇල වගර් පිළිසකර කරන්න. ගොඩ කිරීම නිසා යම් දේවල් ඇතිවෙලා තිබෙනවා. ඒ ඇළ මාගර් සුද්ද කරලා පුළුවන් සහයක් ලබා දෙන්න කටයුතු කරන්න. ඒ වගේම ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමා කතා කළා. එතුමා කිව්වා බෝට්ටුවක් ලබාදෙන්න කියලා. අපිටත් විශේෂයෙන් අවශ්‍යතාවයක් තියෙනවා බෝට්ටුවක්, ආරක්ෂක කට්ටලයක් ගැන. මොකද අපට  බහින්න බෑ වතුර ගැලුවාම අපිත් හොඳටම කෙට්ටු වෙනවා. ඒ නිසා අපට ඒ සහන ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වගේම දිල්රුක්ෂි මන්ත්‍රීතුමියගේ දරුවා ඇතුළු ශිෂ්‍යත්වය සමත් සියලු දරුවන්ට සුබ අනාගතයක් ප්‍රාථර්නා කරනවා. ඒ වගේම අපේ යටලමත්ත ව්‍යසනය වෙලාවේ නොයෙක් අයුරින් කටයුතු කරපු, හිටපු මන්ත්‍රී සඳුන් ජයවිරාජ් ගුරුසිංහ මන්ත්‍රීතුමා මැදිහත්වෙලා කටයුතු කළා.  අපේ ගමේ අයට උදව් උපකාර කළ සියලු දෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ සම්බන්ධව මේ මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙක් කතා කළ නිසා වැඩිදුර කතා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

ඒ වගේම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් අපේ වනමල් මන්ත්‍රීතුමා ගැන කතා කළා. ඒ අපේ සහෝදරයා. අපි ඒ ගැන වැඩිය කතා කරන්න අවශ්‍ය නැහැ. අනිත් මන්ත්‍රීවරු වගේ ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරයෙක් විදියට අපටත් හොඳ ආදශර්යක් දෙන විදියට හැසිරෙන්න කියලා මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. වනයක් නොවී වන මලක් වෙන්න කියලා කියනවා. ඒ වගේම අපිත් එක්ක බොහොම සහයෝගයෙන් කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමුන්නාන්සේලා අහගෙන හිටියා. අපේ සහබන්දු මන්ත්‍රීතුමා කතා කළා. කිරි පැකට් ගැන කතා කරනකොට මට මතක් වෙනවා. මාමනදොලේ ඇලේ වතුර ගලනවා. කටුපොල් අපද්‍රව්‍ය මිශ්‍ර කලා. ඒ ජලය බෝතලයක් අපි රස පරීක්ෂකට යැව්වම පරික්ෂා වෙන්නේ වෙන බෝතලයක්. ඉතින් ඒ වගේ තමයි අපි යවපු කිරි පැකට් එකක් නෙවෙයි, වෙන කිරි පැකට් එකක් තමයි පරික්ෂා කරලා තියෙන්නේ.

ගරු සභාපතිතුමනි ඔබතුමාට කියන්න තියෙන්නේ මාමලාදොලේ ඇලේ වතුර ගලන්න කලින් අපේ නෙලී මන්ත්‍රී තුමියත් දන්නවා. කටුපොල් අපද්‍රව්‍ය පිට කරලා ඇළට දැම්මම මාළු උඩ පැන්නා. කළින් දවසේ මාළු මතු වුණා. මේ වතුර ගලන අවස්ථාවේදී අපද්‍රව්‍ය මිශ්‍ර කරල තියෙනවා. බෙම්බඩ ප්‍රදේශයේ හා ඇල පහළ ප්‍රදේශයේ තේ වගාවට මෙන්ම අනිකුත් බෝග වලටත් දැඩි ලෙස හානි සිදු වෙනවා. එමෙන්ම සහබන්දු මන්ත්‍රීතුමා කිය ඒවට උත්තර දෙන්න වෙන්නේ. අපේ වටේ ඉන්න මන්ත්‍රීවරුන් කතා කරලා කියනවා. මේවට කියන්නේ නැත්තේ මොකද කියලා. මොකද ඔබ තුමා ගිය සභාවෙත් කතා කලා. ඔබතුමාලාගේ රැස්වීමට කිරි පැකට් දාහක් මදි වුනා කියලා. ඒ තරම් ජනතාව ආව කියලා මම දැක්කා. ඔබතුමාලා පෝස්ටරේ ගැහුවේ මේ ශාඛා සමිති රැස්වීම් වලට එන්න කියලා. පොල් පැල ,බැංකු ණය ලබාදීම ,වැසිකිලි ආධාර ලබාදීම, නිවාස ආධාර ලබා දීම ජයන කරුණු කියලා තමයි මිනිස්සු ගෙන්න ගත්තේ. තමුන්නාන්සේලා ශාඛා සමිති රැස්වීමට ගහන්නෙත් මේ පෝස්ටරයමයි.

ඒ වගේම පෙට්‍රල් මිල ගැන කතා කලා. ලෝක වෙළඳපොලේ ඩොලර් 125 ට තියෙද්දි තෙල් මිල වැඩි වෙලා තිබුනේ. අද තෙල් බැරල් එක ඩොලර් 70 යි. ගරු සභාපතිතුමනි අපි කරපු යෝජනා ඉටුකරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මම මේ කියපු දේවල් කියන්න සිදුවුණේ මෙතුමන්ලා කියපුවට මොනවහරි කියන්න ඕන නිසා. ඒ ගැන තව දුරටත් මම කතා කරන්න යන්නේ නැහැ. සභාපතිතුමනි අපේ ප්‍රදේශයේ දැන් වතුර ගලාගෙන එනවා. අර සහබන්දු මහත්මයා කතා කල වැදගත් දේවල් ගැන අපි කතා කරන්න ඕන. අපේ සභාවේ හරි කෑම ටික උයලා ජනතාවට ලබා දෙන්න කියලා හොඳ අදහසක් ආවා. අපි ඒක අහන්න ඕන. ඒ නිසා මීට පස්සේ ව්‍යසනයක් සිදු උනහම අපි සියලු දෙනා එකතු වෙලා යම් දෙයක් කරන්න කටයුතු කරමු. කෑම ටික හරි අපි භාරගෙන සභාවෙන් දෙන්න එතුමා කරපු යෝජනාව අගය කරනවා. ඒ වගේම අපේ මන්ත්‍රීතුමෙන්ලා සියලු දෙනාට සුබ අනාගතයක් ප්‍රාථර්නා කරමින්, ශිෂ්‍යත්වය සමත් දූ දරුවන්ට සුබ පතමින්, ඔබ සැමට ස්තූති කරමින් , මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී සුභාශි මධුමාලි මෙනවිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. පැවති අයහපත් වෂර්‍ාපතනය නිසා ගෝනලගොඩ කොට්ඨාශයේ, ගම්මැද්දේගොඩ කොට්ඨාශයේ නිවාස තිහක් පමණ මේ වන විට ජලයෙන් යටවෙලා ආපදාවට ලක් වෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි ගෝනලගොඩට පානීය ජල ක්‍රමයක්, මම පලවෙනි සභාවෙදි යෝජනාවක් වශයෙන් සභාවට ඉදිරිපත් කළා. ජනතාව පානීය ජලය නොමැතිකම නිසා දැඩි ලෙස පීඩාවට පත්වෙලා ඉන්නවා. එමෙන්ම අවුරුද්දකට හතර පස් වතාවක් ලිං යටවෙලා ජලය නොමැති වෙනවා. ඒවගේම තමයි ගඟේ ජලය අඩු මට්ටමකට බහින තුරු ලිං ඉස යථාතත්වයට පත් කර ගන්න බැරි නිසා, සති තුන හතර යනකම් පානීය ජලය නොමැති වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි , ජල යෝජනා ක්‍රමයක් ස්ථාපිත කරලා යම් ආකාරයකින් හරි සහනයක් ලබා

දෙන්න පුළුවන් නම් ඉතාමත් වටිනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, දැනට ගංවතුරෙන් පීඩාවට පත් වෙලා ඉන්න ජනතාවට ආහාර ලබා ගන්න ක්‍රමයක් ඇත්තේ නැහැ. හැම පැත්තෙන්ම ගංවතුරට කොටු වෙලා අපට ඒ මිනිස්සු බලන්න යන්න ක්‍රමයක් නැහැ. මම තමයි මුලින්ම ගං වතුරට කොටු වෙන්නේ. ඒ නිසා ලක්රුවන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට බෝට්ටු හරි යොදවලා යම්කිසි වැඩපිළිවෙළක් යොදවලා ඒ මිනිස්සුන්ට සහනය සලසා දෙන්න පුළුවන්නම් ගොඩක් වටිනවා. අපි පක්ෂ දෙකක් වශයෙන් ඒ පැත්තට මේ පැත්තට බෝලෙ පාස් නොකර ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දීලා කටයුතු කරන්න ඕන. ඒ මිනිස්සුන්ට අපි මේ වෙලාව කරන උදව්ව තමයි ඒක. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ වතුර තත්වය බැහැලා ගිහිපු ගමන් ම පානීය ජලය සඳහා මුළු ප්‍රාදේශීය සභාව ඇතුලත ලිං නිසියාකාරව ඉසීම සඳහා වැඩපිළිවෙලක් යොදලා පුළුවන් තරම් ඉක්මනට කරලා දෙන්න කියලා මම යෝජනා කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, ලේකම්තුමිය ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. පසුගිය දවසේ නාගොඩ ප්‍රාදේශීය බල ප්‍රදේශයේ වැඩිම හානියක් සිදු වුණේ යටලත්ත ප්‍රදේශයට. ඒක කිහිපදෙනෙක්ගේ කටින්ම කියැවුණා. නමුත් ඒ සියලු අයට අලාභ වන්දි ගෙවන්න තීරණය කරලා තියනවා. මම හිතන විදිහට මේ වෙනකොට ඇස්තමේන්තු සකසන්න කියලත් තියෙනවා. රජයක් හැටියට එක් කරන්න ඕන. කරන්න ඕන ක්‍රමවේද නිලධාරීන් අතින් අතපසු වුනත්, රජයක් හැටියට එම කටයුතු වගකීමෙන් බාර අරගෙන දිස්ත්‍රික් නායක වජිර අබේවර්ධන මැතිතුමා ස්වදේශ කටයුතු ඇමැතිවරයා හැටියට ඔහුට අයිති නැති, අදාල නොවන විෂයක් හැටියට ඔහු කරන මේ සේවයට මම පළමුකොට ම එතුමාට ස්තූතිවන්ත වෙනවා. ඊයේ උදේ පැවැති රැස්වීමේදී සියලුම ජනතාවට සහන දෙන්න ඕන කියල තීරණය කළා. මෙතන ඉන්න ඔබ මොනවා කිව්වත් වෙන්න ඕන දේ වෙනවා. ඉතිහාසයේ ගෙයකට ලක්ෂ දහසයක් දීලා නැහැ. රුපියල් විසි දාහක මුදලක් වගේ තමයි දීල තියෙන්නෙ. මේ සැරේ තමයි ගෙයක් ගන්න, ගෙයක් හදාගන්න ලක්ෂ දාසයක මුදලක් දීල තියෙන්නෙ. ඒ සඳහා මේ රජය ඇස්තමේන්තු කරලා කටයුතු කරල තියෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි සභාවක් හැටියට ඔබ වියදම් කල මුදල මම දන්නේ නැහැ. නමුත් මේ වෙනකොට ගංවතුරක් වෙලානම් තෙල් වලට විතරක් අපි ලක්ෂ තුනක් හතරක් වියදම් කරලා ලාම්පුතෙල්, පෙට්‍රල්, ඩීසල් අරන් දීලා තියෙනවා. වෙන ගංවතුරකදී වගේ අදාළ ප්‍රදේශයේ පාන් ගෙඩියකින් රුපියලක් වත් වංචා කරන මන්ත්‍රීවරු මෙතන නැහැ. නමුත් වෙන ගංවතුරක් වෙලාවේ අදාළ බල ප්‍රදේශයෙන් මොනවහරි විපතකට පත් වෙලා ඉන්නවානම්, ඒ අයට පිටි ටික, පාන් ටික අරගෙන දෙන්න මේ මන්ත්‍රීවරු කිසිම මිල ගන්න කැඳවන්නේ නැතුව, එතන තියෙන බේකරියෙන් අරගත්තා. මේවයේ බිල ගෙවන්න සාමූහිකව කවුරුත් අත ඉස්සුවා. පතික්ෂේප කළේ නැහැ. උදාහරණයක් විදියට මෙතන ඉන්න කවුරුහරි, අපි හිතමු ධමර්සිරි මන්ත්‍රීතුමාගේ ඒ ප්‍රදේශයේ පිරිසක් යට වෙලා ඉන්නවා. කිසි ප්‍රශ්නයක් නැහැ. පාන් ගෙඩි සීයක් දෙසීයක් ගෙනැල්ලා, ඒ මිනිස්සුන්ට බෙදලා දෙන්න. මන්ත්‍රීවරයෙක් හැටියට ඔබේ ආත්ම ගරුත්වය බේරගන්න කටයුතු කරන්න. මේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ට සභාවේ බිලක් ගෙවන්න හයිය තියෙන්න ඕන. මගේ ගමේ මන්ත්‍රීවරු දෙපලක් ඉන්නවා. තව මම ඉල්ලන්නේ නැහැ. සුසන්ත මන්ත්‍රීතුමාගේ ගම යට උනා සභාවෙන් මොකුත් දුන්නෙ නැහැ. යටලමත්ත යටවුනා. සභාවෙන් මොකුත් දුන්නෙ නැහැ. නමුත් වෙනදා මේකෙ පෙට්‍රල්, ඩීසල් වලට ලක්ෂ ගණන් ගෙව්වා. බෝට්ටු එන්න සල්ලි ගෙව්වා. ඒ නිසා ගරු සභාපතිතුමාට අපි මතක් කරනවා. යමක් කරන්න තියෙනවා නම් පැකිලෙන්නෙ නැතුව ජනතාව වෙනුවෙන් වැඩ කරන්න. අඩුම තරමේ ඔබට තක්සේරු කරලා මිල මුදල් ගෙවන්න බැහැ. ඇතැම් වෙලාවට ගෙපල් ඇදල දෙන්න බැරිවෙයි. නමුත් ගේ අයිනටම කණ්ඩියක් ඇවිල්ල තියෙනවා නම් ඒ පුද්ගලයා ගැන සලකලා බලලා හරි, මොනවහරි කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. අපේ ධනංජය මන්ත්‍රීතුමා

ඉල්ලීමක් කරා, ඇත්තටම කරගන්න බැරි තත්වේ මිනිස්සු ඉන්නවනම් ඒ දේ කළ යුතුයි කියලා මම කියනවා. සුසන්ත මන්ත්‍රීතුමාත්, අජිත් මන්ත්‍රීතුමාත් කිව්වා වගේ මේවා විය යුතු නම් අපි ඒවා කළ යුතුයි. ඔබේ හිතවත් කෙනෙක් කියලා අනිත් කෙනා හිතවත් නැහැ කියලා කරන්නේ නැතිව ඉන්න එපා. යමක් කරකියාගන්න දෙයක් නති කෙනෙක් ඉන්නවනම්, සභාවක් හැටියට අපි ඒ උදව්ව කළ යුතුයි. ඒ මනුස්සයගෙ ජීවිතයට තජර්නයක් වෙලා තියෙනවානම්, ඒ මනුස්සයාට තව තැනක ගිහිල්ලා ඉන්න බැරිනම්, මේ ගේ ඇතුලේ ඉන්න පුළුවන් වෙන්න අඩුම තරමේ වතුර ගේ ඇතුලට නොයන තත්වෙටවත් සකස් කරල දෙන්න. ස්කෙවේටර් එකක් දාල හරි සකස් කරල දෙන්න පුළුවන් තත්වයක් මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට තියෙන්න ඕන. ඒ පිලිබ ඔබතුමාගෙ අවධානය යොමුකරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි සභාපතිතුමනි, ඊයේ රැස්වීමේදී තීන්දුවක් ගත්තා යුද හමුදාව දාලා සියලුම අනතුරුදායක ගස් ඉවත් කරන්න කියලා. ලේකම්තුමියට මම කියනවා. ඉක්මනටම මේ නිලධාරින් දාලා කැපිය යුතු ගස් ටික මොනවද කියලා හඳුනගන්න. ඒ අයට කපා ගන්න බැරි තත්වයක් තියෙනවා නම් යුධ හමුදාවට දන්වන්න. ඒ ලේඛන ටික අපට දෙන්න. ස්වදේශ කටයුතු අමාත්‍ය වජිර අබේවධර්න මැතිතුමා හරහා ඒ කටයුතු සිදුකරලා දෙන්නම් කියලා මම පොරොන්දු වෙනවා. මොකද මේ වෙනකොට අපේ නිලධාරීන් ගස් බලන්න යන්නේ නැහැ කියලා තියෙනවා. දැන් කණ්ඩි හොඳටම පෙගිලා තියෙන්නෙ. ඒ නිසා අනිත් විෂයන් අත්හැරලා මේ අන්තරාදායක ගස් ටික විශේෂයෙන් මේ දවස් දෙක තුන ඇතුළත ඉවත් කළොත් හොඳයි කියලා හිතනවා. මොකද ඇතැම් ගස් රක්ෂිතවල තියෙනවා. ඇතැම් ගස් වලට බෙදුම් නඩු තියෙනවා. මේ විපතත් එක්ක ඒ සියල්ල අමතක කරලා මේ වෙලාවේ ඒවා ඉවත් කරන්න පුළුවන් ශක්තියක් තියෙනවා. ඒක නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරලා අදම ක්‍රියාත්මක වුනානම් හොඳයි කියලා මම හිතනවා. ගෙවල් වල තියෙන ඒ සියලූ ගස් ඉවත් කරන වැඩපිළිවෙළක් ඉක්මනින් කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ඉඩම් ගොඩ කිරීමේදී බැහැර වෙන්න එපා. මොනව වුණත් අපි නීතිය ක්‍රියාත්මක කරන්න ඕන. මේ යටලමත්ත ජල ගැල්මකට හසුවුනේ අක්‍රමවත් ගොඩකිරිම් වල ප්‍රතිඵලයක් හැටියට. නැත්නම් මෙච්චර යටවෙන්නෙ නැහැ. අපේ හිතවත්කම් තිබුණා අපි සද්ද නැතුව ඉන්නවා. ඔබේ හිතවත්කම් තිබුණා ඔබ සද්ද නැතුව හිටියා. ඒකෙ ප්‍රතිඵල අපි සියලු දෙනා භුක්ති වින්දා. ඒ නිසා කවුරු හිතවත් වුනත්, කවුරු අහිතවත් වුනත් නීතියක් තියෙනවා නම් නීතිය ක්‍රියාත්මක කරන්න. මොනව හරි ක්‍රමවේදයක් හදන්න ඕන. පසුගිය කාලේ අපේ විජිත් සහබන්දු මහත්තයාගේ ගේ අද්දර ඉඩමේ නඩු තීන්දුව දුන්නේ ගොඩ ඉඩමක් කියලා. කුඹුරට , ගොඩ ඉඩමක් කියලා තීන්දුව දුන්නා. ඒ නිසා ඒක ගොඩ කරත්, මොනවා හරි හැදුවත් නීතිය ක්‍රියාත්මක කරන්න බැහැ. මේ රටේ නීතිය මෙන්න මේ තත්වෙට ගිහිල්ලා තියෙනවා. ඒ යාය කවුරුහරි ගොඩ කළොත් මුළු යටලමත්තම විනාශ වෙනවා. එනිසා මේ වගේ අවස්ථාවලදී මොන නීති තිබුණත් අපට යම්කිසි පාලනයක් කරන්න පුලුවන්නම් හොඳයි. ඒවා ගොඩ කළොත් වෙන දෙයත් දන්නවා. මේවා කිව්වම අපිත් එක්ක පෞද්ගලිකව තරහා වෙයි. බෙම්බඩ යායටම බෙදුම් නඩු තීන්දුව දෙන්නෙ ගොඩ ඉඩම කියලා. ඉදිකිරීම් සිදු කළොත් කිසිම සමාවක් හම්බවෙන්නෙ නැහැ. ඌරල පහල යටලමත්ත ඉස්සෙල්ලා විනාශ වෙනවා. එනිසා මේවායේදී කොළඹින් හරි ඒ දෙන තීන්දු වලදී ගමේ මිනිස්සු ඒ පිළිබඳ අවධානයක් යොමු වුණේ නැහැ. ඒ නඩු දාන උදවියගේ බලපුළුවන්කාරකම් හෝ තන්හාව පිලිබඳ ප්‍රශ්නයක් එක්ක මේවයි තීන්දු ගන්නවා. අන්තිමට රටක් හැටියට, ප්‍රදේශයක් හැටියට ජනතාව අමාරුවට පත්වෙනවා. ඒ වගේම අපේ ගයාන් මන්ත්‍රීතුමා මත්ද්‍රව්‍ය පිළිබඳව කතා කලා. ගරු මන්ත්‍රීතුමනි, මගෙත් මත් ද්‍රව්‍යයවලට පෞද්ගලිකව දැඩි විරෝධයක් තියෙනවා. අපේ මේ ප්‍රදේශයේ නොවේ. කොහේ තිබුණත්, අපේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. නමුත් මන්ත්‍රීතුමා දන්නේ නැතිව ඇති නාගොඩ ප්‍රාදේශීය සභාවේ මේ මත්ද්‍රව්‍ය වලට වැඩිම ප්‍රමාණයක් නිත්‍යානුකූල බලපත්‍ර ලබා දීලා

තියෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයා ඉන්න කාලේ. එතකොට මේ ඉන්න නායක හාමුදුරු කවුරුවත් ඒකට විරුද්ධ වුනේ නැහැ. එක හාමුදුරුවෝ නමක් මස් කඩයට විරුද්ධ වුණා. එතන එහා පැත්තෙ දාන වයින්ස්වලට, බාර් වලට විරුද්ධව කට ඇරියේ නැහැ. ඉතින් ඒවට කනගාටුවෙනවා. අපි එදත්, අදත් විරුද්ධයි. ඔබතුමා නොදන්න නිසා තමයි මතක් කිරීම සිදු කළේ. යටලමත්ත ප්‍රදේශයට සිදුවන හානිය වෙනුවෙන් මගේ කනගාටුව ප්‍රකාශ කරමින්, ඔබතුමා යම් සේවයක් කළා නම් ඒ ගැන අගය කරමින්, යටලමත්ත ජනතාවට රජයෙන් කරන්නාවූ සියලුම සහනාධාර සියල්ල ලබාගන්න එතුමන්ලාට උපරිම සේවයක් ලබා දෙනවයි කියලා විශ්වාසය මා සතුව තියෙන බැවින්, සියලු දෙනාට සුභ දවසක් කියල ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

තුමා ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. මේ තද වෂර්‍ා තත්ත්වයත් එක්ක අපේ ගම් ප්‍රදේශවලටත් ආපදා තත්ත්වය පැන නැගිලා තියෙනවා. විශාල පස් කඳු කඩා වැටීම් එක්ක ගෙවල් කඩා වැටීම් විශාල ප්‍රමාණයක් සිදු වී තියෙනවා. අපි සභාවක් හැටියට ඒ අසරණ වුණ මිනිස්සුන්ට මොනව හරි කළ යුතුයි. ඒ නිසා අපි කළ යුත්තේ මොනවද කියල මම ගරු සභාපතිතුමා ගෙන් දැනගන්න කැමතියි. ඒ වගේම මේ සම්බන්ධව ග්‍රාම නිලධාරීන් දැනුවත් කරලා තියෙනවා. ඒ වුනත් අපි සභාවක් හැටියට අපේ ජනතාවට මොනවහරි කළ යුතුයි. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම තල්ගස්වල පොල ගැන විශේෂයෙන්ම අපේ මන්ත්‍රීවරු පෝස්ටර් මගින්, පින්තූර මගින් දැනුවත් කරන්නේ එහි සත්‍ය ඔප්පු කිරීම සඳහා. මම එහෙම කරන්නේ ඔබතුමාට නිගරු කිරීමට වත් ඔබතුමාව අපහසුතාවයකට පත් කිරීමට වත් නෙවෙයි. මෙහි සත්‍යතාව ඔප්පු කිරීම සඳහා තමයි මම මෙහෙම කරන්නෙ. ඉතින් තල්ගස්වල පොලේ විශාල කුණු කන්දක් තියෙනවා. ඒ වගේම එතන සුදු පොළක් තියෙනවා. ආරක්ෂිත ගේට්ටුවක් ඇත්තෙත් නැහැ. එදා මම ඒ ස්ථානය ඉතින් නිරීක්ෂණයට ගිය අවස්ථාවේ පොළ ඇතුලේ කොටසක් මත්ද්‍රව්‍ය ගන්නවා, කොටසක් බුරුවා ගහනවා. ඉතින් මම නම් දකින්නේ මේ දේවල් වෙන්නේ එතන ආරක්ෂාවට හේතුවක් නැති නිසා. අපේ සභාවට තමයි ඒකෙ අපහාසය, චෝදනාව ලැබෙන්නේ. අපේ මන්ත්‍රීවරුන්ටත් සභාපතිතුමාටත් ඒ නිසා මම ඩිජිටල් පෝස්ටරයක් මගින් සත්‍යතාවය හෙළි කිරීමට තමයි මෙය ඉදිරිපත් කළේ.

ඒ වගේම තමයි. මම හැමදාමත් කියනවා. මම දැන් සභාවට ඇවිල්ලා මාස හයක් විතර ගතවෙනවා. සභාපතිතුමා කොහේට හරි උත්සවයකට ගියත් මම හැමදාම අපට ලයිට් ටික දාල දෙන්න කියලා මම සභාපතිතුමාට කියනවා. ලයිට් ටික දාන්න විදියක් නැත්නම් මම මගේ මේ සැරේ මන්ත්‍රී දීමනාවෙන් බල්බ් අරන් දෙන්නම් සභාවෙ කාමරීක නිලධාරි යොදවලා අපට කරල දෙන්න. ඒත් තාමත් නැහැ. ප්‍රදේශයේ විශාල ලෙස දළු වැන් යනවා. එයින් හැන්දෑවට දළු හොරකම් සිදුවෙනවා. මත්ද්‍රව්‍ය නිසා තැන්තැන්වල අනිසි දේවල් විශාල ප්‍රමාණයක් සිදු වෙනවා. ඒ නිසා තමයි මම ඔබතුමාගෙන් ඒ ලයිට් ටික දාලා ඉල්ලන්නේ. ඉතින් මම කියන්නේ සභාවට ඇවිත් අපි මාස හයක් විතර වෙනවා. එතුමාට සභාවෙන් කාලසටහනක් දීලා තියෙනවා. මේ ස්ථානවල මේ මේ දිනවල වැඩ කරන්න කියලා. ඉතින් මේ මාස හයක් තිස්සේ එතුමා දවස දවස ගියත් අපේ බල ප්‍රදේශයේ සියලුම තැන්වල වැඩ ඉවර වෙලා තියෙන්න ඕන. ගෝණදෙණියේ ප්‍රධාන පාරේ ගියත්, අපේ අතුරුපාර අත්‍යවශ්‍යම පාරක්. ඒක ලයිට් ටික සැදීමට ඒ පාරට එන්නේ නැහැ. නිලධාරීතුමා දැනුවත් කරනවා එතුමගෙ මොනවහරි අකටයුත්තක් විදියට තමයි මම නම් දකින්නේ. ඇයි මොකද මෙච්චර මාස හයක් තිස්සේ එතුමට ලයිට් ටික දාගන්න බැරි වුණා. එක එක දවස ගියත් අප ප්‍රදේශයම ඉවර වෙන්න ඕන. ඒ මනුස්සයා දිනකට

බල්බ් දහයක් දානවනම්, එක දවසට දැන් කීයක් දාල තියෙන්න ඕනෙද? ඉතින් ඒ ගැන සභාපතිතුමාට අවධානය යොමු කරන්න කියලා කියනවා.

ඊළඟට පුස්තකාලයේ සේවය කරන මහත්මීන් අපේ මාපලගම පුස්තකාලය තාමත් තෙමෙන බව පවසනවා. මම වැසි අවස්ථාවක එම ස්ථානයට ගිය අවස්ථාවේදී ඒ බව දැක්කා. ඒ ගැනත් අවධානය යොමු කරන්න. අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා වහල හදලා තිබුනට, ඒක හරි ගිහිල්ලා නැහැ. ඒ වගේම මං හිතන්නේ පුස්තකාලයට, ආයුවේර්දයට සල්ලි වෙන්කරලා, අලුත් වැඩියා කරන කතාවක් කිව්වා. ඒ නිසා ඒ ගැන විශේෂයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. වතුර ප්‍රශ්නයක් තියෙනවා. එම ආයතනයට වතුර නැහැ. මේ වගේ ප්‍රශ්න තිබුණත්, දැන් කතා කරන්න අවස්ථාව නොවෙයි. මේ ආපදා තත්ත්වය නිසා දැනටත් වතුර ගලනවා. අපටත් යාගන්න පුළුවන් වෙයිද දන්නෙ නැහැ. ඒ නිසා මේ ආපදා තත්වයට මුහුණ දීම ගැන තමයි අපි කතාකළ යුත්තේ. ඉතින් වැඩි විස්තර කතා කරන්න තිබුණත් මම කතාව නතර කරනවා. මේ ආපදා තත්ත්වය ගැන විශේෂ අවධානයක් යොමු කරලා එයට සුදුසු ක්‍රියාමාගර්යක් ගමු කියලා යෝජනා කරනවා. ස්තුතියි ඔබ සැමට.

**ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම දැනගන්න කැමතියි මලාමුර පස් කන්දක් නායයාම පිළිබඳව දුරකථනයෙන් ඔබතුමාව දැනුවත් කළා. අදට දින තුනක් ගතවෙලා. මාගර්ය අවහිර වෙලා. ගමනාගමනය අපහසු වෙලා තියෙනවා. ඊයේ හවස් වන විටත් කිසිම ක්‍රියාමාගර්යක් අරගෙන නැහැ. ආර්. ඩී එකෙන් ඇවිල්ලා මුදල් නැති බව තමයි කියන්නේ. එනිසා ඔබතුමා විසින් මෙය වන විට ඒක පිළිසකර කර ගන්න ගෙන ඇති ක්‍රියාමාගර්ය කුමක්ද? ඒ වගේම මලාමුර ඇලමාගර්ය පිටාර ගැලීම නිසා සාමාන්‍ය වෂර්ාවකදී පවා ගෙවල් දහයක් විතර මේ වතාවෙ යටවුනා. ඇළ මාගර්ය දෙපස වල්බිහිවෙලා, ගොඩවෙලා. ඒ නිසා වතුර නිසියාකාරව බහින්න විදියක් නැහැ. ඒ ඇළ මාගර්ය හැකි ඉක්මනින්ම සුද්ද කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. කන්ද නාය යෑම නිසා මේ වන විට ගෙවල් 50 කට පමණ විදුලිය අහිමි වෙලා තියෙනවා. අදට දින 3කට අධික කාලයක් වෙනවා. ඉදිරියටත් තව දින කීයක් මේ තත්ත්වය පවතී ද කියලා කියන්න බැහැ. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාගර්ය පිළිබඳව, ඔබතුමාගේ කතාවෙදි දැන ගන්න කැමතියි. ඒවගේම මගේ දරුවාට සුභපැතීම පිළිබඳව සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. මම ප්‍රථමයෙන්ම අපේ කොට්ඨාසයේ මන්ත්‍රීතුමා ලෙස කටයුතු කරන චන්ද්‍රසිරි වනිගරත්න මැතිතුමා ඉදිරිපත් කරපු සියලුම අදහස් හා යෝජනා අනුමත කරනවා. මේ වෙලාවේ ඒව කෙරෙන්න අවශ්‍ය කාරණා. ඊට අමතරව ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාට සභාවේ මන්ත්‍රීවරුන් හැටියට ස්තූතිවන්ත වෙනවා. මොකද වායු සමන යන්ත්‍රය ලබා දීම වෙනුවෙන්. අද දිනය විශේෂයෙන්ම රස්නය අඩු දවසක්. ඒක නිසා ගොඩක් අයට දැනෙන්නේ නැහැ. නමුත් ඉදිරි කාලවකවානුවේදී මේක ගොඩක් ප්‍රයෝජනවත් වෙයි.

ඊළඟට ගරු සභාපතිතුමනි, අද සභාව දිනයේ අපේ බන්දුල හිරිමුතුගොඩ මන්ත්‍රීතුමාට පැමිණීමට පුළුවන් කමක් නැහැ. බන්ධනාගාර දෙපාතර්මේන්තුවේ හදිසි රාජකාරි කටයුත්තක් වෙනුවෙන් රාජකාරි නිවාඩු අනුමත කර දෙන හැටියට අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා විසින් සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරමින්, ඉදිරිපත් කර ඇති, මීට පෙර ඉදිරිපත්කරන ලද යෝජනාවලින් තවමත් බහුතර යෝජනා ප්‍රමාණයක් පළාත් පාලන කොමසාරිස් කායර්ාලය මගින් අනුමත කරලා නැහැ කියලා මම ඔබතුමාලගේ කාරුණික අවධානය

යොමුකරනවා. විශේෂයෙන්ම අපේ කොට්ඨාසය නියෝජනය කරන වනිගරත්න මන්ත්‍රීතුමාගේ යෝජනා ක්‍රියාත්මක කරන්න යන අවස්ථාවෙ තමයි දන්නේ තාමත් මේ වෙනකොට අනුමත වෙලා ඇවිල්ලා නැහැ කියලා. ඒවගේම ධර්මසිරි මන්ත්‍රීතුමාගේ යෝජනා මේ වන තෙක් අනුමත වෙලා ඇවිල්ලා නැහැ. මොකද ඒවායේ ගැටළුවක් නැහැ. එතුමන්ගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුළුවන් තත්වයක නැහැ, තවම අනුමත වෙලා නැහැ කියලා අපේ ලේකම්තුමිය හෝ සභාව විසින් එතුමන්ලා දැනුවත් කරල තිබුන නම් හොඳයි. නමුත් අපිට දැනගන්න ලැබුණේ ඒ මන්ත්‍රීවරුන්ගේ යෝජනා අනුමත වෙලා කියන කාරණය. ඒ නිසා මේ කාරණා කඩිනම්ව ඉටුකර ගැනීම සඳහා මේ විෂයන් භාර නිලධාරීන් නැත්නම් විශය ලිපිකරුවන් මේ කාරණා සම්බන්ධයෙන් දැනුවත් කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් කාරුණිකව අයැද සිටිනවා. මේ කායර්ාලය සාම්ප්‍රදායික රජයේ කායර්ාල හැටියට පත්කර ගන්න එපා. මේක දේශපාලන කායර්ාලයක්. පරිපාලනමය කටයුතු සිද්ධ වුවත්, දේශපාලන කටයුතු සිදු කරන ආයතනයක්. ඔබතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු 27 දෙනෙක් නියෝජනය වන නිසා ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ ලිපිගොනුවක ක්‍රියාත්මක භාවයට වඩා එහා ගිය ක්‍රියාත්මකභාවක් මේ ප්‍රාදේශීය සභාවේ ලිපිගොනුවක් භාර නිලධාරීන් අතින් සිද්ධ වෙන්න ඕන. මම ඒ නිලධාරීන්ගෙන් ඉස්මත් ගන්න කියන එක නෙමෙයි කියන්නේ. නමුත් ලිපිගොනුව පරික්ෂා කරන තුරු එහෙමම තියෙනවනම්, ඒක කණගාටුවට කාරණයක්. මම ගරු සභාපතිතුමා යෝජනා කරනවා ඒ අදාල විශේෂ වූ කාරණා සම්බන්ධ ලිපිකරුවන් කැඳවලා, ඔය යෝජනා සම්බන්ධයෙන් විතරක් නෙවෙයි තව ගොඩක් කාරණා තියෙනවා ඒවායේ ප්‍රගතිය විශේෂයෙන්ම පසු විපරමක් කරන්න කටයුතු කරන්න කියන කාරණය මතක් කරනවා. ඒ වගේම මේ යෝජනා අනුමත කරගැනීම සඳහා සභා වාතර්ාවත් සමඟ ම යවන්න අවශ්‍ය නම් ඒක කඩිනම් කරලා සිද්ධ කරන්න. තැපැල් මගින්ම කෙරෙන්න දෙන්නෙ නැතුව සහකාර පළාත් පාලන කායර්ාලය, පළාත් පාලන දෙපාතර්මේන්තුවට යන්න අවශ්‍ය නිසා උදේ අතින් අරන් ගියොත් හවස් වන විට එම කායර්ය කරගන්න පුළුවන්. ඒ ගැන කොමසාරිස්තුමා අපි දඹුල්ලේදී කතා කළාම, කිසි ගැටලුවක් නැහැ කියලා කිව්වා. සභාපතිතුමනි, මේ කටයුතු කඩිනම් කර ගැනීම සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකරනවා. තව අවුරුදු හතරයි කාලය තියෙන්නේ. යෝජනාවක් සභාවට දානවා. අනුමත වෙනවා. ඇස්තමේන්තු කරනවා. වාතර්ාවත් එක්ක ගාලු යනවා. අනුමත වෙලා එන්න තව මාස දෙකක් විතර යනවා. කාලගුණ තත්වයන් හා විවිධ හේතුන් මත තවත් මාසයක් විතර යනවා. එක යෝජනාවක් ක්‍රියාත්මක වෙන්න මාස හයක් යනවනම් මේ අවුරුදු හතර තුළ අපේ මන්ත්‍රීවරුන්ට ක්‍රියාත්මක කරන්න පුළුවන් යෝජනා කීයද? ඒ නිසාම ඒ කෙරෙහි සියලු දෙනාම ඔබතුමාට ශක්තිය දෙන්න ඕන. අපේ මන්ත්‍රීතුමන්ලා, නිලධාරීන් විශේෂයෙන්ම මේ කටයුතු කෙරෙහි ඕන කමින් කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වෙනුවෙන් නිලධාරීන් යොමු කර ගන්න කියල ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

ඒ වගේම අපේ මුළු ප්‍රාදේශීය සභාව තුළම ආපදා තත්වයක් තියෙනවා. ග්‍රාම සේවා වසම් 53 කීපයක් හැර අනිත් සියලුම වසම්වල මේ ආපදා තත්ත්වය පවතිනවා. මං විශ්වාස කරන හැටියට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ම ලොකුම නායයෑම සිද්ධ වෙලා තියෙන්නෙ උඩුගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසම දාවුල්හේන කියන ගමේ. මමත් චන්ද්‍රසිරි මහත්තයත් නියෝජනය කරන කොට්ඨාශයේ තමයි මේ ස්ථානය පිහිටලා තියෙන්නෙ. ගරු සභාපතිතුමනි ඔබගේ රියදුරු මහත්තයා ජීවත්වන ගේ අසල සිට මීටර් සියයක් විතර දුර තමයි සම්පූණර් පස් කන්ද නාය ගිහිල්ලා තියෙන්නේ. මෙම ස්ථානයේ නිවාස කිහිපයක් ඉවත්කිරීමේ අවදානමට ලක්වෙලා තියෙනවා. භූවිද්‍යා සමීක්ෂණ හා ගොඩනැගිලි ආයතනය යන දෙකෙන්ම පරික්ෂා කලත් ,නොකලත් නියත වශයෙන්ම දිගටම නාය යන කන්දක්. ඒ අවධානමට ක්‍රියාත්මක නොවුනොත් මිනිස් ජීවිත බර ගානක් හානි වන එක වළක්වන්න පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. ඒ තියෙන තත්වෙත් එක්ක ඒ තරමම තද බෑවුම් සහිත තත්ත්වයක් රවුමටම මීටර් 600කට වැඩි ප්‍රමාණයක් නාය ගියා. ඒ නිසා මම විශේෂ අවධානයට යොමු කරනවා යෝජනාවක් හැටියට සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන්න. භූ විද්‍යා හා පතල් කායර්ාංශය,

ගොඩනැගිලි හා පයෙර්ෂණ ආයතනයට වහාම මේ ස්ථානය පරීක්ෂා කරලා ඒකට විධිමත් විසඳුමක් කල් නොයවන විසඳුමක් ලබාදෙන්න කියන්න. එතනදි අපටත් අදහස් දක්වන්න පුළුවන්. ඔබතුමාගේ යෝජනාවක් හැටියට සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා මෙය සටහන් කරගන්නා මෙන් ඉල්ලා සිටිනවා. ඊළඟට මගේ අනිත් යෝජනාව ඊළඟට ලොකු හානිය සිදු වුනේ මේ යටලමත්ත කොට්ඨාශයේ අපේ මාමනාදොළ ඇළ නාකියාදෙණිය ගොඩේකන්ද යන ප්‍රදේශයෙන් පටන් ගන්න මාමනදොළ ඇල ගලාගෙන ඇවිල්ලා අපේ නෙලී මන්ත්‍රීතුමියගේ, උඩලමත්ත, යටලමත්ත පැතිවලින් බෙම්බඩ හරහා අපේ අගුරවල ලොකු මහත්තයලගේ ගෙවල් වලට එහා පැත්තෙන් අගුරුවලින් තමයි ගිං ගඟට වැටෙන්නේ. මේ ප්‍රදේශ ටිකටම හානි සිදු කරගෙන බෙම්බඩ ප්‍රදේශයත් සමතලා කරගෙන තමයි මේ වතුර පාර ගිහිල්ලා තියෙන්නේ. මේ සිද්ධියත් යෝජනාවක් හැටියට සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන්න. මේ ඇලේ විශේෂ අවහිරතාවයන් රැසක් තියෙනවා. මේ අවහිරතාවයන් රැස ඉවත් නොකළොත් දිගින් දිගටම නෙලී මන්ත්‍රීතුමිය ඇතුළු පිරිසට නොනිදා සිටින තමයි සිදුවෙන්නේ. තාප්පවලින් අවහිර වෙච්ච ප්‍රමාණයක් තියෙනවා. ඊළඟට ගස්කොළන්වලින් අවහිර වෙලා තියෙනවා. උණපඳුරු රාශියක් ගැලවිලා ඇළ ඇතුලෙ තියෙනවා. ඒව නිසා විශාල හිරවීමක් තියෙනවා. නාකියාදෙණිය වත්තෙන් කපාදමන කටුපොල් කඳන් ඇවිත් හිර වෙලා තියෙනවා. මේ සැරේ නාගොඩ ප්‍රාදේශීය සභාව ම ඇලවල් වලින් ගංවතුර නොවන දොළදියෙන් යට වෙලා විශාල හානිය සිද්ධ වුණේ මේ මාමනදොල ඇල ගලා යෑම නිසයි. ඒ නිසා දැනුත් නන්දන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා එතුමාට දුරකථන ඇමතුමක් ලැබිලා දැන් ගිල්ම මට්ටමේ තියෙන්නෙ, තව පොඩි වෂර්ාවක් වැස්ස නම් ගලනවා, පොඩ්ඩක්වත් බහින පාටක් නැහැ කියලා. ඊයෙ හැන්දෑවේ ප්‍රවෘත්ති වලට නැවතත් වෂර්ාව වධර්නය වෙන තත්වයක් තියෙනවා කියලා කිව්වා. බෙංගාලබොක්කෙ තියෙන අවපාතය තුළ වෂර්ාව බලාපොරොත්තු වෙන්න සිදු වෙනවා. ඒ නිසා එතුමා ප්‍රකාශ කළ විදියට අපට සූදානමක් අවශ්‍යයි. සභාපතිතුමා, මම නම් කියන්නේ සෘජුව කාරණා ක්‍රියාත්මක කළ හැකි ආයතනයක් හැටියට මේ යෝජනා ෆැක්ස් මගින් යවන අතර, වහාම ගිහිල්ලා ප්‍රධාන අමාත්‍යතුමා හෝ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් හමුවෙලා සල්ලි ලබා ගැනීමට පුලුවන්නම්, මේ කටයුත්ත සෘජුවම කරන්න පුළුවන්. මේ වෙලාවේ දේශපාලන කණ්ඩායම බලන එක නෙවෙයි වෙන්න ඕන. මෙය ක්‍රියාත්මක කරන පුළුවන් කොහෙන්ද අන්න එතනින් මේ කටයුත්ත කරන්න ඕන. එනිසා සෘජුවම මුදල් ප්‍රධානයක් කරනවානම්, මේ වෙලාවේ මෙතනින් අවශ්‍යතාවය බලලා කරන්න පුලුවන්. ඔබතුමා ගිහිල්ලා හරි ඉල්ලීම කරන්න. මේ කටයුත්තට සම්බන්ධ වෙන්න කියන ඉල්ලීම තමයි අපි කරන්නෙ. මම මීට වඩා අදහස් දක්වන්න බලාපොරොත්තු වන්නේ නැහැ. චන්ද්‍රසිරි මහත්තයා ඒ හරියේ පාරවල් ගැන කිව්වා. මම අමුතුවෙන් කියන්න ඕනේ නැහැ. ඒ පාරවල් ඇතුළේ තවත් පොඩි පොඩි පාරවල්වල ගෙවල් වලට ආපු පස් ඇද ගන්න බැරුව මිනිස්සු ඉන්නවා. ඒ මිනිස්සුන්ට උයාගන්න හැකියාවක් නැහැ. ඒ නිසා මේ තත්ත්වයන් බලලා ඒ සඳහා යම් කසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න ඕන. අපි අරවයි මේවයි බලන්නේ නැතුව යෝජනා සම්මත වීමයි ගාලු යැවීමයි බලන්නේ නැතුව වහාම කරන්න පුළුවන් විසඳුම ඉටුකරලා මේ මිනිස්සුන්ට යථා තත්වයට පත් වෙන්න පුළුවන් වාතාවරණයක් මේ දින දෙක ඇතුළත අපට පුළුවන් මට්ටමින් සපයන්න කියලා ඉල්ලා සිටිනවා. අපට මිනිස්සු ඉල්ලන හැම දේම දෙන්න බැහැ. පුළුවන් මට්ටමින් උදව් කරමු. මේක දැන් සභාවේ පාලන පක්ෂ මන්ත්‍රීතුමාටත්, සභාවේ ප්‍රතිපක්ෂයේ මන්ත්‍රී තුමාටත්, සියලුදෙනාටම කොට්ඨාශ වල මිනිස්සු ඉදිරියේ අසරණ වෙලයි ඉන්නේ. අපේ මන්ත්‍රීවරු ගිහිල්ලා මොනවා කරන්නද ? මේ සියලු දෙනාටම වෙන්නේ පොඩ්ඩක් බලන්න යන එක විතරයි. තමුන්නාන්සේලා මේකට මොකක් හරි ඉක්මන් විධිමත් නූතන වැඩපිළිවෙළක් කරලා දීලා මේ අමාරු වෙලාවෙදි වැඩ ටික කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම ස්තූතියි.

**ගරු උප සභාපති තුමා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ජනමාධ්‍යවේදීහේමපාල මහත්මා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම මේ අවස්ථාවේ ප්‍රකාශ කළ යුතු කාරණා ඉතා කෙටියෙන් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද අද කවුරුත් වේලාසනින් යන්න සූදානම් වෙලා ඉන්නවා. සභබන්දු මහත්මයා ඉල්ලීමකුත් කළා අද රැස්වීම දවසකට කල් දාමු කියලා. නමුත් ප්‍රමාණවත් පිරිසක් ආව නිසා රැස්වීම පැවැත්වූවා. ඒ නිසා ගොඩක් කරුණු කාරණා මේ සභාවේ හමුවේ තබන්න අවශ්‍යතාවය තිබුණ මුත් මේ අවස්ථාවේදී මම එය සිදු කරන්නේ නැහැ. මුලින්ම ගරු සභාපතිතුමනි, පසුගියදා තිබුණු පළාත් පාලන ක්‍රීඩා උත්සවයේ දී තරග සඳහා ඉදිරිපත් වුණු අපේ එල්ලේ කණ්ඩායම් දෙකට සාමාජිකයකු වශයෙන් ඔබතුමා ස්තුති කරන්න. විශේෂයෙන්ම අපටත් වඩා කාන්තා කණ්ඩායම ඉදිරියෙන් හිටියා. අපේ සුභාෂි මන්ත්‍රීතුමිය, ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කණ්ඩායම නියෝජනය කළා. අවසානයේ කණ්ඩායම් කීපයක් පරාජය කරලා, ජයග්‍රහණය කරලා ඉදිරිපත් වුණ තරඟයේ ලකුණු සමාන වූ නිසා කාසියේ වාසිය උරගා බලන්න සිදුවුණා. එහිදී අපට ජයග්‍රහණය අහිමි වුණා. ඒ තරගයත් අපි ජය ගත්තා වගේ තමයි. තරගයක් වශයෙන් කාන්තා කණ්ඩායමට අවසානය දක්වාම යන්න පුළුවන් වුණා. පිරිමි කණ්ඩායමත් ජයග්‍රහණ කිහිපයක් ලබා ගත්තා. ඒ පිට්ටනියේ ගහපු වැඩිම ලකුණු සංඛ්‍යාව නාගොඩ ප්‍රාදේශීය සභාවේ එල්ලේ පිරිමි කණ්ඩායම තමයි ගහලා තිබුනේ. ලකුණු 8 යි. කිසිම කණ්ඩායමකට මේ තරම් ලකුණු ප්‍රමාණයක් ගන්න බැරි වුණා. ඒ නිසා මේ ඉදිරි තරගවලටත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ දායකත්වය ලබා දෙන්න කියලා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. ඒ තරගාවලියට ප්‍රාදේශීය සභා තුනක් නෙලුව, තවලම, හබරාදූව සම්බන්ධ වුණේ නැහැ. අනෙකුත් සියලුම ප්‍රාදේශීය සභා හා සම්බන්ධ වෙලා තිබුණා. විශාල බස් රථ අරගෙන, කෑම වියදම් දරාගෙන ටී ෂටර් ඇඳගෙන ඩෙක්ෂුෂ් සියල්ල සපයලා දීලා ඉතාම හොඳට ඒ කණ්ඩායම් සංවිධානය කරලා තිබුණා. ඒ නිසා ඉදිරි තරග සඳහා ඔබතුමාලගේ සහයෝගය, ශක්තිය ලබාදෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

ඊළඟට විශේෂයෙන්ම ගංවතුර තත්වය පිළිබඳ මුලින්ම මම කරුණු පැහැදිලි කරන්න කැමතියි. ඔබතුමාට මතක ඇති මීට මාස දෙකකට කලින් කොළඹින් වටවල වැවිලි සමාගමේ නියෝජිත මහත්වරු ගෙන්නල කටුපොල් ව්‍යසනය පිළිබඳ අපේ සභාවෙ සාකච්ඡාවක් සිදු කළා. ඒ කටුපොල් ව්‍යසනයට සම්බන්ධ වෙලා සිටි මන්ත්‍රීවරයෙක් වශයෙන්, මම ඒ අවස්ථාවේ මුලින්ම කිව්වා. මට මේ ඔබතුමන්ලාට දැනුම් දෙන තියෙන්නේ කටුපොල් ව්‍යසනය පිළිබඳ නොවෙයි නමුත් ඊට වඩා පරිසර හානියක් වටවල වැවිලි සමාගමේ, නාකියාදෙණිය වත්තෙන් සිදු වෙනවා. ඒක වලක්වගන්න කටයුතු කරන්න. ඒ සඳහා මම කියන කරුණු කාරණා ලිඛිතව ලියාගෙන ගිහිල්ලා උත්තර සපයන්න කියලා කිව්වා. එදා මම කියපු කරුණු කාරණා ලිඛිතව ලියාගෙන ගිහිල්ලා ආපු නිලධාරි මහත්වරුන් උත්තර සැපයුවා නම්,යටලමත්ත, උඩලමත්ත, බෙම්බඩ වැනි ප්‍රදේශවලට මේ තරම් ව්‍යසනයක් වෙන්නේ නැහැ. කටුපොල් වගාවට සකස්කරන භූමිභාගය හෙක්ටයාර සියගානක් එකපාරට විවර කරන්න එපා කියලා මම ඉල්ලීමක් කළා. අද බලන්න බන්ඩිය හේන උඩලමත්ත කොටස හඟරන්වල, මාමනදොළ ඒ ඩිවිශන් වල සියලුම අක්කර හෙක්ටයාර ගණනක් තිබුණු රබර් වගාව සම්පූර්ණයෙන්ම ඉවත් කරලා සියලු කඳුවැටිවලට කෙලින්ම අහසින් වතුර වැටෙන තත්ත්වයට පත්කරලා තියෙනවා. මෙහි කිසිදු වගාවක් නැහැ. සියල්ල මුඩුබිම් තත්වයට පත්කරලා තියෙනවා. අක්කර හෙක්ටයාර් ගණනක එකතුවන වතුර සියල්ල මාමණදොළ ඇලට යනවා. කවදාවක්වත් ඉතිහාසයේ ඒ ගම්වල මේ වගේ ගංවතුරක් නැහැ. 1956 තිබුණට පස්සේ ඊයෙ, පෙරේදා තිබුන ගංවතුරෙන් තමයි විශාල ව්‍යසනයක් සිදු වුණා. එපමණ හෙක්ටයාර් ගණනක ජලය පොළොවට උරන්නෙ නැතිව, ඒ කපපු ප්ලැට් ෆෝම් නිවැරදිව සකස් වෙලා තිබුනෙ නැහැ. දොල කාණු, නෙත්ති කාණු, ගල්වැටි සකස් කරල තිබුනෙ නැහැ. ඒ නිසා සියල්ල අපේ ඇලට ආවා. ඊළඟට විශේෂයෙන්ම මම කිව්වා, ඔබතුමන්ලා විසින් මාමනදොළ ඇල දිගටම එළිපෙහෙළි කරලා, මාමනදොළ ඇල දිගේ කටුපොල් අපද්‍රව්‍ය, පොහොර කියලා ධවලා තියෙනවා. ඒ නිසා සියල්ල එකට මිශ්‍ර වෙනවා කියල වටවල වැවිලි සමාගමට කිව්වා.

පසුගිය සභා රැස්වීම තියෙන දවසේ අපේ යටලමත්තෙ මන්ත්‍රීතුමා දුරකථන ඇමතුමක් දුන්නා අද කටුපොල් ඇළට දාලා කියලා. නමුත් ඒ අවස්ථාවේ ඇලේ තුන්කාලක් විතර වතුර ප්‍රමාණයක් ආවා. විශාල වතුර ප්‍රමාණයක් එක්ක මේ අපද්‍රව්‍ය එන බව අපි දන්නවා. නමුත් වතුර ප්‍රමාණය වැඩි නිසා උත්සාහයක් ගත්තේ නැහැ. මාමනදොළ ඇල රක්ෂිතයේ කටු පොල් ගස් සුද්ද කරලා අතු ගොඩ ගහලා තියෙනවා. ගස් සුද්ද කරන අය ඒවා රක්ෂිතයේ තැන්පත් කරලා යනවා. ඒ සියල්ල අපේ ගම්මාන වලට ඇවිල්ලා, අජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපේ පාලම් කිහිපයක් දැනට අවහිර කරලා තියෙනවා. ඒ වගේම මම ඉල්ලීමක් කළා. ඒ අවස්ථාවේදී මාමනදොල ඇල අවට යටලමත්ත සිට උඩලමත්ත දක්වා ඉබේ වැටුණු කටු පොල් ගස් හැට ගණනක් තියෙනවා. ඒක ඇලේ වතුර බැස යාමට බාධාවක්. ඒක ඉවත් කරලා දෙන්න කියලා කිව්වත් එය කළේ නැහැ. වතුර බැස යාමට බාධා වන අයුරින් කටු පොල් ගස් පැල වෙලා තියෙනවා. දැනුත් පෙන්නන්න පුළුවන් නමුත් මේවට වටවල වැව්ලි සමාගම උත්තරයක් දුන්න නම් මේ ව්‍යසනය සිදු වන්නේ නැහැ. අද අපි නිශාන්ත මන්ත්‍රීතුමාත්, නෙලී මන්ත්‍රීතුමියත් මමත්,විජිත් මහත්තයත් මේ ඇල අද්දර ඉන්න මහජන නියෝජිතයන් වශයෙන් අසරණ වෙලා ඉන්නවා. අපි ඒ අවස්ථාවේදී ප්‍රාදේශීය ලේකම්තුමියටත්, සභාපතිතුමාටත්, අපට සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලීම් කළා. නමුත් අපට ඒවාට සහය එතුමාගෙන් ලැබුණ හෝ නොලැබුණ ජනතාවට අවශ්‍ය පිසූ ආහාර ලබා දෙන්න කටයුතු කලා. වතුර බැස ගිය ගමන්ම උදේ ආහාරය, දවල් ආහාරය, රාත්‍රී ආහාරය ඊයේ දක්වාම ලබා දීලා තියෙනවා. දැන් තියෙන විශේෂ ප්‍රශ්නය සහබන්දු මහත්මයත්, නිශාන්ත මන්ත්‍රීතුමාත්දැනුවත් කළා. ඊයේ ගාල්ල රැස්වීමක් පවත්වලා සියලු උපදෙස් ලබා දුන්නා. ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබා දීලා ජනතාවගේ සියලු කටයුතු සඳහා පෙනීසිට කටයුතු කරන්න කියලා. නමුත් මේ වන විටත් කටයුතු කරල නැහැ. ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන් මගින් අද උදේ අපට දැන ගන්න ලැබුණා තවම ප්‍රාදේශීය ලේකම් කායර්ාලය වියළි සලාක බෙදන්න තවම සංවිධාන වෙලා නැහැ කියලා. අපි කියන කොට කියනවා. මේවා දෙන්නම්, අරව දෙන්නම් කියලා. ඒ ලැබෙන සියළු දේවල් පසුවට. නමුත් ක්ෂනිකව ජනතාව නගා සිටුවන්න, ක්ෂණිකව ජනතාවගේ කුසගින්නට පිළිතුරක් සපයන්න මේ අවස්ථාවේ දෙවනි පියවරක් වශයෙන් වියළි සළාක බෙදාදීමට කටයුතු කරලා නැහැ. වෙනදා එහෙම නෙවෙයි. ගංවතුර ගැලුවහම සමුපකාර සමිති සම්බන්ධවෙලා, ගරු සභාපතිතුමා සම්බන්ධ වෙලා දුරකථන ඇමතුම් මගින් යම් යම් ක්‍රියාමාගර් අරගෙන මිනිස්සු අතරට යන්න කටයුතු කලා. නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ උඩුගම ඉන්න මන්ත්‍රීතුමා ෂෙඩ් එකෙන් ලාම්පුතෙල් ගත්තා. බෝට්ටු වලට ඩීසල් අරගෙන දුන්නා. උඩුගම තියෙන බේකරියෙන් අපේ අජිත් මහත්තයා පාන් ටික බෙදුවා. ඒ වගේම මාපලගම ඉන්න මන්ත්‍රීවරයාත් ඒ ටික කලා. ඒ ක්‍රියාදාමය කෝ. මේතරම් නීතිරීති, දැන් අපට පාරක් හදන්න ගියහම එකේ උප්පැන්නේ ඉදලා හොයනවා. ඇයි මේ මහජන නියෝජිතයෝ අපට මේ සභාවට ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට නියෝග දීලා මේකට බලය තියෙන අය ඇයි මේ කරන්නේ නැත්තේ? ඒක අද ලොකු ගැටලුවක්. සහබන්දු මන්ත්‍රීතුමනි, කිසිදු පළාත් සභා මන්ත්‍රීවරයෙක් , කිසිදු පාලරීමේන්තු මන්ත්‍රීවරයෙක් අපේ ගම්මානයට ඇවිල්ලා නැහැ. යටලමත්ත, නාගොඩ ,මාපලගම පැති වලට ආපු මන්ත්‍රීවරු කවුද කියල කියන්න බලන්න. දැන් පාරවලවල යන්න පුළුවන් නමුත් කවුද ආපු පළාත් සභා මන්ත්‍රීතුමා, කවුද ආපු පාලරීමේන්තු මන්ත්‍රිතුමා , කවුද වගකිව යුතු අය ආවෙ? ඇයි මෙහෙම වෙන්න හේතුව. මේ සියල්ල අකමර්න්‍ය වෙලා. අපේ සභාපතිතුමා අසරණ වුණා. සමහරක් වෙලාවල්වලදී එතුමා යටලමත්ත විවිධ සේවා සමුපකාර සමිතියෙන් කරෙන් බඩු ඇදලා තමයි තැන්තැන්වලට ආහාර ද්‍රව්‍ය සැපයුවේ. එතුමට වාහනයක් ගෙන්නගන්න බැරි වුණා. අපේ කැබ් එක ගම් වලට ගිහිල්ලා තමයි ටිකක් හරි උදව් කළේ. කෝ මේ කියන කායර්ය පටිපාටිය. මේක අද ඊයේ වෙච්ච ගංවතුරක්ද? අද අපි දන්න කාලෙ ඉදන් තාමත් සැලසුම් හදනවා. ගරු මන්ත්‍රීතුමනි, තාමත් මෙයාලට වෙන්නෙ මොකක්ද කියලා හිතාගන්න බැහැ. නිදාගෙන නැගිට්ට වගේ කටයුතු කරන්නේ. අපට ඇත්තෙන්ම බලයක් ලැබිලා නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා ඔබතුමාලාත් අසරණයි. අපිත් අසරණයි. ඒ නිසා අපි හැමදාම සාකච්ඡා කරනවා,

හැමදාම සම්මන්ත්‍රණ තියෙනවා, ප්ලෑන් අඳිනවා. අතන ඉඩම් දෙන්න මෙතන ඉඩම් දෙන්න, දැන් ඉඩනුත් දීලා, සල්ලිත් දීල තාමත් පදිංචිය නොගිය පිරිස් ඉන්නවා කියලා සඳහන් වුනා. හරිම කණගාටුයි අපි ඊළඟටත් ආධාර කරන්නේ එයාලට ද? නෙරංජලී මන්ත්‍රීතුමියත් කිව්වා වා ඉඩම් කට්ටියක් දුන්නා, ගේ හදන්න ආධාර දුන්නා, ඉඩමක් ගන්න සල්ලි වෙන් කළා. ඉතින් යන්නෙ නැතිනම් නැවතත් ආධාර උපකාර කරන්න ඕන ඒ අයටද? ඒ නිසා මේකේ කෙලවරක් තියෙන්න ඕන. ගරු මන්ත්‍රීතුමනි අපි සභාවක් වශයෙන් ගරු සභාපතිතුමාට කියනවා, දැන් එතුමා සූදානම් කරලා තියෙනවා ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවලින් යම් යම් උදව් උපකාර කරන්න ලබාගන්න. j.c.b. යන්ත්‍ර ගෙන්න ගන්න. ගරු සභාපතිතුමනි ඔබ තුමත් මේක පැය විසි හතරක් බලන්න ගරු මන්ත්‍රීතුමාට ගමට යන්න බැහැ. පස් කණ්ඩි කඩා වැටිලා නැවතත් ඒ ගෙවල්වලට යන්න බැහැ. ඒ නිසා පැය විසි හතරක් ඇතුළත මේ ජේසිබ් ගෙන්නගන්න බැරිනම් ,ඒකට ඩීසල් අනුමත කරගන්න බැරිනම්, අවශ්‍ය වාහන හොයාගන්න බැරිනම් ඔය ක්‍රියාදාමය නවත්තන්න. අපි පුද්ගලිකව මේ වැඩේ කරගන්නම්. අපිට දවසක් ඔය j.c.b. එකක් යොදවා ගන්න බැරි කමක් නෑ. අජිත් මහත්තයා, සභබන්දු මහත්මයා, මම කියන්නේ සාධාරණ කතාවක්. පැය විසි හතරක් බලන්න. අපට දායකත්වය දෙනවයි කියපු අය ගැන ඕනවට වඩා විශ්වාසයක් තියන්න එපා. ඒක දවස් තුනකට හතරකට පස්සේ ඇවිල්ල වැඩක් නැහැ. ඔක්කොම මැසිවිලි චෝදනා ලබලා වැඩේ කරලත් වැඩකුත් නැහැ. ඇත්තටම මේ මන්ත්‍රී තනතුරෙනුත් වැඩක් නැහැ. ඇත්තටම ඒ නිසා මේකේ සීමාවක් තියෙන්න ඕන. ඒ නිසා ඔබතුමා ප්‍රාදේශීය ලේකම්තුමිය, දිසාපතිතුමා ප්‍රධාන අමාත්‍යතුමා, සියලු කණ්ඩායම දුරකතනයෙන් සම්බන්ධ කර ගන්න. මේ වෙලාවේ දුරකථනයෙන් සම්බන්ධ කරගෙන මේවාට පිළිතුරු හොයාගන්න. ගරු අජිත් මන්ත්‍රීතුමා කිව්ව වගේ උපතේ සිට මරණය දක්වා සියලු කාරණා ඉටුකරන්න ප්‍රාදේශීය සභා පනතේ අපට බලය තියෙනවා නම් අපි නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ සියලු දෙනාම එකඟතාවයෙන් ඕනම කොට්ඨාසයක වෙච්ච වියදමට අපි වගකීම දරනවා. ඒ වගේ වගකීමෙන් කටයුතු කරන්න කියලා සියලු දෙනාට මතක් කර සිටිනවා.

ඒ වගේම පසුගිය කාලේ ගංවතුරට සමහර විහාරස්ථානවල අනාථ වුන අයට ඉන්න ගොඩනැගිලි හැදුවා. සමහර විහාරස්ථානවලට සමිති වලට තුන් හාරසීයකට උයන්න පුළුවන් වළං කට්ටල ලබා දුන්නා. මාධ්‍යවේදී මැතිතුමනි, ඔබතුමා මේවා ලියන්න. ඒවායින් ප්‍රයෝජන ගත්තු තැනක් කියන්න. දැන් මම උඩලමත්තෙ වළං, පිඟන් කුලියට ගත්තේ. දැන් හොයලා බලන්න එක පන්සලක හදපු ගොඩනැගිල්ලක කවුද හිටියේ කියලා. ඔය ආධාර කරපු එක පන්සලක හෝ පොදු ස්ථානයක උදව් උපකාර කළා ද කියලා හොයලා බලන්න. ඔබතුමාලා තමයි මැදිහත් වුණේ. මේ නිසා මේවා නිවැරදි ක්‍රමවේද වලට එන්න ඕන. දේශපාලන අධිකාරියෙ කීම අහල අතන ගොඩනැගිල්ල හදනවා, අතන වැසිකිලිය හදනවා. අර කට්ටලය මෙතනට දෙනවා. ඒව ඇත්තටම නිමා වෙන්න ඕන. ඒ කියන්නේ ඔබතුමන්ලගේ හා අපේ කාලේ මේවා සිදුවුණා. මේවා දැන්වත් නිමා වෙන්න ඕන. අද මෙතනින් ඉවර වෙන්නෙ නැහැ. දැන් අවුරුදු පහළොවන් පහලොවට මහ ගං වතුරක් ආවා, ඊළඟට තව අවුරුද්දක් දෙකක් යනකොට පොඩි ගංවතුර එනවා. ඒ නිසා අපට හැමදාම සදාකාලිකව අපේ කොට්ඨාසවල ජනතාවට මේ ව්‍යසනයෙන් බේරීමට හැකියාවක් නැති තත්වෙට පත්වෙලා තියෙනවා. අපි මේවට ස්ථිරසාර විසඳුම්, ඒ වගේම සිදු වූ විගස තීරණ ගන්න හැකියාව, ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය, එව හැමෝටම මේ අවස්ථාවේ කඩිනම්ව ලබාගත හැකි ක්‍රමවේද සකස් විය යුතුයි කියලා මේ සභාව හමුවේ කියන්න කැමතියි.

ඒ වගේම විශේෂයෙන්ම මං මුලින්ම කිව්වා. මේ සමහර කොට්ඨාසවල පාරවල් වලට පස් කන්ද කඩා වැටිලා, ගෙවල් යටවෙලා, මේවා ඇස්තමේන්තු සීයට සීයක් සකස් කර කර ඉන්නෙ නැතුව අපි නිලධාරි මහත්තයෙක් ගිහිල්ලා පින්තූර හරි අරගෙන ඒකට යන j.c.b. පැය ගණන තීන්දු කරලා, j.c.b කිහිපයක් යොදවලා සිදුකරන්න. සභබන්දු මහත්මයා කිව්වා වගේ පසුගිය සභාවෙ න්‍යායපත්‍රයට

මේවත් ඇතුලත් කරලා, යම්කිසි කොට්ඨාසයක ගිහිල්ලා පස් කන්ඩි ඉවත් කරලා, එතන ගේ උඩ පස්කන්ද තියෙනවා නම්, ඒක මහ හරින්නෙ නැතුව, අජිත් මහත්තයා කිව්වා වගේ ඒ ඇස්තමේන්තුවටම ඒක අනුගත කරලා කරන්න. නීත්‍යානුකූල හෝ නීත්‍යානුකූල නොවන හෝ කායර්යන් සාධාරණව ඒවා කෙරෙන්න ඕන කායර්යන් කිරීම සඳහා සභාපතිතුමාට ශක්තිය ධෛයර් ලැබේවා කියා ප්‍රාථර්නා කරමින්, විශේෂයෙන්ම ඉදිරි ක්‍රීඩා උත්සවය සඳහා සියලු දෙනාගේ දායකත්වය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් හා ඒ සඳහා සහභාගි වන ලෙස ආරාධනා කරමින් ඔබ සැමට සුබ අනාගතයක් ප්‍රාථර්නා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමන්ගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මම පළමුවෙන්ම කතා කරන්න ඕන. ඊයෙ සිදුවීම ගැන එකෙන් අපේ වනමල් මන්ත්‍රීතුමා නිදොස් වෙන්න ඕන. අපේ හිතවතා, ඥාතියා ඇත්තටම සිදුවුණේ නොහිතපු දෙයක්. මම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා සමඟ එම ස්ථානයට යන විට එතන පිරිසක් හිටියා. මම කලින් දවසේ හැන්දෑවේ වතුරෙ බැහැල ගිහින් බලලා ආවේ. මම එතනට යන විටම, අනේ බලන්න බුදු සභාපතිතුමා, අපිව බලන්න දිසාපති තුමිය ආවා අපි ගැන කතා කළේවත් නැහැ කියලා අඬඅඬා පොළොවේ හැපී හැපී කතා කරා. දිසාපතිතුමියට එන්න විදියක් නැහැ. අද තමයි ආවෙ. අපිත් එක්ක කතා කළේ නැහැ. මම කිව්ව එක වෙන්න බැහැ කියලා. එතකොටම ග්‍රාම නිලධාරීතුමාත් ආවා. මම ඒ අවස්ථාවේදී දිසාපතිතුමියට කතා කළා. ඔබතුමිය මෙම ස්ථානයට ආවාද කියලා මම එතුමියගෙන් විමසූ විට එතුමිය ඔව්, ඇවිල්ල බලල කතා කරලා ගියා කියලා කිව්වා. මේ අයට කුලියට ගෙයක් ගැනීමට අවසර ගන්න සඳහා ගාලු යනවා කියලා ප්‍රකාශ කළා. මේ වැරැද්ද ඔබතුමාගේ කියලා මම රාළහාමිට කිව්වා. දිසාපතිතුමියගේ නියෝජිතයා ඔබතුමා. ඔබතුමා වැරදියි කියලා. නමුත් ඒ ගෙවල් වල හිටිය අයට යන්න කියලා තියෙන්නේ අනතුරුදායකයි කියලා ඒ මිනිස්සු ගිහිල්ලා නැහැ. නමුත්. මම රාලහාමිත් සමග කතාකරන අවස්ථාවෙ තමයි පොඩි ප්‍රශ්නයක් සිදුවුණේ. මේක ප්‍රශ්නයක් ක්ෂණික ප්‍රශ්නයක්. මෙතනට ටිකක් දේශපාලනය සම්බන්ධ වුණා. එකට දේශපාලනය අදාළ නැහැ. ගංවතුර , වැස්ස මේක අපි කාටත් එකයි. මටත් පොඩ්ඩක් කේන්ති ගියා. ඒක එතනින් ඉවරයි. වරදවා හිතන්න එපා. වසන්ත මන්ත්‍රීතුමා, මගේ හිතේ මොනවත් නැහැ. එතුමගෙත් හිතේ නැහැ. අපි කවුරුත් එකයි. අපි ආවෙ මිනිස්සුන්ට වැඩ කරන්න. මම කලින් දවසෙ km 125 කට වඩා නාගොඩ රවුමක් ගැහුවා. හවස 5.30 සිට. උඩුගම පාර, බංගම පාර අකුරැස්ස හැමතැනම යටවෙලා. අන්තිමට වාහනයේ නම්බර් ප්ලේට් එකත් නැහැ. ඒ වෙලාවේ ඉඳලම වැඩ කටයුතු කළා. මම යටලමත්ත ට ගියා. යටලමත්ත පීල්ල ළඟ ඉඳලා වතුර. මම යන වෙලාව යනවිට යටලමත්ත විනාසයි. රෑ 12.30 ට විතර කැබ් එක මග දාලා මම බැහැලා තනියම ආවා. තුනට විතර පාන් ගෙඩි 150ක් 200ක් ඕඩර් කළා. ඒ කටයුතු සිදුකළා. මම ගෙදර යනකොට පසුදා උදේ 3.40 විතර වුණා. උදේ පාන්දර පන්සලටයි, සුසන්ත මහත්තයා ටයි කතා කළා. උඩලමත්ත අඩි නමයකට වැඩිය වතුර තියෙනවා කිව්වා. මම එතුමාට කිව්වා පන්සලේ උයන්න කියලා. සභාපතිට කතා කරලා කිව්වා අපිට උයන්න අවශ්‍ය බඩු ටික ඕන කියලා. ඒ වගේම දිසානායක මහත්තයලගේ ගෙදරත් උයනවා කිව්වා. ඒ අවශය බඩු ටිකත් ලබා දුන්නා. මම මහ ඇමතිතුමාටත් කතා කළා. දැඩි හානි තිබුණේ යටලමත්ත ප්‍රදේශයට. අපේ නෝනගේ ගෙදරටත් ගොඩක් හානි වෙලා තියනවා. කවුරුහරි කියනවනම් මම අපේ අයට වැඩියෙන් උදව් කළා කියලා ඒක වැරදියි. මම ඊයේ වතුර බවුසරය යැව්වෙ හැමෝගෙම ප්‍රයෝජනය සඳහා. අඩුම ගානේ අපේ ගෙදර ළඟ ලයිට් එක වත් පත්තුවෙන්නේ නැහැ. ගෙදර බලබ් වගයකුත් තියෙනවා. නමුත් මම ඒකවත් හයි කර ගත්තේ නැහැ. බොන වතුර පිරිසිදු කිරීම් වලට දෙන්න බැහැ කියලා මම කිව්වා. අපේ ගෙදර කියලා වෙනසක් නැහැ. පොදුවේ තමයි මම වැඩ කටයුතු කළේ. පෞද්ගලිකව එහෙම ප්‍රයෝජන ගන්න බලාපොරොත්තුවක්

නැහැ. කොහොම නමුත් ගංවතුරෙන් දැඩි හානි සිදුවුන යටලමත්ත, උඩලමත්ත, බෙම්බඩ ප්‍රදේශවල සියලු මන්ත්‍රීවරුන්ට මම කතා කළා. ධම්සිරි මන්ත්‍රීතුමා එදා රෑ මට කතා කරලා වෙනදා ගංවතුර වගේ නෙවෙයි. නෙළුව පැත්තෙ ගංවතුර නැහැ. මෙහේ විතරයි ගංවතුර තියෙන්නෙ. ඒ නිසා ප්‍රචාරය යන්න ඕන කියලා කිව්වා. අපේ ධම්සිරි මන්ත්‍රීතුමා ඒ පැත්තට ප්‍රචාරය කටයුතුවලට ගියා. මේ පැත්තෙන් මම යතුරත් අරගෙන සභාවට ඇවිල්ලා අපේ පීකර් සෙට් එකෙන් ප්‍රියන්ති මන්ත්‍රීතුමියගේ ලොරිය ගෙන්වලා ප්‍රචාරය සඳහා ගියා. එවිට රූ දොළහ පහුවෙලා. ඒ වෙලාවේ තමයි මිනිස්සු දැනුවත් වුණේ. හැබැයි මන්ත්‍රීතුමන්ලාට මම ගරු කරනවා. මම දිසානායක මන්ත්‍රීතුමාට, ලක්රුවන් මන්ත්‍රීතුමාට කතා කලා. මොකද ඒ පැත්ත යට වෙනවා. හැමෝටම වගේ කතා කළා. කොහොම නමුත් අපි ගංවතුරට අපට පුළුවන් ආකාරයෙන් මුහුණ දුන්නා. නමුත් මේ වන තුරු කිසිම දේශපාලන නායකයෙක් ආවේ නැහැ. අපි ඒ ගැන කනගාටු වෙනවා. කිසිම කෙනෙක් ආවෙ නැහැ කියලා නමුත් අපට කරන්න පුළුවන් ආකාරයෙන් අපි කටයුතු කලා කියලා මම ඊයේ මහ ඇමතිතුමාටත් කිව්වා. අපට සභාවෙ සල්ලි වලින් කෑම දෙන්න බැහැ. සහකාර කොමසාරිස්, සභාවේ සල්ලිවලින්ද කෑම දුන්නේ කියලා මගෙන් ඇහුවා. මම ඔව් කිව්වා. නමුත් එහෙම දෙන්න බැහැ කියලා කිව්වා. එල්ලුම්ගස් ගියත් ඒ අවස්ථාවේ ඒ දේ කරන්න ඕනේ කියලා මම ප්‍රකාශ කළා. ඉඩමක් හරි විකුණලා අපි ඒක කරගන්නම් කියලා මම කිව්වා. අපි වංචාවක් කරන්නේ නැහැ. ඒ අවස්ථාව හැටියට කරන්න දෙයක් නැහැ කියලා කිව්වා. නමුත් මහ ඇමතිතුමාගෙන් මම අවසර ගත්තා. අපි ඊලගට දිසාපතිතුමියට කතා කළා. ඇත්තටම දිසාපතිතුමිය කාන්තාවක් වුනත් හොඳින් ඒ වැඩ ටික සිදු කලා. පොලිස් ස්ථානාධිපතිතුමා මේ කවුරුත් සහයෝගයෙන් වැඩ කළා. නමුත් අපේ මන්ත්‍රීතුමන්ලාට, ලේකම්තුමියට එන්න විදිහක් නැහැ. එදා රාත්‍රියේ මම උඩුගමටත් ගියා. සියලු වැඩ හොඳින් සිදුවුණා. අඩුපාඩු ඇති ඒත් අපට කරන්න පුළුවන් විදිහට කළා. වෙනඳ වගේ හාල් මුට්ට, පිටි මුට්ට අපි කර ගැහුවා. උඩලමත්ත පන්සලේ හාමුදුරුවෝ 1000, 1500 ට විතර පන්සලේ කෑම හදලා දුන්නා. දිසාපතිතුමියත් සම්බන්ධ වෙලා කටයුතු සිදුකළා. ඊළඟට කොහෙන් හරි කෑම ගේන්න SSP මහත්තයා වාහනය ඉල්ලුවා. අවශ්‍ය දේ වෙනවනම්, කවුද කොහෙන්ද කියල වැඩක් නැහැ. අපේ යුතුකම වන්නේ මහජනයාට සේවය කිරීම. පාට පක්ෂ අවශ්‍ය නැහැ. එහෙම ක්‍රමවේදයක් අපේ ඇත්තෙත් නැහැ.

මාධ්‍යවේදී මත්මයාණනි, අද පත්තරේ බැලුවා. නාගොඩ ගංවතුර නැහැ. නමුත් නාගොඩ තමයි වැඩිම හානි සිදුවෙලා තියෙන්නෙ. විශේෂයෙන් මාධ්‍යයට තොරතුරු ලැබිලා නැහැ. මලාමුර නාය යෑම පිළිබඳව මම කතා කරලා කිව්වා. විශාල විනාශයක් වෙලා තියෙනවා. ඒ කියන්නේ විශාල වශයෙන් පාර අවහිර වෙලා තියෙනවා. මම කතා කරල RD එකට කිව්වා. ඒ පස් ටික මාසෙකට වත් ඉවත් කරන්න බැහැ. මට උඩුගම පැත්තට යන්න බැරි උනේ නාගොඩටයි, යටලමත්තටයි කොටු වෙලා හිටපු නිසා. අපේ ගෙවල් පිටිපස්සේ යටවුනු ගෙදරට වත් මට යන්න බැරි වුනා. ඉරිද රෑ තනියම වතුර බැහැලා ඇවිදගෙන එළිවෙන යාම තමයි මම ගෙදර ගියේ. අපි අපට පුළුවන් ආකාරයෙන් කටයුතු කළා. අපට කිසි කෙනෙක්ගෙන් සහය ලැබුණේ නැහැ. ගංවතුරක් තිබුණද කියලවත් කවුරුත් ඇහුවේ නැහැ. දැනටත් අයහපත් කාලගුණ තත්ත්වය වෙනස් වෙලා නැහැ. ඉදිරියේදීත් මම හිතන්නේ අපි ගංවතුර බලාපොරොත්තු වෙන්න ඕන. පසුගිය දවස්වල වතුර නැතුව අපි වතුර බෙදුවා. තව මාසයක්වත් වුණේ නැහැ. දැන් ගංවතුර. ඒක නිසා, මේ කාලගුණ විපයර්‍යාසයන්ට අපි සාර්ථකව මුහුණ දෙන්න ඕන. විශේෂයෙන්ම කියන්න ඕන මන්ත්‍රීතුමන්ලාට කොට්ඨාස බෙදලා තියෙනවා. අපේ මන්ත්‍රීවරු පක්ෂ භේද නැතුව වැඩ කටයුතු කරන්න. මම සල්ලි වලට ලෝභ නැහැ. මම නීතියට බයයි. නීත්‍යානුකූල ඕන දෙයක් කරන්න මම එකහයි. බැකෝ දාලා හරි වෙනත් අයුරකින් හරි කරන කටයුතුවලදී තාක්ෂණ නිලධාරීන් සම්බන්ධකරගෙන, ඒ වාතර්‍ාවන්ට අනුව, උපදෙස් වලට අනුව කටයුතු කරන්න. ගොඩක් කටයුතු කරන්නේ ප්‍රාදේශීය ලේකම් කායර්‍ාල හරහා. උපතේ සිට මරණය දක්වා සියළු කායර්‍යන් කරන්න කිව්වට හැම දෙයක්ම කරන්න බැහැ. එහෙමනම් යම් යම් දේවල්

වලට අපි කොමසාරිස්වරයාගෙන් අවසර ගන්න ඕන. එනිසා අපි හිර කරලා තියෙනවා. ඒ නිසා තමයි ප්‍රාදේශීය ලේකම් කායර්ාල මගින් ඔය කටයුතු සිදුකරන්නේ. අපි හිතුවට අපට කරන්න බැහැ. අපි හොරකම, දූෂණය ,වංචාව නැත්නම් අපට පුළුවන් ඕන දෙයක් කරන්න. තමන්ගේ බල ප්‍රදේශයේ ආපදාවක් සිදු වුනාම ක්ෂණිකව කරන්න ඕන දේවල් තියෙනවා. පළමුවෙන්ම ගරු මන්ත්‍රීවරුනි, මිනිස්සුන්ට ඉන්න හිටින්න ,කෑම ටික දෙන්න ඕන. ඊළඟට මාගර් පිළිසකර කර ගන්න ඕන. අපට ක්ෂණිකව කරන්න බැහැ. ආපදාව සිදු වෙලා තියෙන්නෙ එක තැනක නම් කමක් නැහැ. දැන් මේ යටලමත්තේ සිදු වුන දේ ගම් 10 ක 15 ක වුනානම් අපි අනාථයි. එක තැනක සිදු වුන නිසා අපිට පොඩි සහනයක් තියෙනවා. මහා ගංවතුර අවස්ථාවෙ අපේ ගෙවල් දොරවල් සුද්ධ කරන්න කොච්චර මහන්සි වුනාද? කොපමණ කල් ගියාද? ඒ නිසා අපෙන් සියලුදේ බලාපොරොත්තු වෙන්න නරකයි. නමුත් මන්ත්‍රීවරුන්ට කියනවා යුතුකමක් හැටියට අදාල ස්ථාන දැනුවත් කරලා ඒ කටයුතු කරන්න. මම ඊට වඩා යමක් කියන්න යන්නේ නැහැ විශේෂයෙන්ම අපට ගංවතුරට වඩා හානිදායක මෙවර නායයෑම. මොකද ගංවතුරෙන් නම් ජීවිත හානි නොවී බේරගන්න පුළුවන්ට නාය යන එක කොයි වෙලාවෙ ගිහිල්ලා අනතුරු වෙයිද කියන්න බැහැ. ගොඩක්ම ගෙවල් වලට කන්ඩි කඩා වැටිලා තියෙනවා. තමන්ගේ කණ්ඩිය කපාගෙන ගේ හදනවා. තමන් විහින් කරගනිපු ඒවාත් තියෙනවා. ඒකට අපට කරන්න දෙයක් නැහැ. මේවා කියන්න ගියොත් මිනිස්සු අමනාප වෙයි. අපි මොන දේ කලත් දැඩි කල්පනාවෙන් කරන්න ඕන.

ලක්රුවන් මන්ත්‍රීතුමා කතා කළා බෝට්ටු පිළිබඳ, ඇත්ත මේ අවස්ථාවේ මන්ත්‍රීවරුන් හරිම අපහසුතාවයට පත් වෙලා තියෙනවා. ඒ නිසා ඒ සම්බන්ධව අපි කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම පොළ බදු දීම පිලිබදව අපි සාකච්ඡා කළා. එයත් ඉදිරියේදී සාකච්ඡා කර ගත් පරිදි සිදු කරමු. මොකද බදුකරුගෙ වගකීම් පැහැර හරින අවස්ථා තියෙනවා. ඉදිරි ටෙන්ඩරයේ දී නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා.

ඒ වගේම කම්කරුවන් පිළිබඳ අප්‍රසාදය පළ කළා. නමුත් කම්කරුවෝ හත් දෙනයි ඉන්නෙ. ඒ හත් දෙනා තමයි අපි කවුරුත් බලාපොරොත්තු වෙන්නේ. නමුත් ඇත්ත කතාව, යම් අඩුපාඩු සිදුවෙනවා. නමුත් ඒ වැඩ කරනවා. වැඩ කරද්දී අඩුපාඩුකම් සිදුවෙනවා . ඒ සඳහා ඉදිරියේදී අපි කටයුතු කරමු. මොකද අවශ්‍ය කම්කරුවන් සංඛ්‍යාව අපට නොමැතිකම නිසාත්, ඔවුන්ව පාලනය කරන වැඩ පරිපාලකයෙකු නොමැතිකම අපට ප්‍රශ්න හැටියට තියෙනවා. තාක්ෂණ නිලධාරීන් දෙන්නයි ඉන්නේ. දැන් එක් අයකු නිතරම පුහුණු වැඩසටහන්වලට යනවා. හැමදේම කරන්න ඕන එයාල. ඉතින් අපිට සභාවෙ අඩුපාඩු තියෙනවා. ඒ අඩුපාඩු මැද තමයි ඔය කවුරුත් වැඩ කරන්නේ.

විදුලිය සම්බන්ධයෙන් කතා කරනවනම්, විදුලි ලාම්පුව ඒ සම්බන්ධව ඉදිරි කටයුතු ඉදිරියේදී සිදු කරනවා. ඔබතුමන්ලා සියලුදෙනාටම එක විදුලි ලාම්පුවක් අලුතෙන් දාන්න දෙනවා. ඇත්තටම ලයිට් ගලවගෙන ආවෙ අලුත් වැඩියා කරන්න. අවශ්‍ය අමතර කොටස් නැතිනිසා තාම සකස් කරන්න බැරි වුණා. දැන් ඒ කොටස් ගෙනල්ලා තියෙනවා. ඉදිරියේදී ඒ කටයුතු අදාළ කාමරීක නිලධාරීන් විසින් සිදු කරාවි.

සභාවට මාස හයයි කිව්වට මාස 6 න් තුනකට වඩා වෂර්ාව වැඩ කරගන්න බැහැ. දැනුත් කාලගුණය වෙනස්. ඔය කටයුතු වලදී අපි ඒ වගේම නිලධාරීන් අපහසුතාවයට පත් වෙනවා.

ඒ වගේම වාතර්ාකරණය පිළිබඳව කතා කරන විට මට ඊයේ පෙරේදා ලංකදීප පත්තරේ දැකලා මිනිස්සු දොස් කිව්වා. මොකද දෙවෙනි මාසේ වාතර්ාව තමයි මේ ගිය මාසෙ වැටුණේ. ඉතින් මිනිස්සු හිතන්නෙ මාස පහක් යනකම් මේ සභාපති මොනවත් කලේ නැහැ කියලා. ඉතින් මම කිව්වා ඔය

පරණ එකක්,  දැන් දරුවා දනගානවා. පොඩ්ඩක් ඉන්න. පස්සේ වැඩක් කරාවි කියලා. ඉතින් මම අසරණ වුනා. සභාපතිතුමා වැඩ කරන්නේ නැද්ද කියලා මට කෝල් කරලා අහනවා. පොල් කඩපු එකක් ඇහුවා. පොල් කඩපු එක කලින් එකක්. ඒකත් වැටෙන්නේ මගේ ගිණුමට. ඒ නිසා ඔය කියන පාරේ වතුර, කාණු කැපිලි සම්බන්ධ කතා මේ අපේ කාලෙ ඒව නොවෙයි. හුඟාක් ඈත ඉඳලා එන ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නෙදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ හැමතැනම කතා කරලා තියෙනවා. නමුත් වැඩේ වෙන්නෙ නැහැ. ඔය කිව්වට අපටත් බලතල තියෙනවා කියල මම දන්නෙ නැහැ. මම කරන්න පුළුවන් මොකක්ද කියල ඉදිරියේදී බලන්නම්. ඒ සම්බන්ධවත් අපි ඉදිරියේදී කටයුතු කරනවා.

ඒ වගේම තමයි ගංවතුර අපද්‍රව්‍ය අපි කොම්පෝස්ට් මධ්‍යස්ථානයට ගෙනිච්චේ, ගරු මන්ත්‍රීතුමන්ලා යම් යම් යෝජනා කළා. ඒව මම එකින් එක කියන්න යන්නේ නැහැ. මේ සම්බන්ධව ඉදිරි කාලෙදි අවශය කටයුතු සිදු වේවි. අපට සහාය දක්වන්න. හැමදේම තනියෙන් කරන්න බැහැ. මම කියන්න ඕනේ නැහැ. තමන්ගේ බල ප්‍රදේශයේ දේවල් තියෙනවනම්, අපේ අවසරය තියෙනවා. හැබැයි ඒ පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කරන්න ඕන. දැනුමත් කරලා, නිසි ක්‍රමයට කරනවා නම් කිසි ආරවුලක් නැහැ. අපට කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මම ඒ සම්බන්ධව මීට වඩා කතා කරන්නේ නැහැ. කිවයුතු විශේෂ දේවල් විතරයි කතා කළේ. විශේෂයෙන්ම අපි ඊයෙ හවස කතා කළා. මහ ඇමතිතුමාගේ රැස්වීමට ගියොත් පරක්කු වෙලා. මොකද නාය ගිහිපු තැනට ගිය නිසා එහිදී මම කිව්වාඅපේ ආපදා තත්වයේදී  කිසිම කෙනෙකු ආවේ නැහැ කියලා. එම අවස්ථාවේදී වෙනත් සභාවල සභාපතිවරු අපට උදව් කරන්න ඉදිරිපත් වුණා. මහ ඇමතිතුමාගේ නිදෙර්ශය සභාවලට ගියාට පස්සේ අපට අදම ෆැක්ස් එකක් එවන්න කිව්වා. මම දැන් යැව්වා. අපි මේ අය සම්බන්ධ කරගමු. මන්ත්‍රීතුමන්ලා තමන්ගේ බල ප්‍රදේශයේ තියෙන ගංවතුරෙන් සිදු වුනු හානි ටික යෝජනා කරලා දැනට සභාවට දීලා යන්න. ඔබතුමාලා දැනුවත් වෙලා ඉන්න අදාළ කටයුතුවලදී ඔබතුමන්ලා සම්බන්ධ කරනවා. ලිං ඉහින එක සහ පාරවල් පිළිසකර කිරීමේදී බල ප්‍රදේශය තුළ කිසිඳු පක්ෂ භේද නැහැ. සියලු මන්ත්‍රීවරු ඒ ගැන දැනුවත් වෙන්න. මෙහෙමයි, මේක කළයුතුයි, කියන පොදු මතයේ ඉන්නවනම් කවුරුත් විරුද්ධ නැත්නම් කරන්න. ලිං සම්බන්ධයෙන් ඕනම ළිඳක් පවිත්‍ර කිරීමට කටයුතු කරන්.න මම කිව්වේ පස් කණ්ඩි කඩා වැටිච්ච කියනවනම් ඒවා ඉවත් කරන්න යෑමෙන් පොඩ්ඩක් වැළකිලා, පොදු වැඩ ටික කරන්න.

එසේම, අපේ නන්දන මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ විශේෂයෙන්ම වජිර අබේවධර්න මැතිතුමා සම්බන්ධ කරලා අනතුරුදායක ගස් ඉවත් කරන්න කටයුතු කරනවා. අපේ බල ප්‍රදේශයේ තියෙන ගස් ඉවත් කර ගැනීමට කටයුතු කිරීමේදී දැනුවත් කරන්න. එතකොට අපට පුළුවන් අදාල ආයතන දැනුවත් කරන්න. ඒ වගේම අපේ සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා වගේ මටත් මතකයි 2003 ගංවතුරේදී මෙතනම අපි සතුටින් වැඩ කටයුතු කළා. වෙලාව කියන්නෙ හැම ව්‍යසනයක්ම ආවේ, එජාප ආණ්ඩුව කාලේ. ඒකෙදිත් වැඩක් වුණා. නමුත් මහින්ද මහත්තයාගේ කාලේ ආවනම් ඊට වඩා වැඩක් වෙනවා. සුනාමියට මුහුණ දුන්න වගේ දක්ෂව වැඩ කටයුතු කරන්න තිබුනා. සුනාමියටත් මුහුණ දීලා, යුද්දේ දිනලා , රට සංවධර්නය කළා.  දක්ෂතාවයක් තියෙනවා. ඒකයි මම කිව්වේ. නමුත් අපි කවුරුත් කරපු වැඩ පහත් කරනවා නෙවෙයි. කවුරුත් කරන්නේ රටට ආදරේට. ඉතින් අපි නමක් ගහගන්න අවශ්‍යතාවයක් නැහැ. නාගොඩ ප්‍රාදේශීය සභාවෙන් සිදුකළා කියන මතය විතරයි යන්න ඕන. ඒක නිසා මං මීට වඩා යමක් කියන්න යන්නේ නැහැ. විශේෂයෙන් වේලාසන යන්න හිටියත්, පරක්කු වුනා. අපේ හිටපු සභාපතිතුමන්ලා, මන්ත්‍රීවරු කියනවා වගේ අපේ නාගොඩ ප්‍රාදේශීය සභාව ඉතාමත් හොඳ යහපත් සභාවක්. එකමුතුව වැඩ කරනවා . වචන හරඹ විතරයි පිටවෙන්නේ. එහෙමනම් නාගොඩ ප්‍රාදේශීය සභාවට කරදරයක් නොවී යහපත් හෙටක් ප්‍රාථර්නා කරමින් සභාව නිම කරනවා. ඒ වගේම අද රස්නේ නැති නිසා මේකෙ වෙනසක් වෙලයි කියලා මන්ත්‍රීවරුන්ට මතක නැතිව ඇති. අජිත් මන්ත්‍රීතුමාට විතරයි මතක් වුනේ.  සියලුම දෙනාට සුබ අනාගතයක් වේවා.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය :- ..............................